ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය



වාර්ෂික වාර්තාව

2020

දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු



උසස් අධ්‍යාපනයේ හා පර්යේෂණ කිරීමේ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත් වීම.



පුළුල් පරාසයක විභිදුණු අධ්‍යාපන වැඩසටහන්, පර්යේෂණ හා පුහුණු මඟින් නිපුණතාවයන් වර්ධනය කොට ගෝලීය සංවර්ධනයේ සන්දර්භය තුල අභියෝග ජය ගැනීමට සමත් වූ නව්‍ය බුද්ධිමතුන් බිහිකිරීම.



ඓතිහාසික උරුමයන් තුල පිහිටි අධ්‍යාපන ආයතනයක් ලෙස, දැණුම වැඩි දියුණු කිරීමෙන් සහ ඥානය පැතිරවීමෙන් සියළු දෙනාටම වඩාත් හොඳ අනාගතයක් ගොඩ නැගීම මඟින් සමාජය වැඩි දියුණු කිරීම අරමුණු කොට ක්‍රියා කරන්නෙමු. ජීවිතය සඳහා ඉගෙනීම, විශිෂ්ටත්වය, ගෞරවය, අඛණ්ඩතාව, විවිධත්වය, අවංකබව, නව්‍යකරණය හා ගුණාත්මක බුද්ධිමතුන් යන සාරධර්ම සඳහා අපි කැපවී සිටිමු.

ජීවිතය සඳහා ඉගෙනීම+ විශිෂ්ටත්වය + ගෞරවය + අඛණ්ඩත්වය + විවිධත්වය + අවංකභාවය + නවෝත්පාදනය + ගුණාත්මක බුද්ධිමතුන්

ඉලක්ක

ඉලක්ක 1	ජාතික හා ජාත්‍යන්තර මානව සම්පත් ඉල්ලුම සපුරාලීම සඳහා උසස් තත්වයේ නව්‍ය බුද්ධිමතුන් බිහිකිරීම.
ඉලක්ක 2	උපාධිධාරී සේවා නියුක්තිය වැඩි කිරීම හා ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම.
ඉලක්ක 3	ගෝලීය අනුකූලතාවය, ගෝලීය සබඳතා හා හුවමාරු වැඩි දියුණු කිරීම.
ඉලක්ක 4	සම්පත් භාවිතයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය මඟින් නිෂ්පාදනය වැඩි කිරීම.
ඉලක්ක 5	නිදහස, තරඟකාරීත්වය සහ සුවිශේෂත්වය සමඟ විශ්වවිද්‍යාලය සවිබල ගැන්වීම.
ඉලක්ක 6	අන්‍යෝන්‍ය ගෞරවය හා සදාචාරාත්මක හැසිරීම සමඟ සහජීවනය ප්‍රවර්ධනය කිරීම.

උපකුලපති පණිවිඩය



පෘථිවි තලය තුළ ශ්‍රී ලංකාවට හිමි වන්නේ විශිෂ්ට ස්ථානය කි. සාර්ථකත්වය සඳහා අවශ්‍ය සියලුම මූලිකාංගයන් රට තුළ පැවතීම ඊට හේතුව වෙයි. නිර්මාණශීලී සුවිසල් හැකියාවන් සහිත, ඉහළ පෙළඹවීමක් ඇති, වෙහෙස වී ඉගෙනුම් කටයුතු කරන, නවීකරණය සඳහා සූදානම් වූ ශිෂ්‍ය ප්‍රජාවක් සිටීම ද විශේෂත්වයකි. අපට අවශ්‍ය වනුයේ අප රටෙහි විවිධාකාරයේ දැවැන්ත කර්මාන්තමය ක්ෂේත්‍රයන් සඳහා මෙහෙයැවෙන, විද්‍යාත්මක සහ තාක්ෂණික පදනමක් සහිත යහපත් අධ්‍යාපනික වටපිටාවක් බැවිනි. කෙසේ වුව ද, තවමත් රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනයේ නිවැරදි මට්ටමක් දක්නට නොමැත.

විශ්වවිද්‍යාලය වූ කලී දැනුම නිර්මාණය කිරීම හා ව්‍යාප්ත කිරීමෙහි ලා වැදගත් කාර්යභාරයක් උසුලන්නක් වන අතර, අධ්‍යාපනික භූමිකාව රැකගනිමින් ද, නව දැනුම උත්පාදනය කරමින් ද, කර්මාන්ත හා ව්‍යවසායකයන් කෙරෙහි සමීප සහයෝගීතාවක් ගොඩනැගිය යුත්තකි. මනා ලෙස සංවිධිත උසස් තත්ත්වයේ ශාස්ත්‍රීය, තාක්ෂණික හා පර්යේෂණාත්මක විශ්වවිද්‍යාලයකින් රටේ ආර්ථික හා සංස්කෘතික වෙනසක් සඳහා උපකාර කළ හැකි මනා පුහුණුවක් සහිත උපාධිධාරීන් බිහි කළ හැකි ය. ඊට අමතරව එබඳු විශ්වවිද්‍යාලයන් ව්‍යාපාර පෝෂණය කරන අතරම, රට තුළ දක්ෂ පුද්ගලයන් ආකර්ෂණය කොට තබා ගන්නා ජීවන තත්ත්වයන් ද නිර්මාණය කරයි.

උතුරුමැද පළාතේ පිහිටි ප්‍රථම හා එකම විශ්වවිද්‍යාලය ලෙස ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර හා සාරධර්මය වනුයේ ලාංකේය විශ්වවිද්‍යාල සංදර්භය තුළ එහි ඉතිහාසය සහ උරුමය වඩවාලීම යි.

යටිතල පහසුකම් සංවර්ධනය, විෂයමාලා ප්‍රතිසංස්කරණය, අධ්‍යයන කාර්යමණ්ඩල සංවර්ධනය, අනධ්‍යයන කාර්යමණ්ඩලයට අත්‍යවශ්‍ය පුහුණුවීම්, විශ්වවිද්‍යාල හා කර්මාන්තමය සම්බන්ධතා, දේශීය මෙන්ම විදේශීය විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන සමග හුවමාරු වැඩසටහන්, කළමනාකරණයේ වැඩිදියුණු කිරීම් හා සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ආදිය අපේ සැලසුමට ඇතුළත් වෙයි.

වඩාත් දියුණුවිය යුතු මෙන්ම ධෛර්යවත් කළ යුතු විෂයක්ෂේත්‍රයන් මෙහිදී අප හඳුනාගෙන ඇත. පුළුල් ලෝකය තුළ සාර්ථකව තරග කළ හැකි ස්වාධීන, විශ්වසනීය, වගකීම්සහගත, ව්‍යවසායක හා සදාචාර සම්පන්න උපාධිධාරියෙක් බිහි කිරීමට මෙන්ම, ඔවුන්ගේ ඉගෙනීම් ඔවුන්ටම ආවේනික ලෙස සංවර්ධනය කරගැනීම සඳහා ද සිසුන් දිරි ගන්වනු ලැබේ.

සාම්ප්‍රදායක දේශන හා රසායනාගාර සැකසුම්වලට වඩා නවීන අධ්‍යාපනික ප්‍රවේශයන් තුළින් වඩාත් පුළුල් හා ඵලදායී ඉගෙනුම් ක්‍රමවේද සපයනු ලබන බව අප හඳුනාගෙන ඇත. තොරතුරු තාක්ෂණයට අදාළ පාඨමාලා පැවැත්වීම සඳහා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පහසුකම් හා සුදුසුකම් ලත් කාර්යමණ්ඩලයක් සිටීම අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර වර්ධනය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන් සහ ආකෘතීන් අඛණ්ඩව වෙනස් කරමින් වෘද්ධියමය වෙනස්කම් පමණක් නොව, අත්‍යන්ත පරිවර්තනයක් ද සිදු කරනු ලබයි.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ප්‍රතිපාදන, ශිෂ්‍ය ගහණයේ ප්‍රමාණය හා ව්‍යූහය සමග සමීපව බැඳී පවතියි. මෙයින් පුරෝකථනය කෙරෙනුයේ සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා විෂයමාලා නවීකරණය කළ යුතු බවත්, ඔවුන් තෝරාගත් විශේෂ ප්‍රාගුණ්‍යයෙන් ඔබ්බට ඔවුන්ගේ අධ්‍යයනය පුළුල් කළ යුතු බවත් ය. ඊට අදාළ පශ්චාත් උපාධි පර්යේෂණ වැඩි කිරීම තුළින් ඒ සඳහා වන ශිෂ්‍ය ගහණය වැඩි කිරීමට ද අපි මහත් පරිශ්‍රමයක් දරන්නෙමු. අර්ධකාලීනව අධ්‍යයන කටයුතු කිරීමට අපේක්ෂිත සිසුන් සඳහා

වැඩි ප්‍රවේශයක් ලබා දීමට කටයුතු කරන අතර, විදේශීය සිසුන් බඳවා ගැනීම වැඩි කිරීමට ද අපි උත්සාහ ගනිමින් සිටින්නෙමු.

ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම සඳහා අප විසින් කටයුතු කරනු ලබන අතර, ඊට අදාළ සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කොට ඇත. බලශක්තිය හා ජලය භාවිතය ප්‍රශස්ත කිරීම හා තිරසාර සංවර්ධනය වේගවත් කිරීමේ සැලසුම් ද මීට ඇතුළත් ය.

නේවාසික පහසුකම් හා එහි ගුණාත්මකභාව ශිෂ්‍ය අත්දැකීම් අතර වැදගත් වන්නකි. විශ්වවිද්‍යාලය මගින් සිසුන්ට ලබා දී ඇති නේවාසික පහසුකම් (භෞතික හා සේවා) පිළිබඳ නැවත විමසා බැලීමේ ක්‍රියාවලියක් ද සිදු වෙයි. කාර්යමණ්ඩලයේ, සිසුන්ගේ හා ආදි සිසුන්ගේ මෙන්ම, බාහිර හවුල් කරුවන්ගේ අදහස් විමසීම් ද එහිදී සිදු කෙරේ. සිසුන්ගේ බුද්ධිමය නිදහස, ධෛර්යය හා නිර්මාණශීලීත්වය සඳහා සහාය වන අතර, නවෝත්පාදන අවස්ථාවන් ලුහුබැඳීම සම්බන්ධයෙන් අපි ඔවුන් දිරිමත් කරන්නෙමු.

පෞද්ගලික හා රාජ්‍ය හවුල්කාරත්වය තුළින් විද්වත් ප්‍රජාව හා ප්‍රායෝගික ක්ෂේත්‍රයන් සම්බන්ධ කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ගවේෂණය කිරීම අවශ්‍ය බව අපගේ මතය යි. අදාළ විශ්වවිද්‍යාල සහ ප්‍රධාන සම්පත් ආයතනයන් වන කර්මාන්ත, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, පර්යේෂණ ආයතන හා රාජ්‍ය බලධාරීන් එක් කෙරෙන තාක්ෂණික වේදිකාවක් මගින් මෙය සාක්ෂාත් කර ගත හැකි ය. මෙහි ප්‍රධාන පරමාර්ථය වනුයේ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය ඉහළ නැංවීමෙහි ලා සිසුන් වෙත නව දිසානතියක් ඇතිකිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් ලබාදීම යි.

අපි අවංකව හා වෘත්තීයභාවයෙන් කටයුතු කරන අතර, ඉහළම ආචාරධර්ම ප්‍රමිතීන්ට අනුකූල වෙමු. අප කණ්ඩායම විනිවිදභාවය හා වගවීම සඳහා කැප වී සිටින බව ද අවධාරණය කළ යුතු ය. අනාගතයේදී අපගේ දැක්ම කරා යන ගමනේ සාර්ථකත්වය තක්සේරු කිරීමේදී, උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව, ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකා ප්‍රමාණය හා පර්යේෂණ සඳහා ලබාගත් අරමුදල් ප්‍රමාණය යනාදියෙන් නොනැවතී, සමාජීය යහපත වෙනුවෙන් අප විසින් දක්වන ලද දායකත්වය හා එතුළින් කලාපීය ජනතාවගේ ජීවන තත්ත්වය හා සශ්‍රීකත්වය කෙසේ වර්ධනය වී ද යන කාරණය ද සලකා බැලිය යුතු ය.

ආචාර්ය බී. ඒ. කරුණාරත්න
උපකුලපති

පටුන

01. හැඳින්වීම

1.1	හිටපු උපකුලපතිවරු	1
1.2	විශ්වවිද්‍යාලයේ පාලක සභාව	2
1.3	සනාතන සභාව	2
1.4	පරිපාලන කාර්ය මණ්ඩලය	4
1.5	ආයතනික ව්‍යුහය	5

02. කාර්යසාධන සාරාංශය

2.1	නවක සිසුන් බඳවාගැනීමේ සාරාංශය (වි.වි.කොෘ.ස.)	6
2.2	අවසන් වසර හතර තුල උපාධි ධාරීන් සංඛ්‍යාව	6
2.3	අවසන් වසර හතර තුල පීඨයන් හී අධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය	6
2.4	අවසන් වසර හතර තුල පීඨයන් හී පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	7
2.5	විශ්වවිද්‍යාල ප්‍රගතිය	7
2.6	නේවාසිකාගාර පහසුකම්	7

03.	ශිෂ්‍ය තොරතුරු සහ මානව සම්පත්	8
04.	දේශීය උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු	8
05.	කාර්ය මණ්ඩල	10
06.	පර්යේෂණ නව සොයා ගැනීම් හා ප්‍රකාශන	10
07.	ලැබූ ප්‍රධානයන්	12

08. පාඨමාලා පිළිබඳ විස්තර

08.1	අභ්‍යන්තර පාඨමාලා	12
08.2	වෙනත් පාඨමාලා	13

09.	පුනරාවර්තන වියදම්	14
10.	ප්‍රාග්ධන වියදම්	14
11.	ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල්)	15
12.	ව්‍යාපෘති පිළිබඳ වියදම් (දේශීය විදේශීය අරමුදල්)	16
13.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)	17
14.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම් උත්පාදනය)	18
15.	මූල්‍ය ප්‍රගතිය විශ්ලේෂණාත්මකව - 2020	18
16.	යටිතල පහසුකම් පිළිබඳ විස්තර - 2020	19

පීඨ, පුස්තකාල ජාලය, අධ්‍යයන සහයක අංශ, මධ්‍යස්ථාන හා ඒකකයන් හි වාර්තාවන්

17.	කෘෂිකර්ම පීඨය	23
18.	ව්‍යවහාරික විද්‍යා පීඨය	25
19.	කළමනාකරණ අධ්‍යයන පීඨය	28
20.	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	30
21.	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	32
22.	තාක්ෂණ පීඨය	34
23.	පුස්තකාල පද්ධතිය	38
24.	ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව	42
25.	වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය	45
26.	දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය	53
27.	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය	55
28.	පරිගණක මධ්‍යස්ථානය	57
29.	තත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය	59

30 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය 61

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17(ඈ) වගන්තිය
31. යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධන මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව 65

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107 (ආ) වගන්ති ප්‍රකාරව සහ 19ටි
32. අංක 38 දරන මුල්‍ය පනත හා එහි සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශනය 69

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 108 (7) වගන්ති ප්‍රකාර 2020 දෙසැම්බර් 31
33 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව 103

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්ති ප්‍රකාර 2020 දෙසැම්බර් 31
34. දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්වවිද්‍යාලයේ නීරීක්ෂණ හා ක්‍රියාමාර්ග 115

1. හැඳින්වීම

1978 විශ්වවිද්‍යාල පනතේ අංක 16 විධිවිධාන යටතේ එවකට අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු රිචඩ් පතිරන මහතා විසින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 1995 නොවැම්බර් මස 07 වන දින ස්ථාපනය කරන ලද අතර එවකට අතිගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ප්‍රධානත්වයෙන් 1996 ජනවාරි 31වන දින චාරිත්‍රානුකූලව සමාරම්භක උත්සවය පවත්වන ලදි. සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයන, කෘෂිකර්ම විද්‍යා හා ව්‍යවහාරික විද්‍යා යන ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන අවස්ථා සැලසීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම ආරම්භක අභිලාශය වුවද පසුව වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයද එක්විය.

1995 දී එවකට ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ වලට අනුව මධ්‍යම, වයඹ හා උතුරුමැද පළාත් අනුබද්ධිත විශ්වවිද්‍යාල ඒකාබද්ධ කොට එහි අනුප්‍රාප්තිකයා ලෙස ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ස්ථාපනය කරන ලදි.

මිහින්තලේ ගල් පර්වතය මත වූ පන්සල පෙනෙන මානයේ ඇති මනරම් පරිසරයක් සහිත මිහින්තලේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය පිහිටා තිබේ. බෞද්ධ ශිෂ්ඨාචාරය හඳුන්වා දුන් මධ්‍යස්ථානය ලෙස මෙම භූමියට ඓතිහාසික වැදගත්කමක් හිමිවේ. ලෝක ප්‍රසිද්ධ ශිෂ්ඨාචාරයක් වන පෞරාණික අනුරාධපුර රාජධානියට කිලෝමීටර් 10 ක් පමණ එපිටින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය පිහිටා ඇත. වර්තමානයේ විශ්වවිද්‍යාලයේ පීඨ 06 කින් සමන්විත වන අතර සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයන, තාක්ෂණ සහ ව්‍යවහාරික විද්‍යා යන පීඨයන් මිහින්තලේ පරිශ්‍රයේ පිහිටා ඇති අතර කෘෂිකර්ම පීඨය හා වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය පිළිවලින් පුලියන්කුලම හා සාලියපුර පිහිටා ඇත.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් ප්‍රමාණය භාවිතයෙන් උතුරු මැද පළාතේ සහ සමස්ථ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සැපයීමේ උපාය වාසිය අත්පත් කොට ගෙන තිබේ.

1.1 හිටපු උපකුලපතිවරු

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිවරුන් විසින් පත් කරන ලද ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය උපකුලපති වරුන්ගේ ලැයිස්තුව.



1996 - 2002
මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර



2002 - 2004
මහාචාර්ය කේ. විජේරත්න



2005 - 2006
මහාචාර්ය පී. සමරනායක



2013 - 2018
මහාචාර්ය කේ. එච්. ආර්. විජයවර්ධන



2006 - 2012
මහාචාර්ය කේ. ඒ. නන්දසේන

1.2 විශ්වවිද්‍යාල පාලක සභාව

ආචාර්ය බී. ඒ. කරුණාරත්න	උපකුලපති (සභාපති)
මහාචාර්ය ඒ. එම්. ජේ. බී. අධිකාරි	පීඨාධිපති කෘෂිකර්ම පීඨය
මහාචාර්ය රන්පිත් එදිරිසිංහ	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය ඩබ්. පී. විජේවර්ධන	පීඨාධිපති කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය සී. ආර්. විතානාච්චි	පීඨාධිපති සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
වෛද්‍ය එස්. ඩී. පිලපිටිය	පීඨාධිපති වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ
ආචාර්ය කේ. ජී. පී. ජයතිලක	පීඨාධිපති තාක්ෂණ විද්‍යා පීඨය
ආචාර්ය ජී. වී. ටී. වී. වීරසුරිය	සනාතන සභාවෙන් නම් කරන ලද
මහාචාර්ය එන්. කේ. ඒ. සිල්වා	සනාතන සභාවෙන් නම් කරන ලද
පූජ්‍ය නුගතැන්නේ පඤ්ඤානන්ද ථෙර	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
මහින්ද සෙනෙවිරත්න මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
මහාචාර්ය අසෝක ගුණවර්ධන	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
එ. ජී. කරුණාරත්න මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
ආර්. එම්. වන්නිනායක මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
එස්. පී. කුමාර ගුණරත්න මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
රවීන්ද්‍ර ගීත් ජයසේන මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
එච්. එම්. කේ. හේරත් මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
එස්. එස්. කේ. මොහොට්ටි මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
පාලිත නානායක්කාර මහතා	වි.වි.ප්‍ර.කො.ස. මගින් නම් කරන ලද
ඒ. එම්. ජී. බී. අබේසිංහ මහතා	ලේඛකාධිකාරි/ලේකම්
ඩී. ඩී. උපනන්ද මහතා	මූල්‍යාධිකාරී

1.3 සනාතන සභාව

ආචාර්ය බී. ඒ. කරුණාරත්න	උපකුලපති (සභාපති)
මහාචාර්ය ඒ. එම්. ජේ. බී. අධිකාරි	පීඨාධිපති කෘෂිකර්ම පීඨය
මහාචාර්ය ඊ. එම්. ආර්. කේ. බී. එදිරිසිංහ	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය ඩබ්. පී. විජේවර්ධන	පීඨාධිපති කළමනාකරණ අධ්‍යයන පීඨය
වෛද්‍ය එස්. ඩී. පිලපිටිය	පීඨාධිපති වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
මහාචාර්ය සී. ආර්. විතානාච්චි	පීඨාධිපති සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ආචාර්ය කේ. ජී. පී. ජයතිලක	පීඨාධිපති තාක්ෂණ විද්‍යා පීඨය
ඒ. එස්. සිරිවර්ධන මහත්මිය	පුස්තකකාලයාධිකාරි

කෘෂිකර්ම පීඨය

ආචාර්ය ඩී. එම්. ඩී. දිසානායක	අංශ ප්‍රධාන ශාක විද්‍යා අධ්‍යනාංශය
ජී. වී. ටී. වී. වීරසුරිය මහතා	අංශ ප්‍රධාන පාංශු හා ජල සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය
ආචාර්ය ඒ. එම්. කේ. ආර් බංඩාර	අංශ ප්‍රධාන කෘෂිකර්ම පද්ධති අධ්‍යනාංශය
මහාචාර්ය ඩබ්. ඒ. ඩී. නයනාන්ජල	අංශ ප්‍රධාන සත්ත්ව හා ආහාර විද්‍යා අධ්‍යනාංශය

ව්‍යවහාරික විද්‍යා පීඨය

ආචාර්ය යූ. දහනායක	අංශ ප්‍රධාන භෞතික විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය ආර්. පී. ජී. වෙන්ඩකෝන්	අංශ ප්‍රධාන ජීව විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය ජී. ජී. එන්. දුමින්ද	අංශ ප්‍රධාන සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය
එන්. එස්. වීරකෝන් මහතා	අංශ ප්‍රධාන පරිගණක අධ්‍යනාංශය
මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී. හේරත්	අංශ ප්‍රධාන රසායනික විද්‍යා අධ්‍යනාංශය

කළමනාකරණ අධ්‍යයන පීඨය

ආචාර්ය. සී. ටී. ගමගේ	අංශ ප්‍රධාන ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යනාංශය
මහාචාර්ය පී. එම්. බී. ජයතිලක	අංශ ප්‍රධාන ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය
කේ. ටී. එන්. පී. අබේවික්‍රම මහත්මිය	අංශ ප්‍රධාන සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශය

එම්. පී. එස්. පත්මිනි මහත්මිය	අංශ ප්‍රධාන, අලෙවි කළමනාකරණ අධ්‍යනාංශය
ඩබ්. ඩබ්. ඒ. එන් සුජීව මහතා	අංශ ප්‍රධාන, මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය
පී. පී. මුණසිංහ මහතා	අංශ ප්‍රධාන තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය අධ්‍යනාංශය

වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

වෛද්‍ය සී. එස්. පත්තිනිගේ	අංශ ප්‍රධාන, කායච්ඡේදන අධ්‍යනාංශය
වෛද්‍ය එස්. පී. වික්‍රමගේ	අංශ ප්‍රධාන, භෞතවේදීය අධ්‍යනාංශය
වෛද්‍ය එච්. ටී. ඩබ්. වීරකෝන්	අංශ ප්‍රධාන, ජෛවරසායන අධ්‍යනාංශය
මහාචාර්ය කේ. පී. ඒ. ඩී. වීරකෝන්	අංශ ප්‍රධාන, පරපෝෂ විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය එන්. සී. ලොකුනාරන්ගොඩ	අංශ ප්‍රධාන, වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය ජේ. ඒ. ඒ. එස්. ජයවීර	අංශ ප්‍රධාන, ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය එස්. ශ්‍රීෂංකර්	අංශ ප්‍රධාන, ශල්‍ය වෛද්‍ය අධ්‍යනාංශය
වෛද්‍ය ඩබ්. ඒ. එන්. ඩී. වික්‍රමසිංහ	අංශ ප්‍රධාන, ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය ඩී. එම්. ඒ. කුමාර	අංශ ප්‍රධාන, ප්‍රසව හා නාරීවේද අධ්‍යනාංශය
වෛද්‍ය ඒ. බී. සෙනෙවිරත්න	අංශ ප්‍රධාන, අධිකරන වෛද්‍ය අධ්‍යනාංශය
වෛද්‍ය ටී. පී. කේ. කලුආරච්චි	අංශ ප්‍රධාන, භිෂග්වේද අධ්‍යනාංශය
වෛද්‍ය එම්. එස්. වී. මෙන්ඩිස්	අංශ ප්‍රධාන, ව්‍යාධිවේදි අධ්‍යනාංශය
වෛද්‍ය බී. ඒ. එම්. වික්‍රමසිංහ	අංශ ප්‍රධාන, මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
වෛද්‍ය පී. එච්. පී. ජේ. පුෂ්පකුමාර	අංශ ප්‍රධාන, පවුල් සෞඛ්‍ය අධ්‍යනාංශය
වෛද්‍ය ඩබ්. ඒ. ජේ. සී. චන්ද්‍රකුමාර	අංශ ප්‍රධාන, ළමාරෝග අධ්‍යනාංශය

සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

මහාචාර්ය එස්. ඩබ්. පී. කේ. බුලන්කුලම	අංශ ප්‍රධාන, සමාජවිද්‍යා අධ්‍යනාංශය
ඩී. ජේ. කේ. ඉහලගෙදර මහතා	අංශ ප්‍රධාන, මානවශාස්ත්‍ර අධ්‍යනාංශය
මහාචාර්ය ඩී. ටී. මෙන්ඩිස්	අංශ ප්‍රධාන, පුරාවිද්‍යා හා උරුමයන් කළමනාකරණ අධ්‍යනාංශය
ආචාර්ය ජේ. එම්. එස්. බී ජයසුන්දර	අංශ ප්‍රධාන, පරිසර කළමනාකරණ අධ්‍යනාංශය
ආචාර්ය /පූජ්‍ය) ඕග චන්ද්‍රසිරි ථෙර	අංශ ප්‍රධාන, භාෂා අධ්‍යනාංශය
ඩී. ඒ. වේහෙල්ලා මහතා	අංශ ප්‍රධාන, ඉංග්‍රීසි භාෂා අධ්‍යනාංශය
ආචාර්ය ආර්. පී. අයි. ආර්. ප්‍රසන්න මහතා	අංශ ප්‍රධාන, ආර්ථික විද්‍යා අධ්‍යනාංහඨ

තාක්ෂණ පීඨය

ආචාර්ය ආර්. එම්. ඒ. අයි. කේ. රත්නායක	අංශ ප්‍රධාන, ජෛව තාක්ෂණ අධ්‍යනාංශය
ආචාර්ය ආර්. පී. පී. ටී. ජයසුරිය	අංශ ප්‍රධාන, ආහාර තාක්ෂණ අධ්‍යනාංශය
එච්. එම්. එච්. ටී. හික්කඩුව	අංශ ප්‍රධාන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය
ආචාර්ය එච්. ඒ. එන්. ධර්මගුණවර්ධන	අංශ ප්‍රධාන, ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යනාංශය
ආචාර්ය පී. කුමාරගේ	අංශ ප්‍රධාන, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික් තාක්ෂණ අධ්‍යනාංශය

මාහාචාර්ය වරුන්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. ඒ. විරසිංහ	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය සනත් හෙට්ටි ආරච්චි	ව්‍යවහාරික විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ලගමුව	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය සේනනායක්කාර	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
මහාචාර්ය එස්. බී. අගම්පොඩි	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
මහාචාර්ය ඩි. එම්. ඩබ්. කේ. දිසානායක	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ. එච්. ආර්. විජේවර්ධන	කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය කේ. පී. ඒ. උදයකුමාර	කළමනාකරණ අධ්‍යයන පීඨය
මහාචාර්ය පී. ඒ. එස්. ගිනිගද්දර	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය එම්. එච්. ජේ. පී. ගුණරත්න	කෘෂිකර්ම පීඨය
මහාචාර්ය ඩබ්. එම්. ශ්‍රියානි	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය එන්. කේ. ඒ. සිල්වා	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. එච්. සිරිබද්ධන	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

පීඨ මඟින් නම් කරන ලද සමාජිකයින්

ආචාර්ය එල්. කේ. ඩබ්. විජයරත්න	කෘෂිකර්ම පීඨය
ආචාර්ය එස්. එන්. දිසානායක	කෘෂිකර්ම පීඨය
ආචාර්ය එච්. ඕ. විජේවර්ධන	ව්‍යවහාරික විද්‍යා පීඨය
ආචාර්ය ඩබ්. එම්. එස්. ෆනැන්ඩෝ	ව්‍යවහාරික විද්‍යා පීඨය
ආචාර්ය ආර්. එම්. එන්. සී. ස්වර්නපාලි	කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය ඩබ්. එම්. ආර්. බී. වීරසුරිය	කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය වයි. පී. එස්. ඩබ්. ජයරත්න	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
ආචාර්ය පී. එච්. අයි. දර්ශිකා	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
කේ ප්‍රඥාන්ත් මහතා	තාක්ෂණ විද්‍යා පීඨය

1.4 පරිපාලන කාර්ය මණ්ඩලය

ඒ. එම්. පී. බී. අබේසිංහ මහතා	ලේඛකාධිකාරි
ඩී. ඩී. උපනන්ද මහතා	මුල්‍යාධිකාරි
එස්. එච්. උවයිසුල්කර්නි මහතා	නියෝජ්‍ය ලේඛකාධිකාරි
එන්. සී. එස්. සේනක මහතා	නියෝජ්‍ය ලේඛකාධිකාරි
ඊ. ඩබ්. එම්. එස්. යු. විජේසිංහ මහතා	අධ්‍යක්ෂ ශාරීරික අධ්‍යාපන අංශය
එස්. එස්. කේ. ගොඩකුඹුර මහතා	නියෝජ්‍ය මුල්‍යාධිකාරි
එස්. ඒ. අයි. සෝමරත්න මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
එම්. පී. එල්. මාවිකුඹුර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි
සී. හෙට්ටිගේ මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
ඩී. එම්. සී. යූ. කේ. දිසානායක මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (පුස්තකාලසේවා)
එම්. එම්. එස්. සන්ජීව මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
එන්. ඩී. ජේ. රණවිර මහතා	ප්‍රධාන විනයාරක්ෂක
ඩබ්. බී. දිසානායක මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
එච්. පී. ගුණවර්ධන මහත්මිය	සහකාර ලේඛකාධිකාරි
ඩී. එම්. ආර්. සමන්ත මහතා	සහකාර ලේඛකාධිකාරි
එම්. ඒ. එන්. එන්. කුමාරි මහත්මිය	උපකුලපතිගේ පෞද්ගලික ලේකම්
එච්. එම්. එස්. කේ. හේරත් මහත්මිය	සහකාර ලේඛකාධිකාරි
ජේ. එම්. එස්. කේ. ජයලත්	සහකාර මුල්‍යාධිකාරි
බී. ඩබ්. එන්. ජේ. සමරවිර මහතා	ගොවිපල කළමනාකරු
ආර්. එම්. එස්. රත්නායක මහත්මිය	සහකාර මුල්‍යාධිකාරි
පී. ජේ. සෙනෙවිරත්න මහත්මිය	සහකාර ලේඛකාධිකාරි
ආර්. එම්. පී. ඩී. රත්නායක මහත්මිය	සහකාර ලේඛකාධිකාරි (නීති හා ප්‍රලේඛන)
සී. ඩී. ප්‍රනාන්දු මෙනවිය	සහකාර අභ්‍යන්තර විගණක
අයි. කේ. දොඩන්වල මෙනවිය	සහකාර මුල්‍යාධිකාරි
වී. ක්‍රිෂ්නානන්ති මෙනවිය	සහකාර ලේඛකාධිකාරි
වී. එන්. ප්‍රසන්ෂනී මෙනවිය	සහකාර මුල්‍යාධිකාරි
කේ. එම්. පී. ඩී. කුලතුන්ග මහතා	සහකාර ලේඛකාධිකාරි
කේ.නතීපරන් මහත්මිය	සහකාර ලේඛකාධිකාරි
ටී. එම්. එම්. පී බන්ඩාර මහතා	උද්‍යාන පාලක (උද්‍යාන අංශය)
එම්. එන්. ෆාතිමා නිහ්මා මෙනවිය	සහකාර ලේඛකාධිකාරි
ටී ලුක්ෂනා මෙනවිය	සහකාර ලේඛකාධිකාරි

1.5 ආයතනික ව්‍යුහය

2. කාර්යසාධන සාරාංශය

2.1 නවක සිසුන් බඳවාගැනීමේ සාරාංශය (වි.වි.ප්‍ර.කොා.ස.)

පීඨය	2015/2016	2016/2017	2017/2018	2018/2019
කෘෂිකර්ම පීඨය	115	153	134	156
ව්‍යවහාරික විද්‍යා පීඨය	157	365	262	390
කළමනාකරණ අධ්‍යයන පීඨය	376	416	463	471
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	180	180	179	181
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	476	567	490	439
තාක්ෂණ පීඨය	238	270	275	275
එකතුව	**1542**	**1951**	**1803**	**1912**

2.2 අවසන් වසර හතර තුල උපාධි ධාරින් සංඛ්‍යාව

පීඨය	2017	2018	2019	2020
කෘෂිකර්ම පීඨය	74	72	96	95
ව්‍යවහාරික විද්‍යා පීඨය	244	100	141	5
කළමනාකරණ අධ්‍යයන පීඨය	357	282	256	51
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	173	3*	176	187
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	336	298	292	285
එකතුව	**1186**	**756**	**964**	**623**

* මෙම වසර සඳහා අවසන් වසර ප්‍රධාන විභාගයන් නොපැවැත්වුණු අතර නැවත විභාග බහිපයක් පමණක් පවත්වන ලදි.

2.3 අවසන් වසර හතර තුල පීඨයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය

පීඨය	2017	2018	2019	2020
කෘෂිකර්ම පීඨය	48	45	43	45
ව්‍යවහාරික විද්‍යා පීඨය	42	41	44	45
කළමනාකරණ අධ්‍යයන පීඨය	47	47	47	47
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	49	48	54	55
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	45	49	55	55
තාක්ෂණ පීඨය	15	15	21	29
පුස්තකාල පද්ධතිය	7	7	7	6
එකතුව	**253**	**252**	**271**	**282**

2.4 අවසන් වසර හතර තුල පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨය	2017	2018	2019	2020
කෘෂිකර්ම පීඨය	47	50	43	43
ව්‍යවහාරික විද්‍යා පීඨය	38	35	32	32
කළමනාකරණ අධ්‍යයන පීඨය	18	19	20	20
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	79	80	81	81
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	22	22	22	22
තාක්ෂණ පීඨය	4	8	8	8
තාක්ෂණ පීඨය	218	251	258	258
එකතුව	**426**	**465**	**464**	**464**

2.5 විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම

ශ්‍රේණිගත කිරීම	2017	2018	2019	2020
ලෝක ශ්‍රේණිගත කිරීම	4508	6137	4383	4225
Presence ශ්‍රේණිගත කිරීම	2768	1782	2641	1194
Impact ශ්‍රේණිගත කිරීම	13617	13898	12750	12747
Openness ශ්‍රේණිගත කිරීම	3863	4121	3699	3582
විශිෂ්ඨත්ව ශ්‍රේණිගත කිරීම	3510	3642	3667	3651
ශ්‍රී ලංකා ශ්‍රේණිගත කිරීම	**8**	**9**	**8**	**8**

2.6 නේවාසිකාගාර පහසුකම්

පීඨය	පිරිමි	ගැහැණු	එකතුව
කෘෂිකර්ම පීඨය	155	369	524
ව්‍යවහාරික විද්‍යා පීඨය	304	663	967
කළමනාකරණ අධ්‍යයන පීඨය	557	977	1534
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	294	672	966
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	190	1244	1434
තාක්ෂණ පීඨය	**470**	**344**	**814**

3. ශිෂ්‍ය තොරතුරු සහ මානව සම්පත්

පීඨය/වෙනත්	සිසුන් ගණන	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ගණන (ස්ථීර	අනධ්‍යන කාර්ය මණ්ඩල සමාජිකයින් ගණන
කෘෂිකර්ම පීඨය	541	45	43
ව්‍යවහාරික විද්‍යා පීඨය	980	45	32
කළමණාකරන අධ්‍යයන පීඨය	2083	47	20
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	1076	55	81
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	1949	55	22
තාක්ෂණ පීඨය	1064	29	8
පුස්තකාලය		6	41
වෙනත්			217
එකතුව	**7693**	**282**	**464**

4. දේශීය උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු

අධ්‍යයන පාඨමාලාව	අධ්‍යයන වර්ෂය	සිසුන් සංඛ්‍යාව
කෘෂිකර්ම පීඨය		
විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය	පළමු වසර	156
	දෙවන වසර	127
	තෙවන වසර	142
	සිව්වන වසර	116
ව්‍යවහාරික විද්‍යා පීඨය		
විද්‍යාවේදී (සාමාන්‍ය) ව්‍යවහාරික ජීව විද්‍යා උපාධිය	පළමු වසර	153
	දෙවන වසර	86
	තෙවන වසර	138
විද්‍යාවේදී (සාමාන්‍ය) ව්‍යවහාරික භෞතික විද්‍යා උපාධිය	පළමු වසර	109
	දෙවන වසර	55
	තෙවන වසර	79
විද්‍යාවේදී (සාමාන්‍ය) සෞඛ්‍ය ප්‍රවර්ධන උපාධිය	පළමු වසර	56
	දෙවන වසර	26
	තෙවන වසර	36
විද්‍යාවේදී (සාමාන්‍ය) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය	පළමු වසර	72
	දෙවන වසර	66
	තෙවන වසර	69
විද්‍යාවේදී (විශේෂ) ව්‍යවහාරික ජීව විද්‍යා උපාධිය	සිව්වන වසර	5
විද්‍යාවේදී සිව් අවුරුදු ව්‍යවහාරික විද්‍යා උපාධිය	සිව්වන වසර	2
විද්‍යාවේදී (ඒකාබද්ධ) රසායන විද්‍යාව හා භෞතික විද්‍යා උපාධිය	සිව්වන වසර	2
විද්‍යාවේදී (ගෞරව) රසායන විද්‍යා උපාධිය	සිව්වන වසර	11
විද්‍යාවේදී (කාර්මික ගණිතය) සිව් අවුරුදු උපාධිය	සිව්වන වසර	5
විද්‍යාවේදී (විශේෂ) සෞඛ්‍ය ප්‍රවර්ධන උපාධිය	සිව්වන වසර	5
විද්‍යාවේදී සිව් අවුරුදු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය	සිව්වන වසර	5

කළමනාකරණ අධ්‍යයන පීඨය		
විද්‍යාවේදී විශේෂ උපාධිය	පළමු වසර පළමු අධ්‍යයන වාරය	471
	දෙවන වසර පළමු අධ්‍යයන වාරය	463
	තුන්වන වසර පළමු අධ්‍යයන වාරය	415
	සිව්වන වසර පළමු අධ්‍යයන වාරය	377
	සිව්වන වසර දෙවන අධ්‍යයන වාරය	357
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය		
වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය	පළමු වසර පළමු අධ්‍යයන වාරය	181
	පළමු වසර දෙවන අධ්‍යයන වාරය	179
	දෙවන වසර	180
	තෙවන වසර	180
	සිව්වන වසර	177
	පස්වන වසර	179
සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය		
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව	පළමු වසර පළමු අධ්‍යයන වාරය	439
	දෙවන වසර පළමු අධ්‍යයන වාරය	282
	තුන්වන වසර පළමු අධ්‍යයන වාරය	353
	තුන්වන වසර දෙවන අධ්‍යයන වාරය	209
ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලාව	දෙවන වසර පළමු අධ්‍යයන වාරය	199
	දෙවන වසර දෙවන අධ්‍යයන වාරය	190
	තුන්වන වසර දෙවන අධ්‍යයන වාරය	140
	සිව්වන වසර දෙවන අධ්‍යයන වාරය	137
තාක්ෂණ පීඨය		
විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව	පළමු වසර	275
	දෙවන වසර පළමු අධ්‍යයන වාරය	275
	තුන්වන වසර පළමු අධ්‍යයන වාරය	276
	සිව්වන වසර පළමු අධ්‍යයන වාරය	238

05. කාර්ය මණ්ඩල තොරතුරු

සේවක කාණ්ඩය	කාර්ය මණ්ඩල කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (U-AC 5 (I))	383	4	107
	මහාචාර්ය (U-AC 5 (II))		20	
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණිය (U-AC 3(I))		43	
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙවන ශ්‍රේණිය (U-AC 3(II))		98	
	කථිකාචාර්ය (U-AC 3(III))		66	
	කථිකාචාර්ය (පරිවාස) (U-AC 3(IV))		45	
	පුස්තකාලයාධිකාරි (U-AC 5 (II))	1	1	0
	ජ්‍යෙෂ්ට සහකාර පුස්තකාලයාධිකාරි GR I/II (U-AC 3 (I)/(II))	10	5	5
	සහකාර පුස්තකාලයාධිකාරි (U-AC 3 (IV))			
	පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය (U-EX 3/U-Ex 2)	15	13	2
	වෛද්‍ය නිලධාරීන් (U-Mo 1)	2	0	2
තෘතීය මට්ටම	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය (U-AS 1)	15	3	12
	පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය (U-EX 1-2016A,)	19	18	1
	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය (U-AS 2-2016A)	19	14	5
ද්විතීය මට්ටම	තාක්ෂණික කාර්ය මණ්ඩලය (U-MN 4 /UMT	76	52	24
	කළමනාකරණ සහකාර සහ අනුබද්ධ කාර්ය මණ්ඩලය (U-MN 4 /U-MN 3/U-MN 2/U- MN 1)	195	162	33
ප්‍රාථමික මට්ටම	ප්‍රාථමික කාර්ය මණ්ඩලය (U-PL 3/U-PL 2/U-PL 1)	234	215	19

6. පර්යේෂණ නව සොයාගැනීම් හා ප්‍රකාශන

ප්‍රකාශන වර්ගය		දේශීය ප්‍රකාශිත	විදේශීය ප්‍රකාශිත
කෘෂිකර්ම පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		4	17
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		23	5
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		10	2
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		151	15
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		7	3
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	3	3
	කතෘ විසින්	9	0
ව්‍යවහාරික විද්‍යා පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		4	12
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ			

ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		0	9
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		10	1
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව			
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්		
	කතෘ විසින්		
කළමණාකරන අධ්‍යයන පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		1	32
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		14	12
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		10	4
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		78	3
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		1	1
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්		
	කතෘ විසින්	2	0
වෛද්‍ය හා සමාන්තර විද්‍යාපීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		41	
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		13	
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව			
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		65	28
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව			
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්		
	කතෘ විසින්		
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව		1	24
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ		3	1
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව		1	1
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		21	16
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව		3	
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්	2	1
	කතෘ විසින්		
තාක්ෂණ පීඨය			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ජර්නල වල ඵල කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව			
විද්‍යුත් ජර්නලද ඇතුළුව තීරක දර්ශක ප්‍රමාණ			1
ප්‍රකාශනය කරන ලද සම්පූර්ණ ලිපි සංඛ්‍යාව			2
ප්‍රකාශයට පත්කරන ලද සාරංශ සංඛ්‍යාව		1	
ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව			
විශේෂඥ ක්ෂේත්‍රයට අදාලව ප්‍රකාශිත ග්‍රන්ථ හෝ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	ප්‍රකාශකයෙකු විසින්		
	කතෘ විසින්		

7. ලැබූ ප්‍රධානයන්

ලැබූ සම්මානයේ නම	ජාතික/ජාත්‍යන්තර	සම්මානය ප්‍රධානය කරන්නන්ගේ නම හා රට	ලබාගත් අයගේ නම
ශිෂ්‍ය විශිෂ්ඨතා සම්මානය -2019	අන්තර් ජාතික	කගෝෂිමා විශ්වවිද්‍යාලය ජපානය	මහාචාර්ය එම්.එච්.ජේ.පී. ගුනරත්න ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාංශු හා ජල සම්පත් අධ්‍යනාංශය,
හොඳම වාචික ඉදිරිපත් කිරීම	අන්තර් ජාතික	විද්‍යා පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා	එම්.පී.එන්.ඒ. අමරසුරිය, රසායන විද්‍යා අධ්‍යනාංශය, විද්‍යා පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව	ජාතික	ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව	ජෙව තාක්ෂණ අධ්‍යනාංශය, තාක්ෂණ පීඨය
නිවර්තන රෝග පිළිබඳ පර්යේක්ෂණය හා පුහුණු ව්‍යාපෘතිය - ලෝක සෞඛ්‍ය සංවිධානයේ සමුහ අරමුදල් අභියෝග ප්‍රධානය	අන්තර් ජාතික	ගෝලීය නිවර්තන රෝග පිළිබඳ පර්යේක්ෂණය හා පුහුණු ව්‍යාපෘතිය - ලෝක සෞඛ්‍ය සංවිධානය. ජිනීවා, ස්විස්ටර් ලන්තය	ජෙව තාක්ෂණ අධ්‍යනාංශය, තාක්ෂණ පීඨය
ස්වභාවිකව ලබා ගත හැකි අමුද්‍රව්‍ය වලින් ක්‍රෙයොන්ස් සහ දිය සායම් සංවර්ධනය කිරීම. (ඇට්ලස් ඇක්සිලියා සමඟ සහයෝගයෙන්)	ජාතික	ආසියානු සංවර්ධන බැංකුව	ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යනාංශය
හොඳම වාචික සන්නිවේදනය	ජාතික	ශ්‍රී ලංකා ප්‍රසව හා නාරීවේද වෛද්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකාව	වෛද්‍ය කේ. අයි. එස්. කෝරලේගෙදර

8. පාඨමාලා පිළිබඳ විස්තර

8.1 අභ්‍යන්තර පාඨමාලා

පාඨමාලාවේ නම	කාලසීමාව	මාධ්‍ය
කෘෂිවිද්‍යා පීඨය		
කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
කෘෂිකර්ම විද්‍යාවේදී ගෞරව උපාධිය (2018.12.04 දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලිපියට අනුව 2018/2019 කණ්ඩායමේ සිට)	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යවහාරික විද්‍යා පීඨය		
ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි
ව්‍යවහාරික විද්‍යා පිළිබඳ විද්‍යාවේදී (සිවි අවුරුදු)උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
විද්‍යාවේදී කාර්මික ගණිතය (සිවි අවුරුදු) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යවහාරික ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ඒකාබද්ධ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ඒකාබද්ධ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි

රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි
සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (සිවි අවුරුදු) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
කළමනාකරණ අධ්‍යයන පීඨය		
ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ව්‍යාපාර තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදි (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය		
වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය විද්‍යාවේදි උපාධිය (එම්.බී.බී.එස්)	අවුරුදු - 5	ඉංග්‍රීසි
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය		
පරිසර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	සිංහල
සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	අවුරුදු - 4	සිංහල
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධිය	අවුරුදු - 4	සිංහල
පරිසරය හා සමාජය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි	අවුරුදු - 3	සිංහලa
සිංහල හා සමාජ ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	සිංහල
භාෂාව හා සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රවේදී ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	ඉංග්‍රීසි
ආර්ථික විද්‍යාව හා විද්‍යාත්මක කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	සිංහල
ඉතිහාසය පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	අවුරුදු - 3	සිංහල
තාක්ෂණ පීඨය		
විදුලි හා ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
භෞතික විද්‍යාව පිළිබඳ ඉංජිනේරු තාක්ෂණික උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ජෛව සැකසුම් තාක්ෂණය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
ආහාර තාක්ෂණය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය	අවුරුදු - 4	ඉංග්‍රීසි

08.2 වෙනත් පාඨමාලා

පාඨමාලාවේ නම	කාලසීමාව	මාධ්‍ය
සහතිකපත්‍ර පාඨමාලා		
ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව (ඉංග්‍රීසී භාෂා ඉගැන්වීමේ ඒකකය)	අවුරුදු - 01	ඉංග්‍රීසි
දෙමළ සහතිකපත්‍ර පාඨමාලාව (සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය)	අවුරුදු - 01	දෙමළ/ සිංහල
තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව (ව්‍යවහාරික විද්‍යා පීඨය)	මාස - 06	ඉංග්‍රීසි / සිංහල
''ඌණපූරක හා වෛකල්පිත වෛද්‍ය විද්‍යාව'' සහතිකපත්‍ර පාඨමාලාව (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	මාස - 06	සිංහල
''ඌණපූරක හා වෛකල්පිත වෛද්‍ය විද්‍යාව'' සහතිකපත්‍ර පාඨමාලාව (වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය)	අවුරුදු - 01	සිංහල

ඩිප්ලෝමා පාඨමාලා		
ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය)	අවුරුදු - 01	ඉංග්‍රීසි
දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව (සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය)	අවුරුදු - 01	දෙමළ
තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (පරිගණක මධ්‍යස්ථානය)	අවුරුදු - 01	ඉංග්‍රීසි
ව්‍යාපාරික ආර්ථික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව	අවුරුදු - 01	සිංහල
පරිසර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව	අවුරුදු - 01	සිංහල
බාහිර උපාධි පාඨමාලා		
ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය	අවුරුදු - 03	සිංහල
විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාව (ජීව විද්‍යා)	අවුරුදු - 03	ඉංග්‍රීසි
විද්‍යාවේදී බාහිර උපාධි පාඨමාලාව (භෞතික විද්‍යාව)	අවුරුදු - 03	ඉංග්‍රීසි
පශ්චාත් උපාධි පාඨමාලා		
කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	අවුරුදු - 01	ඉංග්‍රීසි
ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය	අවුරුදු - 02	ඉංග්‍රීසි
අධ්‍යාපන පශ්චාත් උපාධිය	මාස - 18	සිංහල
ළමා ආරක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	අවුරුදු - 01	ඉංග්‍රීසි
කෘෂිකර්මපති පශ්චාත් උපාධිය	අවුරුදු - 01	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ	අවුරුදු 2 සහ	ඉංග්‍රීසි
ආචාර්ය උපාධිය, පර්යේෂණ	අවුරුදු 3 සහ 5	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ	අවුරුදු - 02	ඉංග්‍රීසි
දර්ශනපති පර්යේෂණ	අවුරුදු - 03	ඉංග්‍රීසි
ආචාර්ය උපාධිය, පර්යේෂණ	අවුරුදු - 03	ඉංග්‍රීසි
ආචාර්ය උපාධිය, පර්යේෂණ	අවුරුදු - 04	ඉංග්‍රීසි

9 පුනරාවර්තන වියදම්

විෂය	2019 (Rs.)	2020(Rs.)
පුද්ගල පඩි නඩි	1,503,782,540.00	1,739,629,220.00
ගමන් වියදම්	5,743,477.00	1,228,192.00
සැපයුම්	55,288,545.00	51,679,393.00
නඩත්තු වියදම්	24,419,171.00	16,377,306.00
ගිවිසුම්ගත සේවා	300,651,137.00	226,290,874.00
වෙනත්	100,419,596.00	46,829,777.00
එකතුව	**1,990,304,466.00**	**2,082,034,762.00**

10 ප්‍රාග්ධන වියදම්

විෂය	2020 (රු.)
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ ලබා ගැනීම	31,375,016.00
යටිතල පහසුකම් වත්කම්	3,318,597.00
තොරතුරු තාක්ෂණ උපකරණ	13,415,085.00
විද්‍යාගාර ඉගැන්වීම්	3,364,701.00
මොටර් රථ	866,500.00
පොත් සහ චාර සඟරා	2,001,427.00
වැඩබිම් සහ යන්ත්‍රෝපකරණ	10,479,936.00
උපකරණ අළුත්වැඩියා සහ නඩත්තු	351,406,939.00
එකතුව	**416,228,201.00**

11 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශිය/විදේශීය අරමුදල්)

නම සහ කාරණය	ණය/දීමනා	අරමුදල් සපයන ආයතන	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය
ආවේණික රටවල් දෙකක මී උණ වල ගෝලීය භාරය පිළිබඳ ආමන්ත්‍රණය කිරීම.	දීමනා	කැලිෆෝනියා විශ්වවිද්‍යාලය	75,584,520.00
ලෝක සෞඛ්‍ය සංවිධානය-ප්‍රජා සෞඛ්‍ය හෙද සොයුරියන්ගේ සෞඛ්‍ය පර්යේක්ෂණය	දීමනා	ලෝක සෞඛ්‍ය සංවිධානය	506,375.00
ලෝක සෞඛ්‍ය සංවිධානය - වැඩිහිටියන්ගේ ජීවන තත්ත්වය සහ ප්‍රජා සෞඛ්‍ය තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය	දීමනා	ලෝක සෞඛ්‍ය සංවිධානය	1,184,500.00
ලෝක සෞඛ්‍ය සංවිධානය - ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික හා ස්වදේශීය අංශයේ වර්තමාන තත්ව විශ්ලේෂණය කිරීම.	දීමනා	ලෝක සෞඛ්‍ය සංවිධානය	3,340,000.00
මාතෘ හා ළමා සෞඛ්‍ය පර්යේක්ෂණ ඒකකයෙ ව්‍යාපෘතිය	දීමනා	එඩින්බර්ග් විශ්වවිද්‍යාලය	18,768,000.00
ඉක්ලිප්ස් ව්‍යාපෘතිය	දීමනා	කීල් විශ්වවිද්‍යාලය එක්සත් රාජධානිය	යුරෝ 874,103
ජාතික විද්‍යා පදනම පර්යේෂණ ප්‍රධානය	දීමනා	ජාතික විද්‍යා පදනම	
ශ්‍රී ප්‍රොම්- ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය	දීමනා	ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා ආයතනය, ඉතාලිය	5,116,320.00
	දීමනා	යුනෙස්කෝ	4,199,959.00
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය හා ගොවි ප්‍රජාව අතර හවුල්කාරිත්වය ශක්තිමත් කිරීමේ වැඩසටහන	දීමනා	ජර්මානු සංවර්ධන ආයතනය	1,967,500.00
ශ්‍රී ලංකාවේ උතුරේ වෘත්තීමය පුහුණු ව්‍යාපෘතියේ බලපෑම තක්සේරු කිරීමේ සහයෝගිතා අධ්‍යයනය	දීමනා	යුරෝපියානු කොමිසම	යුරෝ96,394.00
එමරස් වැඩසටහන මඟින් සපයන ලද අරමුදල (201/C384/04)	දීමනා	බදුලු දිස්ත්‍රික් හරිත නිවාස සංගමය	2,267,155.00
කුඩා වතු හිමියන්ගේ කෘෂිව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසහටහන එක්ව සිදුකරන සහයෝගිතා අධ්‍යයනය	දීමනා	ජර්මානු සංවර්ධන ආයතනය	12,211,146.00
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ ජපන් භාෂා විද්‍යාගාරය ඉදිකිරීම	දීමනා	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	12,700,000.00
අධ්‍යයන පර්යේක්ෂණ - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අචාර්ය උපාධිය ප්‍රධාන	දීමනා	ලෝක සෞඛ්‍ය සංවිධානය	1,874,800.00
සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රවේශයන් භාවිතා කරමින් සෞඛ්‍ය පිළිබඳ වානිජ නිර්නායකයන් වෙත ප්‍රවේශ වීමට සිසුන් බල ගැන්වීම.	දීමනා	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය	1,237,500.00
නිවාසා මූලික මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා	දීමනා		691000000.00

ජාතික උපාය මාර්ගික සැලැස්ම සැකසීම.			
විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති			
උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතයි	දීමනා		ඇමරිකානු ඩොලර් මිලියන 24
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘත	දීමනා	ආසියානු සංවර්ධන බැංකුව	
එකතුව			**139,720,275.00**

12. ව්‍යාපෘති පිළිබඳ වියදම් (දේශීය විදේශීය අරමුදල්)

ව්‍යාපෘතියේ නම	තක්සේරු කරන ලද මුළු මුදල රු..	වියදම් 2019 රු.	වියදම් 2020 රු.	සමුච්චිත වියදම 31.12.2020 රු.
ආවේණික රටවල් දෙකක මී උණ වල ගෝලීය භාරය පිළිබඳ ආමන්ත්‍රණය කිරීම.	75,584,520.00	51,345,993.00	13,969,847.32	65,315,840.32
ලෝක සෞඛ්‍ය සංවිධානය-ප්‍රජා සෞඛ්‍ය හෙද සොයුරියන්ගේ සෞඛ්‍ය පර්යේක්ෂණය	506,375.00	209,550.00		209,550.00
ලෝක සෞඛ්‍ය සංවිධානය - වැඩිහිටියන්ගේ ජීවන තත්ත්වය සහ ප්‍රජා සෞඛ්‍ය තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය	1,184,500.00	808,630.00	366,591.00	1,175,221.00
ශ්‍රී ලෝක සෞඛ්‍ය සංවිධානය - ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික හා ස්වදේශීය අංශයේ වර්තමාන තත්ව විශ්ලේෂණය කිරීම.	3,340,000.00	92,010.00	2,070,000.00	2,162,010.00
මාතෘ හා ළමා සෞඛ්‍ය පර්යේක්ෂන ඒකකයෙ ව්‍යාපෘතිය	18,768,000.00	4,663,978.81	8,477,941.25	13,141,920.06
ඉක්ලිප්ස් ව්‍යාපෘතිය			13,583,144.49	13,583,144.49
ශ්‍රී ප්‍රොම් - ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය	5,116,320.00	1,347,045.00	1,939,463.51	3,286,508.51
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය හා ගොවි ප්‍රජාව අතර හවුල් කාරිත්වය ශක්තිමත් කිරීමේ වැඩසටහන	4,199,959.00	1,452,859.00	2,630,980.00	4,083,839.00
ශ්‍රී ලංකාවේ උතුරේ වෘත්තීමය පුහුනු ව්‍යාපෘතියේ බලපෑම තක්සේරු කිරීමේ සහයෝගිතා අධ්‍යයනය	1,967,500.00	1,788,530.00	89,425.00	1,877,955.00
එමරස් වැඩසටහන මඟින් සපයන ලද අරමුදල (201/C384/04)	Eur96,394.00	-	1,108,241.00	1,108,241.00

කුඩා වතු හිමියන්ගේ කෘෂිව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසහටහන එක්ව සිදුකරන සහයෝගිතා අධ්‍යයනය	2,267,155.00			-
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ ජපන් භාෂා විද්‍යාගාරය ඉදිකිරීම	12,211,146.00	3,200.00	12,012,323.08	12,015,523.08
අධ්‍යන පර්යේක්ෂන - වි.වි. ප්‍ර. කොං. සභාවේ ආචාර්ය උපාධි සඳහා වන ප්‍රතිපාදන	12,700,000.00	11,282,134.00		11,282,134.00
සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රවේශයන් භාවිතා කරමින් සෞඛ්‍ය පිළිබඳ වානිජ නිර්නායකයන් වෙත ප්‍රවේශ වීමට සිසුන් බල ගැන්වීම.	1,874,800.00	953,730.00		953,730.00
නිවාසා මූලික මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්ම සැකසීම.	1,237,500.00		549,000.00	549,000.00
විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති				-
උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය	1000000.00	54,570,000.00	63,888,792.00	118,458,792.00
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත්සංවර්ධන ව්‍යාපෘතිය	යුරෝ මිලියන 24.0	49,900,000.00	147,000,000.00	196,900,000.00
එකතුව	**139,720,275.00**	**178,417,659.81**	**267,685,748.65**	**446,103,408.46**

13. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

විෂය	ප්‍රතිපාදන 2019 රු.	වියදම 2019 රු	ඉතිරි කිරීම/අතිරික්තය රු.
ව්‍යාපෘති හැර වෙනත් පුනරාවර්තන	1,874,500,000.00	2,082,034,762.00	(207,534,762.00)
ව්‍යාපෘති හැර ප්‍රාග්ධනය	419,000,000.00	430,808,040.00	(11,808,040.00)
දේශීය ව්‍යාපෘති අරමුදල් - තාක්ෂණ පීඨ ගොඩනැගිලි ව්‍යාපෘතිය	60,000,000.00	60,488,499.00	(488,499.00)
ව්‍යාපෘති විදේශීය අරමුදල්			-
එකතුව	**2,353,500,000.00**	**2,573,331,301.00**	**(219,831,301.00)**

14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම් උත්පාදනය)

විෂය	ආදායම 2020 (රු.)	වියදම 2020 (රු.)	ඉතිරි කිරීම/අතිරික්තය
මූලික උපාධි වැඩසටහන්	9,302,000.00	7,186,546.00	2,115,454.00
බාහිර උපාධි වැඩසටහන්	25,665,490.00		
ඉංග්‍රීසි ඩිප්ලෝමාව හා තොරතුරු	5,735,613.25		
පශ්චාත් උපාධි අධ්‍යාපනය	8,655,510.00	21,066,665.00	21,250,044.65
සහතික පත්‍ර පාඨමාලාව	2,260,096.40		
උපදේශක සේවා			-
වෙනත්	2,750,000.00	5,816,357.00	(3,066,357.00)
එකතුව	**54,368,709.65**	**34,069,568.00**	**20,299,141.65**

15. මූල්‍ය ප්‍රගතිය විශ්ලේෂණාත්මකව-2020

විෂය	පීඨය					
	කෘෂිකර්ම පීඨය	ව්‍යාපාරික විද්‍යා පීඨය	කළමනාකරණ අධ්‍යයන පීඨය	වෛද්‍ය හා සම්බන්ධ විද්‍යා පීඨය	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	තාක්ෂණ පීඨය
එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම	581,908.00	338,468.09	199,278.52	453,020.14	218,020.47	173,006.82
එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම	128,228.03	70,787.11	33,303.58	64,471.53	35,648.18	65,198.65
එකතුව	**710,136.03**	**409,255.20**	**232,582.10**	**517,491.67**	**253,668.65**	**238,205.47**

එක් සිසුවෙක් සඳහා පුනරාවර්තන වියදම් = $\frac{\text{පීඨයේ පුනරාවර්තන වියදම්}}{\text{පීඨයේ සිසුන් සංඛ්‍යාව}}$

එක් සිසුවෙක් සඳහා ප්‍රාග්ධන වියදම් = $\frac{\text{පීඨයේ ප්‍රාග්ධන වියදම්}}{\text{පීඨයේ සිසුන් සංඛ්‍යාව}}$

පීඨයක් සඳහා ප්‍රාග්ධන වියදම් = පීඨයේ ප්‍රාග්ධන වියදම් + සාමාන්‍ය ප්‍රාග්ධන වියදම් x $\frac{\text{පීඨයේ ශිෂ්‍ය සංඛ්‍යාව}}{\text{විශ්වවිද්‍යාලයේ සිසුන් සංඛ්‍යාව}}$

16. යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම රුපියල් මිලියන
කෘෂිකර්ම පීඨ ශ්‍රවණාගාරයේ දෙවන අදියර	5,155,841.14
විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පිවිසුම ආශ්‍රිත මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම	2,842,831.43
විශ්වවිද්‍යාලය සඳහා ප්‍රකාශ තන්තු ජාල පහසුකම් සැපයීම සහ ස්ථාපනය කිරීම.	116,225.63
කෘෂිකර්ම පීඨය සහ මහාචාර්ය එස්. එච්. උපසේන නේවාසිකාගාරය සඳහා යෝජිත අකුණු ආරක්ෂක පද්ධතිය ස්ථාපනය කිරීම.	706,047.10
මිහින්තලේ පරිශ්‍රයේ ඇති ව්‍යවහාරික විද්‍යා පීඨයේ පිවිසුමේ සිට පණ්ඩුල නේවාසිකාගාරය දක්වා මායිම් බැම්ම ඉදිකිරීම.	309,294.45
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය සඳහා යෝජිත කෞතුකාගාරයේ පිරිසැකසුම් කටයුතු, කාර්යාල උපකරණ සැකසීම සහ අනෙකුත් සිවිල් කටයුතු සඳහා	109,633.85
බහු කාර්ය ගොඩනැගිලි සංකීර්ණයේ බී. ආදර්ශකයේ දෙවන අදියර.	1,511,623.88
ව්‍යවහාරික විද්‍යා පීඨයේ නව භෞතික විද්‍යා විද්‍යාගාරයේ පිරිසැකසුම් කටයුතු සහ විද්‍යාගාර උපකරණ සැපයීම සහ ස්ථාපනය කිරීම.	108,414.00
ඵලදායී පරාර්ථකාමිත්ව මධ්‍යස්ථානයේ ප්‍රධානයන් යටතේ ක්‍රියාත්මක සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	593,075.66
ප්‍රධාන පිවිසුම ආශ්‍රිත ප්‍රදේහයේ භූ අලජකරණ කටයුතු සිදුකිරීම.	1,228,310.76
සාලියපුර පිහිටා ඇති විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ පුසතකාල ගොඩනැගිල්ලේ අබලං වී තිබූ වහලය අළුත් වැඩියා කිරීම.	130,010.00
පණ්ඩුල නේවාසිකාගාරයේ අංක 7 සහ 8 සඳහා තිර රෙදි සවි කිරීම.	416,543.50
ව්‍යවහාරික විදයාපීඨයේ පවතින පිවිසුම් මාර්ගය වැඩි දියුනු කිරීම	2,767,392.60
නව සෝමාදේවි ගැහැණු නේවාසිකාගාරයේ පිරිසැකසුම් කටයුතු සිදු කිරීම සහ යකඩ රාමු සවි කිරීම.	791,018.09
සංඝමිත්තා ගැහැණු නේවාසිකාගාරයේ පිරිසැකසුම් කටයුතු සිදු කිරීම සහ යකඩ රාමු සවි කිරීම.	855,342.40
කෘෂිකර්ම පීඨ ආපන ශාලාව සඳහා කෑම ශාලාවක් ඉදිකිරීම.	653,524.18
හේමමාලි ගැහැණු නේවාසිකාගාරයට යකඩ රාමු සවි කිරීම.	636,598.80
උප්පලවන්නා නේවාසිකාගාරයේ පිරිසැකසුම් කටයුතු සිදු කිරීම සහ තිරරෙදි සවි කිරීම.	866,631.95
කෘෂිකර්ම පීඨයේ තාක්ෂණික සම්බස්ධීකරණ මධ්‍යස්ථානය සඳහා පවතින ස්ථානයේ අළුත්වැඩියා කිරීම.	1,505,913.34
පණ්ඩුලා II ගැහැණු නේවාසිකාගාරයේ පිරිසැකසුම් කටයුතු සිදු කිරීම සහ යකඩ රාමු සවි කිරීම.	1,861,826.20
පීඨයේ අදියර I ගොඩනැගිල්ලේ පිවිසුම් ලොබිය වෙන්කිරීම.	225,349.61
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ මානවශාස්ත්‍ර අධ්‍යනාංශ පරිශ්‍රයේ වෙන්කිරීමේ කටයුතු.	793,345.50
සාමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ පවතින මූල්‍ය අංශය, ජපන් භාෂා විද්‍යාගාරය ලෙස වෙනස් කිරීම	384,212.04
ව්‍යවහාරික විද්‍යා පීඨ අදියර II ගොඩනැගිල්ලේ පවතින පොලිකාබෝනේට් සීට් වහලය හා සිවිලිම අළුත් වැඩියා කිරීම.	859,145.00
තාක්ෂණික පීඨයේ පුස්තකාලය වායුසමීකරණය කිරීම.	1,234,352.50
විභාග ශාලාවේ තීන්ත ආලේප කිරීමේ කටයුතු	926,511.48
පණ්ඩුල I පිරිමි නේවාසිකාගාරයට යකඩ රාමු සවිකිරීම.	1,714,603.20
පොලිස් නිල නිවාස පරිශ්‍රයේ ඇති නව තනි නිල නිවාස ගොඩ නැගිල්ලේ වහලය සහ දෙවන මහලේ ඉතිරි කටයුතු සිදුකිරීම.	4,564,716.50
පණ්ඩුල නේවාසිකාගාරයේ අංක 1 සහ 2 සඳහා වාෂ්පීකරණ ස්තාන ඉදිකිරීම.	3,951,938.73
උද්‍යාන අංශය සඳහා නාන කාමර ඉදිකිරීම, රඹෑව නිල නිවාස සඳහා ප්‍රතික ටැංකි සහ පොඟවන වලවල් ඉදිකිරීම සහ එළිමහන් රංග පීඨයේ නවීකරණය	1,597,937.10
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ ජපන් භාෂා ඒකකය විසු සමනය කිරීම	358,600.93
තාක්ෂණ පීඨ පීඨාධිපති කාර්කයාලය සහ සහකාර ලේඛකාධිකාරි කාර්යාලයේ වෙන් කිරීමේ කටයුතු	274,516.96
තාක්ෂණ පීඨය සඳහා ජෙනරේටර් කාමරයක් ඉදි කිරීම සහ පැනල් කාමර වැඩි කිරීම.	1,357,874.73

ඉදිකිරීමේ කටයුතු	
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සහ එහි කටයුතු සම්පූර්ණ කිරීම. (ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මඟින් 87.7 සහ ශ්‍රී ලංකා රජය මඟින් 81.8)	38,045,862.44
පීඨාධිපති වරුන්, ලේඛකාධිකාරි, මුල්‍යාධිකාරි, පුස්තකලයාධිකාරි සහ අධ්‍යන සහ අනධ්‍යන නිලනිවාස සංකීර්ණයේ (පොලිස් නිල නිවාස පරිශ්‍රය - පවුල් නිවාස 5, තනි නිවාස 2, ද්විත්ව නිවාස 1, තැන්නයන්කුලම පරිශ්‍රය - පවුල් නිවාස 1, ද්විත්ව නිවාස 1, රඹෑව පරිශ්‍රය - ද්විත්ව නිවාස 4, තනි නිවාස 2)	30,639,861.52
තාක්ෂණික පීඨ කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාස ඒකක 8ක් (ද්විත්ව නිවාස 4ක්) මිහින්තලය පරිශ්‍රය තුල ඉදිකිරීම. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මඟින් 50.0 සහ ජනනය කරන ලද මුදල් 8.2)	16,877,165.97
තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල (අදියර II සහ අදියර III)	60,488,574.07
විශ්වවිද්‍යාලයීය වෛද්‍යා හා සමාන්තර විද්‍යා පීඨය සඳහා පෙර සායන ගොඩනැගින්ලක් සැලසුම් කිරීම, ඉදිකිරීම සහ කටයුතු අවසන් කිරීම.	132,717,620.98
විශ්වවිද්‍යාලයීය වෛද්‍යා හා සමාන්තර විද්‍යා පීඨය සඳහා පෙර සායන ගොඩනැගින්ලක් සැලසුම් කිරීම, ඉදිකිරීම සහ කටයුතු අවසන් කිරීම.	2,279,557.00
නේවාසිකාගාර පරිශ්‍රය සඳහා යෝජිත මලාපවාහන සහ අපජලය එකතු කිරීම සහ පිරිසිදු කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම සහ නිම කිරීම.	16,908,633.36

පීඨ, පුස්තකාල ජාලය, අධ්‍යයන සහයක අංශ, මධ්‍යස්ථාන හා ඒකකයන් හි වාර්තාවන්

17. කෘෂිකර්ම පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය වර්ෂ 2001 දී උපාධි අපේක්ෂකයින් 17 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදි. මෙහි ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ වියළි කළාපයට යෝග්‍ය වූ කෘෂි කාර්මික ක්‍රම පිළිබඳ අවධානය යොමු කරමින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විද්‍යා (උපාධි) වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. විවිධ කෘෂි විද්‍යා ක්‍රම පදනම් කර ගනිමින් මෙම උපාධි පාඨමාලා වර්ෂාර්ධයන් 08කින් සමන්විතව පවතී. අද වන විට කෘෂිකර්ම පීඨය, කෘෂි ඉංජිනේරු සහ පාංශු විද්‍යා, කෘෂිකර්ම පද්ධති, සත්ව ආහාර විද්‍යාව සහ ශාක විද්‍යාව යන අධ්‍යනාංශ 04කින් ද පරිගණක ඒකකය, ඉංග්‍රීසි භාෂා පුහුණු අංශය, පීඨ ග්‍රොවිපළ හා පුස්තකාලයකින් සමන්විත වේ. පාංශු විද්‍යා, ශාක විද්‍යා, ජීව රසායන විද්‍යා සහ භූගෝලීය තොරතුරු පද්ධති විද්‍යාගාරය එක්ව පැවැත්වෙන කෘෂි ඉංජිනේරු වැඩ මුළු මඟින් උපාධි අපේක්ෂකයන්ගේ විශ්ලේෂණ හා අනෙකුත් කුසලතා සංවර්ධනය සඳහා අවස්ථාවන් සලසනු ලැබේ.

වසරකට කෘෂිකර්ම පීඨයට සිසුන් 165 පමණ ඇතුළත් කර ගන්නා අතර එම සියළුම සිසුන් හට නේවාසිකාගාර පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සලසා දෙනු ලැබේ. වර්තමානයේදී කෘෂිකර්ම පීඨය 90කට අධික අධ්‍යයන සහ අනධ්‍යයන සේවක මණ්ඩලයකින් යුක්ත වේ. කෘෂිකර්ම පීඨයේ ක්‍රියාත්මක වන උපාධි පාඨමාලා මූලික වැඩ සටහනකින් සහ විශේෂිකරණ අංශවලින් සමන්විත වන අතර මූලික වැඩසටහන් සියළුම සිසුන් සඳහා අනිවාර්ය වන අතර එය පළවෙනි වර්ෂාර්ධ පහ තුල විසිර පවතී. හය වන සහ හත් වන වර්ෂාර්ධයන්වල සිසුනට ඔවුන්ගේ රුචිකත්වය පරිදි විශේෂිකරණ අංශය තෝරාගැනීමට අවස්ථාව හිමිවේ. අවසන් වර්ෂාර්ධයේදී සිසුන් විසින් ඒකල පරික්ෂණ ව්‍යාපෘතියක් තෝරා ගත යුතු අතර අවසානයේදී විස්තරාත්මක පර්යේක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කල යුතුය

ආ. ජයග්‍රහණයන්

- කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද රසායනාගර හා දේශන ශාලා සංකීර්ණය (රුපියල් මිලියන 758) සඳහා පිහිටුවන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ කටයුතු සම්පූර්ණ කිරීම.
- 12 වන වාර්ෂික පර්යේක්ෂණ සම්මන්ත්‍රණය සාර්ථකව පැවැත්වීම සහ එහි ක්‍රියාදාමයන් ප්‍රකාශනයට පත් කිරීම.
- යෝජිත දර්ශනපති උපාධි වැඩසටහන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාවේ තත්වය සහතික කිරීමේ කවුන්සිලයේ අනුමැතිය ලබා ගැනීම.
- කෘෂිකර්ම පශ්චාත් උසස් උපාධි පාඨමාලාව සඳහා පළමු සිසු කණ්ඩායම බඳවා ගැනීම.
- පීඨ අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාස ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම.
- "ශ්‍රී ලංකා කෘෂිකර්මය හා පරිසර පද්ධතිය" පීඨ විද්‍යුත් ජර්නලය විසින් ප්‍රකාශයට පත් කරයි.
- පීඨයේ විද්‍යුත් ජර්නලය වන "ශ්‍රී ලංකා කෘෂිකර්මය හා පරිසර පද්ධතිය" සඳහා ජාතික විද්‍යා පදනමේ ශ්‍රී ලංකා මාර්ගගත ජර්නල මඟින් පිළිගැනීමක් හිමි වීම.
- දේශන ශාලා වල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- ජාතික පර්යෙක්ෂණ කවුන්සිලයේ ප්‍රදානත්වයෙන් රුපියල් මිලියන 4.9 ලබා ගැනීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය සහා විද්‍යා තාක්ෂණ හා පර්යේක්ෂණ අධ්‍යනංශය මඟින් ක්‍රියාත්මක කෙරෙන "ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තිරසාර භෝග පද්ධති සඳහා පර්යේක්ෂණ වේදිකාවක් සංවර්ධනය කිරීම සඳහා බහුවිධ ප්‍රවේශයන් " පිළිබඳ පර්යෙක්ෂණ ව්‍යාපෘතිය (රුපියල් මිලියන 12.63) අඛණ්ඩව පවත්වාගෙන යෑම.
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලීය කෘෂිකර්ම පීඨයේ ව්‍යවසායකයින්ට උපහාර කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- සත්ත්ව හා ආහාර විද්‍යා අධ්‍යනාංශයේ විශේෂ උපාධිය හදාරණ තෙවන වසර දෙවන අධ්‍යන වාරයේ (2015/2016) සිසුන් විසින් "ARANCIA 2020" ලෙස පෝෂණ දිනයක් වර්ෂ 2020 පෙබරවාරි මස 11 වන දින පැවැත්වීම.
- සත්ත්ව හා ආහාර විද්‍යා අධ්‍යනාංශයේ රසායනාගාර සේවාවන් ස්ථාපනය කිරීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- ප්‍රතිපාදන නොමැති කම හේතුවෙන් ගොවිපල මාර්ග පද්ධතියේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කළ නොහැකිවීම.
- රසායනාගාර හා දේශනශාලා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු කොවිඩ්-19 වසංගත තත්වය නිසා ප්‍රමාද වීම.
- කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් දේශනශාලා පුටු 600 ක් මිලදී ගැනීම අසාර්ථක විය.
- ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් කිරි සහ මාංශ සැකසුම් ඒකකය සඳහා උපකරණ ලබා ගැනීමට නොහැකි වීම.

ඈ. අනාගත දැක්ම

- කෘෂිකර්මය පිළිබඳව පශ්චාත් උපාධි පර්යේක්ෂණ උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (දර්ශනය, ආචාර්ය)
- පීඨ ගොවිපලේ පශු සම්පත් ඒකකය පුළුල් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර අංශ සමඟ පර්යෙක්ෂණ ව්‍යාපෘතිය සහයෝගීතා ඇති කරගැනීම.
- කාර්මික පුහුණුව සඳහා අවබෝධතා ගිවිසුම් ඇති කරගැනීමෙන් ආයතන සමඟ සහයෝගීතාවය වැඩි කරගැනීම.
- රසායනාගාර හා දේශනශාලා සංකීර්ණය ස්ථාපනය කිරීම.
- 13 වන වාර්ෂික පර්යේක්ෂණ සම්මන්ත්‍රණය සංවිධානය කිරීම.
- ගොවිපලේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම.
- පීඨ ගොවිපල සහ නව ඉඩම (කාණ්ඩ 3) වටා මායිම් වැට ඉදි කරීම.
- පීඨයේ සෞන්දර්යාත්මක දැක්ම වැඩි දියුණු කිරීම.

18. ව්‍යවහාරික විද්‍යා පීඨය

අ. හැඳින්වීම

වර්ෂ 1995 නොවැම්බර් මස 07වන දින ප්‍රකාශයට පත්කරන ලද අංක 896/2 ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය වර්ෂ 1995 නොමැම්බර් මසදී අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය තුල ස්ථාපිත කරන ලදි. පොල්ගොල්ලේ පිහිටි මධ්‍යම පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ කරමින් ව්‍යවහාරික විද්‍යා පීඨය වර්ෂ 1997 ජනවාරි මස 10වන දින ආරම්භ කරන ලදි. මෙහිදී ක්ෂනික කාර්යක් ලෙස ඩිප්ලෝමා අවශ්‍යතාවය සම්පූර්ණ කොට ඇති සිසුන් 102ක් සඳහා තුන් අවුරුදු උපාධියක් දක්වා අධ්‍යයන කටයුතු තහවුරු කරගෙන යාමට අවස්ථා සලසා දුන් අතර ඔවුන් සියළු දෙනාම වර්ෂ 1998දී උපාධිය සම්පූර්ණ කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් එවන ලද පළමු සිසු කණ්ඩායම බඳවා ගැනීම වර්ෂ 1997 නොවැම්බර් මසදී සිදු විය.

වර්ෂ 2006 ජනවාරි මස 16වන දින මිහින්තලේ ප්‍රධාන විශ්වවිද්‍යාල පරිභ්‍රය තුල ව්‍යවහාරික විද්‍යාපීඨය ස්ථාපනය කිරීම සිදුවිය. අබණ්ඩ සංවර්ධනයක් සමඟ අධ්‍යාපන, පර්යේක්ෂණ, පුහුණු හා උපදේශන යන ක්ෂේත්‍රයන් හි ක්‍රියා ශීලි, නව්‍ය සහ කීර්තිමත් විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ. අලුතින් ආරම්භ කරන ලද රසායන විද්‍යා අධ්‍යනාංශයද සමඟ අධ්‍යානාංශ 05කින් සමන්විත වන අතර විවධ ව්‍යවහාරික විද්‍යා ක්ෂේත්‍ර යටතේ උපාධි පාඨමාලා 13ක් පවත්වනු ලැබේ. ඊට අමතරව පීඨය මඟින් පර්යේක්ෂණ උසස් උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිරි නැමීමද අපේක්ෂා කෙරේ.

ආ. ජයග්‍රහනයන්

- පීඨයේ ස්වයං ඇගයීම් වාර්තා වර්ෂ 2020 ජුනි මස 30 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්වය සහතික කිරීමේ කවුන්සිලය වෙත ඉදිරිපත් කරන ලදී.
- පර්යේක්ෂණ පැවැත්වීමට සදාචාරාත්මක අවසරය ලබා දීම සඳහා ආචාර ධර්ම සමාලෝචන කමිටුව ආරම්භ කරන ලද අතර මින් භාහිර අයදුම්කරුවන් හටද අවස්ථාවක් ලබා දේ.

➢ විෂය මාලා සංවර්ධනය.

- සංවර්ධනය කරන ලද ගණිතය පිළිබඳ ගෞරව උපාධි වැඩසටහනේ නවීකරණ කටයුතු විෂය මාලා සංවර්ධන කමිටුවේ යෝජනා අනුව සිදු කිරීම.
- සංඛ්‍යාලේඛණ විෂය සඳහා සංවර්ධිත විෂය මාලාවක් විෂයමාලා සංවර්ධන කමිටුව වෙත යොමු කිරීමට සකස් කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධි පාඨමාලාවක් සහ සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාවේ විෂය මාලා සංශෝධනයක් අවසන් කොට විශ්වවිද්‍යාලය විෂයමාලා සංවර්ධන කමිටුවේ අනුමැතිය සඳහා යොමු කිරීම.
- පවතින තොරතුරු තාක්ෂණ (විශේෂ) විද්‍යා උපාධි පාඨමාලාවේ විෂය මාලා සංශෝධනයට අදාළ තේදින වැඩමුලුවක් කාර්මික විශේෂඥයින්ගේ හා ශාස්ත්‍රිය විශේෂඥයින්ගේ සහභාගිත්වයෙන් වර්ෂ 2020 ජනවාරි මස පැවැත්වීම. දැනට සංශෝධන ක්‍රියාවලිය විෂය මාලාව ලිවීමේ අවසන් අදියරේ පවති.
- ඉංග්‍රීසි භාෂා පාඨමාලා සඳහා පාඨමාලා විශේෂඥයින් පීඨය විසින් අනුගමනය කරන ලද නව ආකෘතියට අනුව සංශෝධනය කිරීම.

➢ පශ්චාත් උපාධි අධ්‍යයන

- පශ්චාත් උපාධි ඒකකය සහ අධ්‍යයන මණ්ඩලය පිහිටුවීමේ මූලික පියවර සිදු කරයි.
- පර්යේෂක්ණ මඟින් උසස් උපාධි පිළිබඳ අතුරු නීති සංශෝධනය කිරීම. (වර්ෂ 2021 සිට බලපැවැත්වෙන පරිදි)
- ළමා ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනේ පරිපාලන කටයුතු වර්ෂ 2020 අගෝස්තු මස සිට පීඨය මඟින් සිදු කිරීම.

➢ යටිතල පහසුකම්

- යෝජිත අර්ධ ස්ථීර ගොඩනැගිල්ල සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හිමිවුණු අතර සැලසුම් අධ්‍යනාංශය යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති .

➢ ජයග්‍රහණය කරන ලද පර්යේක්ෂණ ප්‍රදානයන්.

- ජාතික පර්යේක්ෂණ කවුන්සිලය මඟින් ප්‍රදානය කෙරෙන ප්‍රදානයන් දෙකක් රසායනික විද්‍යා අධ්‍යනාංශය මඟින් හිමි කරගන්නා ලදී.
- රුපියල් 5142500 ක ප්‍රදානයන් සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය වෙත ලෝක බැංකු ප්‍රදානයනක් යටතේ මෙහෙයුම් පර්යේෂණයන් සඳහා හිමිවිය.

- මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයෙන් ලැබුණු මූල්‍ය ප්‍රදානයක් මඟින් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා කෙටි කාලීන සියලු ව්‍යාපෘති 7ක් 2020 වර්ෂය තුළ දියත් කරන ලදී.
- උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය හා සංවර්ධන වේගවත් කිරීමේ ව්‍යාපෘතිය හරහා රුපියල් මිලියන 80 ක් වටිනා පර්යෙක්ෂණ, නවෝත්පාදන හා වාණිජකරණ ප්‍රදාන 2ක් හිමි කරගැනීම.
- පීඨයේ අභ්‍යන්තර තත්වය සහතික කිරීමේ ඒකකයේ මඟ පෙන්වීම යටතේ විවිධ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සකස් කිරීම. ඒවා නම් පාඨමාලා සැලසුම් කිරීමේ ප්‍රතිපත්තිය, විභාග කටයුතු සඳහා මාර්ගෝපදේශ, කාර්මික පුහුණු සඳහා මාර්ගෝපදේශ, නවක සිසුන්ගේ දිශානතිය කිරීමේ ප්‍රතිපත්තිය, විශ්වවිද්‍යාලය තොරතුරු තාක්ෂණ භාවිතා ප්‍රතිපත්තිය, ශිෂ්‍ය ප්‍රගති ප්‍රතිපත්තිය, විශ්වවිද්‍යාල අන්‍ය ඉගෙනුම් පරිසර ප්‍රතිපත්තිය, අධ්‍යන සැලසුම් සහ සංවර්ධන කමිටුව සඳහා යොමු නියමයන්, පුස්තකාලය හඳුන්වාදීමේ වැඩසටහන්, විවෘත අධ්‍යාපන සම්පත් සහ ශිෂ්‍ය වාර්තා කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති සැකසීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය සිසුන් සඳහා ක්ෂේත්‍ර ස්ථානගත කිරීම් මාර්ගෝපදේශය, සම ඇඟයීම් ක්‍රියා පටිපාටිය, අධ්‍යනාංශ සම්මාන සඳහා මාර්ගෝපදේශ හා භාහිර ක්‍රියාකරණය සඳහා මාර්ගෝපදේශ සකස් කරන ලදී.

➢ අත්පත් කරගත් නව සංවර්ධන

- රසායන විද්‍යා අධ්‍යනාංශය පිහිටුවීමට අවශ්‍ය සියළු පරිපාලන හා ශාස්ත්‍රීය ක්‍රියාවන් හා වගකීම් ක්‍රියාවට නංවන ලදී.
- 2020 වර්ෂය තුලදී රට තුල පැවති වසංගත තත්වය සමඟ සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රවේශය හා අධ්‍යන වැඩසටහන සම්බන්ධයෙන් ජාතික පිලිගැනීම ඉහල යන ලදී. කොවිඩ් 19 වසංගතයට ප්‍රතිරෝධ දැක්වීම සඳහා අනුගමනය කළ හැකි පියවරයන් හා සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රවේශයේ උත්සහයන් අගය කරමින් විද්‍යුත් හා මුද්‍රිත යන මාධ්‍ය දෙකෙන්ම ප්‍රවර්ධන කටයුතු සිදුකරන ලදී.

➢ සම්මාන

- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ ජේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩබ්. එම්. එස් ප්‍රනාන්දු විසින් නිරෝගී ලංකා දියවැඩියා නිවාරණ ජාතික වැඩසටහන් ශ්‍රී ලංකාවේ දියවැඩියා නිවාරණය සඳහා හොඳම දායකත්වය වෙනුවෙන් ජාතික සම්මානයක් ලබා ගන්නා ලදී.
- ගුණාත්මකභාවය හා නව්‍ය පර්යේක්ෂණ විශිෂ්ටත්වය ඉහල නැංවීම සඳහා පීඨයේ අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික පර්යේක්ෂණ සම්මාන ප්‍රදානය කිරීම ආරම්භ කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන සංගමය විසින් පනවන ලද වැඩසටහන්.
- බහු සංස්කෘතික කුසලතා වැඩිදියුණු කරීම හා සිසුන් හා කාර්යමණ්ඩලය අතර සහයෝගීතාවය වැඩිදියුණු කිරීම සඳහා "සඳයට 2020" වැඩසටහන වර්ෂ 2020 ජනවාරි 23 වන දින පවත්වන ලදී.
- සෞඛ්‍ය ප්‍රවර්ධන සංගමයේ අරමුදල් රැස් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල සිසුන් අතර පරිසර හිතකාමී සාප්පු සවාරි සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා "පුණ්‍ය සාප්පුවක්" වැඩසටහන වර්ෂ 2020 මාර්තු මස 3වන දින පැවැත්වීම.
- නියෝජ්‍ය ලේඛකාධිකාරී (විභාග අංශය) හා පරිසණක මධ්‍යස්ථානයේ අධ්‍යන සහයක කාර්ය මණ්ඩලයේ සහයෝගිතාවයෙන් "විභාග තොරතුරු පද්ධතියක්" සංවර්ධනය කිරීම. වෛද්‍ය හා සමාන්තර විද්‍යාපීඨය හා කෘෂිකර්ම පීඨය දැනට මෙම පද්ධතිය නියමු ව්‍යාපෘතියක් ලෙස භාවිතා කරයි. ප්‍රථම වතාවට 2018/2019 නව ශිෂ්‍ය කණ්ඩායම මාර්ගගත ක්‍රමය ඔස්සේ බඳවා ගැනීම මෙම පද්ධතිය හරහා සිදුකෙරෙන අතර සියලුම සිසුන් ඔවුන්ගේ වර්තමාන අධ්‍යනවාරය සඳහා ලියා පදිංචි වීමද මෙම පද්ධතිය හරහා සිදු කෙරිණි.
- සාර්ථකව පවත්වන ලද වැඩමුළු හා අන්තර්ජාලය හරහා පවත්වන ලද සම්මන්ත්‍රණ.
- අධ්‍යන පොදු සහතික පත්‍ර උසස්පෙළ සිසුන් සඳහා භෞතික විද්‍යා වැඩමුළුවක් මිහින්තලේ මහා විද්‍යාලයේදී පවත්වන ලදී.
    - ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලීය විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ ශිෂ්‍ය ශාඛාව මඟින් සියළුම තොරතුරු තාක්ෂණ/පරිගණක විද්‍යා උපාධි අපේක්ෂකයින් සඳහා අන්තර්ජාලය හරහා සම්මන්ත්‍රණ සැසි 4 ක් හා වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීම.
    - රජරට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංගමය මඟින් සියළුම තොරතුරු තාක්ෂණ/පරිගණක විද්‍යා උපාධි අපේක්ෂකයින් සඳහා අන්තර්ජාලය හරහා සම්මන්ත්‍රණ සැසි 4 ක් හා වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීම.
    - ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය නිදහස් හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග සමාජය හා විශ්වවිද්‍යාලීය වොශිල්ලා සංගමය මඟින් අන්තර්ජාලය හරහා සමානුපාතික භූමි 10 ක් හා 2020/2021 රජරට සියළු තොරතුරු තාක්ෂණ/පරිගණක විද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා රැස්වීම් පැවැත්වීම.
    - පරිසණක අධ්‍යනාංශයේ උපාධි අපේක්ෂයන් හා උපාධිධාරීන් ශ්‍රී ලංකා විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ ශිෂ්‍ය ක්‍රියාකාරකම් කමිටුව 2020-2021 සඳහා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් විය.

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලීය විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ ශිෂ්‍ය ශාඛාවේ සාමාජිකයින් 18 දෙනෙකු ශ්‍රී ලංකා විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ ප්‍රමුඛ ඉසව්වක් වන අයි.ඊ.ඊ.ඊ. එස්.එල්. එස්.ඩබ්.ඩී 20 සඳහා තෝරා ගැනීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- පහත දක්වන වැඩසටහන් වර්ෂ 2020 තුළ පැවැත්වීමට සැලසුම් කර තිබුණද පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඒවා අවලංගු කරන ලදී.
- ව්‍යවහාරික විද්‍යා පීඨ උපාධි අපේක්ෂකයින් 2020 පර්යේක්ෂණ සැසිය.
- ජීව විද්‍යා උපාධිය හදාරා සිසුන් සඳහා සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්.
- ශාක ක්ෂුද්‍ර ජීවී අන්තර්ක්‍රියා අධ්‍යාපන ක්ෂේත්‍ර ආදාර්ශන ක්‍රියාකාරකම්.
- කැනඩා ලමාල් විශ්වවිද්‍යාල නියෝජිතයින් පිරිසක්, සෞඛ්‍ය ප්‍රවර්ධනය අධ්‍යයන අංශයට පැමිණ මිහින්තලයේ සෞඛ්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශය තුළ වාර්ෂ 2020 මාර්තු මස 29 දින සිට අප්‍රේල් 2 දක්වා සිදු කිරීමට නියමිතව තිබූ ක්ෂේත්‍ර සැලසුම් වැඩසටහන.
- කාර්මික පුහුණු වැඩසටහන් නිසි ලෙස සැලසුම් කිරීම.
- අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ හා භෞතික සම්පත් වල හිඟකම නිසා දුෂ්කරතා රාශියකට මුහුණ දීමට සිදු විය.
- සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී හා සෞඛ්‍ය ප්‍රවර්ධන (ගෞරව) විද්‍යාවේදී 2018/2019 කණ්ඩායම සඳහා විෂය මාලා සංශෝධනයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයේ සංශෝධිත විෂය මාලා අනුමත කරගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙනි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශ ගොඩනැගිල්ලේ පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.

ඈ. අනාගත දැක්ම

- හරිත විශ්වවිද්‍යාල සංකල්පය වෙත අවධානය යොමු කිරීම . සූර්ය විදුලි බල පද්ධතියක් ස්ථාපනය කිරීම.
- ආබාධිත සිසුන් සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම. (ආබාධිත සිසුන් සඳහා වැසිකිළි පද්ධතියේ අළුත්වැඩියාව සම්පූර්ණ කිරීම.)
- ගණිත අධ්‍යනාංශය හා පශ්චාත් උපාධි ඒකක ස්ථාපනය කිරීම.
- විශ්වවිද්‍යාල සනාථන සභාවේ මාර්ගෝපදේශයන්ට අනුව වර්ෂ 2019 සිට පර්යේක්ෂණ සම්මාන ප්‍රදානය කිරීම.
- අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා "වැඩසටහන් සමාලෝචනය" (ක්ෂේත්‍ර සංචාර පිළිබඳව අවධානය යොමු කරමින්) පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම හා අධ්‍යන හා අනධ්‍යන කාර්ය මණ්ඩල සඳහා සාමාන්‍යයෙන් පැවැත්වෙන කාර්ය මණ්ඩල සංවර්ධන වැඩමුළු පීඨ අභ්‍යන්තර තත්වය සහතික කිරීමේ ඒකකය මඟින් පැවැත්වීම.
- භෞතික විද්‍යා ගෞරව උපාධිය, දත්ත විශ්ලේෂණ ගෞරව උපාධිය හා පරිසර විද්‍යා ගෞරව උපාධිය යන නව උපාධී පාඨමාලා හඳුන්වා දීම. (විෂය මාලා පිළියෙල කිරීම සිදු කෙරෙමින් පවති.)
- ජාතික පර්යේෂණ කවුන්සිලයේ 16-015 ප්‍රදානයන් යටතේ චීනයෙන් ඉලෙක්ට්‍රොනික ඩයලිසිස් ප්‍රතිවර්ථන ජල පිරිපහදු යන්ත්‍රයක් ස්ථාපනය කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමා වැඩසටහන යලි ආරම්භ කිරීම.
- තොරතුරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාවේ විෂයමාලා සංශෝධන කටයුතු අවසන් කිරීම හා පරිසණක විද්‍යා විෂය ධාරාවේ විෂය මාලා සංශෝධන කටයුතු ආරම්භ කිරීම.
- අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම.
- සිසුන්ගේ අධ්‍යන කටයුතු කරගෙන යාමට අවශ්‍ය භෞතික සම්පත් වැඩි දියුණු කිරීම.
- දැනුම හා තාක්ෂණය ප්‍රාදේශීය ජනතාවට ලබාදීම සඳහා වැඩමුළු පැවැත්වීම.
- ජීවවිද්‍යා අධ්‍යනාංශයේ විවිධ වූ ක්ෂේත්‍රයන්හි පුහුණු වැඩමුළු සහ අවස්ථාවන් සංවිධානය කිරීම.
- අනෙකුත් විශ්වවිද්‍යාල වලද සහයෝගීතාවයෙන් සිසුන් සඳහා පර්යේක්ෂණ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා උතුරුමැද පළාත් ගුරුවරු හා සිසුන් සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
- අධ්‍යන කාර්ය මණ්ඩලය සහ රසායනාගාර කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ ප්‍රමිතින් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

19. කළමණාකරන අධ්‍යයන පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයිය කළමනාකරණ අධ්‍යයන පීඨය කළමනාකරණ අධ්‍යනාංශයේ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මකවේ. මෙහි උපාධි අපේක්ෂකයින් 2000ක් පමණ සිටින අතර තරුණ නමුත් ජව සම්පන්න අධ්‍යන කාර්ය මණ්ඩලය 62ක් පමණවේ. කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් මූලික උපාධි පාඨමාලා මෙන්ම පශ්චාත් උපාධි පාඨමාලා පවත්වන අතර ඒවා කළමනාකරණ විෂයේ විවිධ උප විෂයන් යටතේ පිරිනමනු ලබන මූලික උපාධි පාඨමාලා, පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලාවේ. කළමනාකරණ අධ්‍යයන පීඨය අධ්‍යනාංශ පහකින් සමන්විත වන අතර ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යනාංශය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය, මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය, ව්‍යාපාර තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය, අලෙවිකරණ කළමනාකරණ අධ්‍යනාංශය, සහ සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශය වේ. අධ්‍යනාංශ මඟින් පහත සඳහන් උපාධි පිරිනමනු ලැබේ.

- ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- ව්‍යාපාර තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය

ඒ සමඟ පීඨය මඟින් ආචාර්ය උපාධි පිරිනැමීම හැරුණුකොට ඇති අතර ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාවේ අනුමැතියද හිමිවී තිබේ.

කළමනාකරණ අධ්‍යයන පීඨයේ පරමාර්ථය වනුයේ කළමනාකරණ අධ්‍යයනයට හා නායකත්වයට ප්‍රායෝගික කුසලතා සහිත ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ වෙනස් වන පරිසරය පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වන පර්යේක්ෂණ පැවැත්වීමයි.

පීඨයේ අරමුණු හා අභිප්‍රායන් වනුයේ

- ව්‍යාපාර ව්‍යවසායන්ට සහය විය හැකි හා සංවර්ධනය කල හැකි ව්‍යාපාර හා කළමනාකරණ අධ්‍යාපනයක් සහිත සිසුන් බිහි කිරීම.
- නැගී එන කර්මාන්ත/ව්‍යාපාරික ව්‍යවසායන් සඳහා අවශ්‍ය කුසලතා හා දැනුම ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම සහ වේගයෙන් සංවර්ධනය වන ව්‍යාපාරික පරිසරය තුල වෘත්තීකයන් වීමේ හැකියාවක් ඔවුන්ට ලබා දීම.
- ව්‍යාපාරික ලෝකයේ ගැටළු හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ අනාගත වෘත්තීන් සංවර්ධනය කර ගැනීමට ප්‍රමානවත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ලබා දීම.
- සිසුන්ගේ නිශ්චිත අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල නිර්මානාත්මක චින්තනය, ගැටළු විසඳීම, සන්නිවේදනය සහ පර්යේක්ෂණ කුසලතා පිළිබඳ පුර්න හැකියාවන් ලබා ගැනීමට ශිෂ්‍යයින් දිරිමත් කිරීම සහ පහසුකම් ඇති වීම උප විෂයන් කෙරෙහි හබා යෑම සඳහා සිසුන්ට වැඩි සහයෝගයක් ලබා දීම.

මේ වන විට පීඨයේ, තොරතුරු තාක්ෂණ පද්ධති පිළිඳ නව අධ්‍යනාංශයක් පිහිටු වීමට කටයුතු සිදු කෙරෙමින් පවතී. එයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති අතර ගැසට් නිවේදනයද ප්‍රකාශයට පත් කර තිබේ.

ආ. ජයග්‍රහනයන්

- උපාධි පාඨමාලා 4 ක විෂය මාලා සංශෝධනයන් සාර්ථකව නිම කිරීම හා ඒවා ගෞරව උපාධි බවට පත් කිරීම.

- ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- ව්‍යාපාර තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
- සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
    - උපාධි වැඩසටහන් වල සියළු පාඨමාලා ඉගෙනුම් කලමණාකරණ ආකෘතිය (එල්.එම්.එස්) පරිවර්තනය කිරීම.
    - සිසුන් සඳහා අධ්‍යන උපදේශනය හඳුන්වාදීම.

- "තොරතුරු පද්ධතිය" නමින් නව අධ්‍යනාංශයක් ආරම්භ කිරීම.
- පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
- පීඨයේ සියළු ගොඩනැගිලි හා දේශන ශාලා ආවරණය වන පරිදි වයිෆයි පහසුකම් ඇති කිරීම.
- අධ්‍යන අංශයක් සඳහා පරිගණක මධ්‍යස්ථානයක් පිහිටු වීම.
- ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
- ව්‍යාපාර කළමනාකරණ අධ්‍යන අංශයේ අධ්‍යන කාර්ය මණ්ඩලයේ මාර්ගෝපදේශනයන්ට අනුව ප්‍රජා මූලික ව්‍යාපෘති 10 ක් සිසුන් විසින් සිදු කරන ලදී.
- බොහෝ දේශන ශාලා ස්මාර්ට් පංති කාමර බවට පත් කරන ලදී
- තොරතුරු පද්ධති අධ්‍යනාංශයේ පවතින පරිගණක විද්‍යාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.
- සංචාරන හා ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශයේ ආදර්ශ මුළුතැන්ගෙය සහ අවන්හලේ පුළුල් කිරීමේ කටයුතු 90% නිම කොට තිබීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- අළුතින් ස්ථාපනය කරන ලද අධ්‍යනාංශ සඳහා අධ්‍යන කාර්ය මණ්ඩලය තවමත් අනුමත කර නොමැත. එබැවින් පවතීන අධ්‍යන කාර්ය මණ්ඩලය හිඟය හේතුවෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ අනෙකුත් වැඩකටයුතු කිහිපයක් පැවැත්වීමට නොහැකිවිය.
- කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන්ද සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් පැවැත්වීමට නොහැකි විය.
- කෙවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පීඨයේ ඉදිකිරීම් ප්‍රමාද විය.

ඈ. අනාගත දැක්ම

- ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා ඇගයීම් හඳුන්වාදීම.
- උතුරුමැද පළාත් ව්‍යාපාරික සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරගැනීම.
- ව්‍යාපාරික සංවිධාන සමඟ සහයෝගීතාවයෙන් පර්යේක්ෂණ සිදුකිරීම.
- මානව සම්පත් කළමනාකරණ සිසුන් සඳහා මානසික විද්‍යා හා උපදේශන සහතික පත්‍ර පාඨමාලාව හඳුන්වාදීම.
- උපාධි පාඨමාලා දෙකක් සඳහා විෂයමාලා සංශෝධනයන් සිදු කරයි.
- එච්. ඊ. ආර්. ශිෂ්‍ය සඟරාව ආරම්භ කිරීමට සැලසුම් කිරීම.
- සිසුන් සහ අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා පරිගණක විද්‍යාගාර සංකීර්ණයක් ඉදි කිරීමට සැලසුම් කිරීම.
- තොරතුරු පද්ධති අධ්‍යනාංශයේ පරිගණක විද්‍යාගාරය සඳහා නව පරිපථ මිලදී ගැනීම.
- "චීන ශ්‍රී ලංකා අන්තර් විෂය සංස්කෘතික උරුමයන් සහ සංචාරක පර්යේක්ෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයක්" යටතේ මහජන චීන සමූහාණ්ඩුවේ සිචුවාන් විශ්වවිද්‍යාලයේ සංචාරක පාසල සමඟ සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශයේ පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- උපාධි අපේක්ෂයන්ගේ පර්යේෂණ නිමැවුම් විද්‍යුත් සඟරාවක් නිකුත් කිරීම.
- සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශයේ ආදර්ශ මුළුතැන්ගෙය හා අවන්හල ගොඩනැගිල්ලේ ඉහල මාලයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.
- ජාතික සංචාරක ක්ෂේත්‍ර පාර්ශවකරුවන් සමඟ ලෝක සංචාරක දිනය 2021 සැමරීම සංශෝධනය කිරීම.
- කොවිඩ් 19 සහ සංචාරක කර්මාන්තය කළමනාකරණය සම්බන්ධයෙන් විශේෂ සඟරාවක් නිකුත් කිරීම.
- සිසුන් සංඛ්‍යාවේ වැඩිවීම සමානුපාතිකව අධ්‍යනාංශවල සම්පත් මධ්‍යස්ථාන පුළුල් කිරීම.
- සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලා ආරම්භ කිරීමට ''අන්තර්ජාතික වර්ධන'' සඳහා කුසලතා (ඕස්ට්‍රේලියන්-ආධාර) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම.
- අනුරාධපුර හෝටල්කරුවන්ගේ සංගමය සමඟ "විකල්ප සංචාරක ක්ෂේත්‍ර සංවර්ධනය" මැයෙන් රජයේ සහයෝගීතාවයෙන් අවබෝධතා ගිවිසුමකට එළඹීම.

20. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

අ. හැඳින්වීම

වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය වර්ෂ 2006 ජූලි මාසයේදී ආරම්භ කරන ලද අතර එය අධ්‍යනාංශ 15කින් සහ අධ්‍යයන ඒකක 3කින් සමන්විත විය. ශ්‍රී ලංකාවේ තෙවැනියට විශාලතම රෝහල වන අනුරාධපුර ශික්ෂණ රෝහල පීඨයේ ප්‍රධාන ශික්ෂණ රෝහලවේ. නවීන රෝග විනිශ්චය සහ කළමනාකරණ පහසුකම් වලින් සමන්විත ප්‍රධාන සායන අංශය වන විශ්වවිද්‍යාලයීය මහාචාර්ය ඒකකය අනුරාධපුර ශික්ෂණ රෝහල තුල පිහිටා ඇත. සියළුම සායනික දෙපාර්තමේන්තු වල කාර්ය මණ්ඩලය අනුරාධපුර ශික්ෂණ රෝහලේ ගෞරවනීය උපදේශකයින් ලෙස සේවාවන් සපයයි. ප්‍රජා පුහුණුවීම් ප්‍රදේශය, සමාජ-ආර්ථික වශයෙන් විවිධ ජනගහනයකින් සමන්විත බැවින් ප්‍රාථමික හා වැළැක්වීමේ ප්‍රතිකාර පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දීමට ඉඩකඩ ලැබේ. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය විසින් සපයනු ලබන ප්‍රජා සත්කාර සේවා අතරට මානසික ආබාධිත ළමුන් සඳහා සේවා, බාහිර සායන, සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සහ මාතෘ හා ළදරු සත්කාර සේවා ඇතුළත්වේ. පීඨය අඛණ්ඩව උත්සාහ කරනුයේ පීඨයේ ප්‍රමිතිය නඟා සිටුවීමෙන් සහජව ඔවුන්ගේ පූර්ණ හැකියාවන් කරා ලඟා වීමට මඟ සැලසවීමටය. පීඨයේ කෙටි ඉතිහාසය පුරාවට උපාධි අපේක්ෂකයන් පොදු කුසලතා අනුපිළිවලින් ඉහළ ස්ථාන ලබාගෙන ඇති අතර විවිධ පශ්චාත් උපාධි පාඨමාලාවල ඉහළ දස්කම් දක්වා ඇත.

ආ. ජයග්‍රහනයන්

- වර්ෂ 2020 දී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා එක් ආධුනික කථිකාචාර්යවරයෙකු බඳවා ගන්නා ලදී.
  - වෛද්‍ය එල්. එල්. අමිල ඉසුරු - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණිය, මනෝචිකිත්සක අධ්‍යානාංශය.
  - වෛද්‍ය එච්. බී. ඩී. ජීවන්ත - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙවන ශ්‍රේණිය, ව්‍යුහ විද්‍යා අධ්‍යානාංශය.
  - වෛද්‍ය එච්. එම්. එන්. සී. හේරත් - ආධුනික කථිකාචාර්ය, කායික විද්‍යා අධ්‍යානාංශය.
- වෛද්‍ය අධ්‍යනාංශයේ සිටින මහාචාර්ය සිසිර සිරිබද්ධන වෛද්‍යතුමා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලෙස උසස් වීම් ලබා ගන්නා ලදී.
- පරපෝෂිත අධ්‍යානාංශයේ සේවය කරන කේ. ජී. ඒ. ඩී. වීරකෝන් වෛද්‍යතුමා මහාචාර්ය තනතුරට උසස් වීම් ලබා ගන්නා ලදී.
- ළමා රෝග අධ්‍යනාංශයේ සේවය කරන ඩබ්. ඒ. ජේ. සී. චන්ද්‍රකුමාර වෛද්‍යතුමා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙවන ශ්‍රේණියට උසස් වීම් ලබා ගන්නා ලදී.
- මහාචාර්ය එන්. කේ. ඒ. සිල්වා වෛද්‍යතුමා විසින් එඩින්බරෝ රාජ්‍ය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකත්වය (FRCP Edin) ලබා ගන්නා ලදී. (පරපෝෂිත විද්‍යා අධ්‍යනාංශයේ, පරපෝෂිත විද්‍යා පිළිබඳ මහාචාර්ය)
- ආර්. ඩී. එන්. සී. සරත්චන්ද්‍ර වෛද්‍යතුමා විසින් එඩින්බරෝ රාජ්‍ය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකත්වය (FRCP Edin) ලබා ගන්නා ලදී. (වෛද්‍ය අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
- ඒ. එම්. ඒ. එච්. එම්. එස්. සේනානායක වෛද්‍යතුමන් විසින් එඩින්බරෝ රාජ්‍ය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකත්වය (FRCP Edin) ලබා ගන්නා ලදී. (වෛද්‍ය අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
- බී. ඒ. එම්. වික්‍රමසිංහ වෛද්‍ය තුමා විසින් එක්සත් රාජධානියේ රාජ්‍ය මනෝචිකිත්සක විද්‍යාලයේ සාමාජිකත්වය (FRCPsych UK) ලබා ගන්නා ලදී. (මනෝචිකිත්සක අධ්‍යනාංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
- වෛද්‍ය ඒ. එම්. එම්. වී. කුමාරි විසින් ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලදී. (කථිකාචාර්ය කායික විද්‍යා අධ්‍යනාංශය)
- වෛද්‍ය එච්. ඊ. සී. එස්. කුමාර විසින් "පරිපාලනය සහ මොන්ට්‍රියල් සංජානන තක්සේරු කිරීමේ පරීක්ෂණය" සාර්ථකව සම්පූර්ණ කරන ලදී. (ආධුනික කථිකාචාර්ය, කායික විද්‍යා අධ්‍යනාංශය)
- වෛද්‍ය එස්. ශ්‍රී ෂන්කර් විසින් රාජකීය ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකත්වය (FRCS Glasg) ලබා ගන්නා ලදී. (ශල්‍ය වෛද්‍ය අධ්‍යනාංශයේ අංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ඩබ්. බී. දිසානායක මහතා වෛද්‍ය පීඨයට අනුයුක්ත කිරීම වර්ෂ 2020 සිදු විය.
- වර්ෂ 2020 දී සිදුකරන ලද පීඨ සමාලෝචනයෙන් "බී" ශ්‍රේණිය හිමි කරගන්නා ලදී.
- මුළු පීඨ පරිශ්‍රයම භූමි අලංකරණය සිදු කරයි.
- බහුවිධ විද්‍යාගාරය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතියක් ස්ථාපනය කිරීම.
- මහාචාර්ය ඒකකයේ කුසලතා විද්‍යාගාරය ස්ථාපනය කිරීම.
- ප්‍රසව හා නාරීවෛද්‍ය අධ්‍යනාංශයේ කෞතුගාරයක් ස්ථාපනය කිරීම.

- ව්‍යාධි විද්‍යා අධ්‍යනාංශයේ ස්වයංක්‍රීය පූර්ණ රුධිර ගණනය කිරීමේ විශ්ලේෂණයන් ස්ථාපනය කිරීම.
- මහාචාර්ය ඒකකයේ විභාග සඳහා ප්‍රදේශයක් ස්ථාපනය කිරීම.
- මහාචාර්ය ඒකකය සඳහා පරිපාලන ඒකකයක් ස්ථාපනය කිරීම.
- දර්ශන ජර්නල වල පල කරන ලද ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා පීඨාධිපති සම්මාන ලබා දීම.
- පූර්ව සායනික ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.
- පවතින කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් අති විශාල අභියෝග රාශියක් මධ්‍යයේ වුවද වසර පුරා අධ්‍යන හා පර්යේක්ෂණ කටයුතු සාර්ථකව සිදු කිරීම.

(අ) පර්යේක්ෂන. නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

විෂය	ප්‍රකාශන සංඛ්‍යාව
අ. පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව (සාරාංශ, සම්පූර්ණ පත්‍රිකා)	145
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	1
ඇ. ශාස්ත්‍රීය සඟරා සංඛ්‍යාව	1
ඈ. පොත් සංඛ්‍යාව	1
ඉ. ලිපි ගණන (සම්පූර්ණ පත්‍රිකා)	52

(ආ) සම්මන්ත්‍රණ වැඩමුළු සහ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර

විෂය	සැලසුම් කරන ලද	පවත්වන ලද
අ. පශ්චාත් උපාධි වැඩසටහන සම්බස්ධව	13	13
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන සම්බස්ධව	-	-
ඇ. මූලික උපාධි වැඩසටහන සම්බස්ධව	10	10
ඈ. පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධ (ප්‍රජා වෛද්‍ය අධ්‍යනාංශය)	10	10
ඉ. සෛඛ්‍ය සේවා සහ රැකබලා ගැනීමේ තත්වයන් වැඩි දියුණු කිරීම හා සම්බන්ධව (වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය)	1	1

(ඇ) ලැබුණු සම්මාන පිළිබඳ විස්තර

විෂය	සම්මාන සංඛ්‍යාව	අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් ලබාගන්නා ලද	සිසුන් විසින් ලබාගන්නා ලද
අ. දේශීය සම්මාන	39	39	-
ආ. ජාතික සම්මාන	4	3	-
ඇ. ජාත්‍යන්තර සම්මාන	1	1	-
ඈ වෙනත්	-	-	-

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

සුදුසුකම් ලත් අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම සඳහා වසර පුරා ප්‍රචාරණය කළ නමුත් නොහැකි වුයේ සෞඛ්‍ය අමාත්‍යාංශය හා සසඳන විට වෛද්‍ය වෘත්තියන් සඳහා විශ්වවිද්‍යාලයෙන් ලබා දෙන පහසුකම් වල මදි පාඩුව නිසාය.

ඈ. අනාගත දැක්ම

- හරිත විශ්වවිද්‍යාල සංකල්පය ක්‍රියාත්මක කිරීම.
- පුස්තකාලය හා පරිපාලන ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම.
- මහාචාර්ය ඒකකය සඳහා CCTV කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම.
- පීඨ කාර්ය මණ්ඩලය සඳහා රථගාලක් ස්ථාපනය කිරීම.
- වෛද්‍ය සිසුන් සඳහා නව නේවාසිකාගාර සංකීර්ණයක් ඉදි කිරීම සඳහා කටයුතු සිදු කිරීම.

21. සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

අ. හැඳින්වීම

වර්ෂ 1995 දී ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ආරම්භයත් සමඟම සමාජීයවිද්‍යා හා මානවශ්‍රාස්ත්‍ර පීඨයේ ආරම්භය සිදුවිය. දැනට පීඨය තුල 2135 උපාධි අපේක්ෂකයන් පිරිසක් අධ්‍යයන කටයුතු වල නිරතවේ. 2020 වර්ෂයේදී පීඨය සඳහා නවක සිසුන් 434ක් බඳවා ගත් අතර සාමාන්‍යයෙන් වර්ෂයකට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 434කි.

සාමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය අධ්‍යනාංශ 6කින් සමන්විත වන අතර ඒවා නම් ශ්‍රාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි හා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පිරිනමනු ලැබේ. අධ්‍යනාංශයන් නම්

- පුරාවිද්‍යා හා උරුමයන් කළමනාකරණ අධ්‍යනාංශය
    - පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධිය
- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යනාංශය
- පරිසර කළමනාකරණ අධ්‍යනාංශය
    - පරිසර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධිය
- මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය
    - ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
- භාෂා අධ්‍යනාංශ්‍ය
    - සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
- සමාජවිද්‍යා අධ්‍යනාංශ්‍ය
    - ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය)

ඉහත සඳහන් උපාධි පාඨමාලා මඟින් උපාධිධාරීන් පහත දැක්වෙන ප්‍රථිපල අත්පත් කර ගනු ලැබේ.

I.. දේශීය හා විදේශීය සමාජ හා සංස්කෘතික විභවයන් මනාව හඳුනා ගැනීම සහ අවශ්‍යතාවය අනුව ඒවා වෙනස් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා හොඳ දැණුමක්, කුසලතා හා ආත්ම විශ්වාසයක්.

II.. ශාරීරික හා අධ්‍යාත්මික අවශ්‍යතා අතර අන්තර්ගත අන්තර් සම්බන්ධතාවය පිළිබඳ උපාධි අපේක්ෂකයන්ගේ සංජානනය පුළුල් කරන සමබර අධ්‍යාපනයක් ලබා ගැනීම.

ආ. ජයග්‍රහනයන්

- ජන සන්නිවේදන ගෞරව උපාධිය හඳුන්වා දීම.
- සමාජීයවිද්‍යා ගෞරව උපාධිය හඳුන්වා දීම.
- ආර්ථික විද්‍යා අධ්‍යනාංශය නව අධ්‍යනාංශයක් ලෙස ස්ථාපනය කිරීම.
- ඉංග්‍රිසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය මඟින් අභ්‍යන්තර මෙන්ම භාහිර සිසුන් සඳහාද ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් උපාධිය පිරිනැමීමට අපේක්ෂා කෙරේ. මෙහි මූලික විෂය මාලා සැලසුම් කිරීම සම්පූර්ණ කර ඇති අතර ඉංග්‍රීසි භාෂාවේ ඉගැන්වීමේ ප්‍රවීණයන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළු පවත්වා විෂය මාලාව වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.
- වර්ෂ 2020 අභ්‍යන්තර පීඨ ඉංග්‍රීසි භාෂා කථික තරඟාවලිය හා ලිඛිත තරඟාවලිය පැවැත්වීම.
- රැකියා වෙළඳපොළෙහි ඇති ඉංග්‍රීසි භාෂා තරඟකාරිත්වයට සරිලන සිසුන් නිර්මාණය කිරීමට හැකි පරිදි ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් වැඩසටහන් සංශෝධනය කිරීමට සැලසුම් සැකසීම.
- පැවති වසංගත තත්වය හේතුවෙන් බොහෝමයක් දේශන කටයුතු ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හා zoom තාක්ෂණය වැනි දුරස්ථ අධ්‍යාපන ක්‍රම භාවිතයෙන් සිදුකරයි.
- ස්වයං ඇගයුම් කමිටුවේ යෝජනා අනුව කුසලතා මූලික හා ප්‍රථිඵල මූලික ඉගෙනුම් ක්‍රමවේදය වැඩිදියුණු කිරීම.
- කලාත්මක, සෞන්දර්යාත්මක හා සාහිත්‍ය විනෝදාස්වාද වැඩසටහන් සංවිධානය කිරීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- "නිවර්තන පරිසර සඟරාව, කාණ්ඩ 11 - 2020" ප්‍රකාශයට පත්කිරීමට නොහැකිවීම.
- පරිසර කළමණාකරණ ගෞරව ශාස්ත්‍රවේදි උපාධිය පරිසර කළමනාකරණ ගෞරව විද්‍යාවේදි ලෙස වෙනස් කිරීමට නොහැකිවීම.

- වර්ෂ 2020 ජූලි මස පැවැත්වීමට සැලසුම් කොට තිබූ ඓතිහාසික අධ්‍යන පිළිබඳ ජාතික පර්යේක්ෂණ සම්මන්ත්‍රණය පැවැත්වීමට නොහැකි වීම.
- අධ්‍යාපන ජර්නලයේ සහ මානවශාස්ත්‍ර පීඨ ජර්නලයේ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකිවීම.
- කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පීඨය තුළ පැවැත්වීමට සංවිධානය කොට තිබූ වැඩසටහන් කිහිපයක් කල්දැමීමට සිදු විය.
- කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2018/2019 නවක සිසු කණ්ඩායම් බඳවා ගැනීම ප්‍රමාද විය. අධ්‍යනවාර සමාන්තරව පවත්වාගෙනයාමේ අවශ්‍යතාවය නිසා නවක සිසු කණ්ඩායම් සඳහා දේශන zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

ඈ. අනාගත දැක්ම

- උපාධි අපේක්ෂයින්ගේ පුරාවිද්‍යාව පිළිබඳ පර්යේක්ෂණ සංවිධානයේ 6 වන සැසිය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමට කටයුතු සැලසුම් කොට තිබේ. සම්මන්ත්‍රණය සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමේ ග්‍රන්ථය හා "පුරාවේද ග්‍රන්ථය" එළිදැක්වීම මෙහිදි සිදුකිරීමට අපේක්ෂා කෙරේ.
- "පුරාවිද්‍යා හා උරුම අධ්‍යන" පීඨ ජර්නලයේ 05 වන වෙළුමේ I, II, III වන නිකුතුන් ප්‍රකාශයට පත් කිරීම.
- පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශයේ අධ්‍යන කාර්ය මණ්ඩලයේ, අනධ්‍යන කාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ ජයග්‍රහණයන් අගය කිරීම සඳහා යාන්ත්‍රණයක් වර්ෂ 2021 සිට සැකසීම.
- අධ්‍යනාංශ මඟින් පවත්වන අන්තර්ජාල සම්මන්ත්‍රණ දිගටම පවත්වාගෙන යාම.
- "නිවර්තන පරිසර" සඟරාවේ දෙවන වෙළුමේ දෙවන නිකුතුව ප්‍රකාශයට පත්කිරීම.
- උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම.
- පශ්චාත් උපාධි විෂය පාඨමාලා සැකසීම සම්පූර්ණ කිරීම.
- සිසුන්ගේ සමූපකාර වෙළඳසැල පීඨය තුළ ස්ථාපනය මඟින් පීඨ ව්‍යාපාර සම්බන්ධීකරණ ඒකකයේ ක්‍රියාකාරකම් පුළුල් කිරීම.
- ආර්ථික විද්‍යා අධ්‍යනාංශය නව පර්යේෂණ ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම.
- මෘදු කුසලතා/දත්ත විශ්ලේෂණ හැකියාවන් වැඩි කිරීම සඳහා කෙටි පාඨමාලා හඳුන්වාදීම.
- මාර්ගගත භාෂා සංසදය - ප්‍රංශයේ, ජපානයේ තානාපති කාර්යාල, චීන තානාපති කාර්යාලයට අනුබද්ධ කොන්ෆියුසියස් ආයතනය සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව භාෂා අධ්‍යනාංශය මඟින් ප්‍රථම වරට මාර්ගගත භාෂා සංසදය පැවැත්වීම.
- ජපන් භාෂා විද්‍යාගාරය - ජපන් තානාපති කාර්යාලය සමඟ එක්ව නව ජපන් භාෂා විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම.

22. තාක්ෂණ පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ හය වන පීඨය ලෙස තාක්ෂණ පීඨය වර්ෂ 2017 සැප්තැම්බර් මස 14 වන දින නිල වශයෙන් ගැසට් කරන ලදි. විශ්වවිද්‍යාලයේ සමස්ථ අධ්‍යයන ව්‍යුහය පුළුල් කිරීමේ අරමුණින් තාක්ෂණ පීඨය සඳහා මූලපිරීම වර්ෂ 2015 ජනවාරි මාසයේදී ව්‍යවහාරික විද්‍යා පීඨය තුල සිදු කරන ලදි. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ අධ්‍යන ව්‍යුහය අනෙක් විශ්වවිද්‍යාල වලට සාපේක්ෂව ප්‍රමාණයෙන් හා විෂය පථයෙන් ප්‍රමානවත් ලෙස විස්ථාරණය වනු ඇතැයි මෙහි මූලාරම්භය සමඟව අපේක්ෂා කරන ලදි.

තාක්ෂණ පීඨය අධ්‍යනාංශ පහකින් සමන්විත වන අතර මින් එක් අධ්‍යනාංශයක් මඟින් ඊට අදාල උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. එවා නම් 1- ජෛව පද්ධති තාක්ෂණය 2-විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය , 3- ආහාර තාක්ෂණය, 4- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මෙම සියළුම උපාධි පාඨමාලා වර්ෂ 4ක් පුරා දිවෙන අතර ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 6 ආකෘතිය අනුගමනය කරනු ලැබේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස්පෙළ විභාගය සඳහා තාක්ෂණික විෂය ධාරාවෙන් පෙනී සිටි සිසුන් තාක්ෂණික පීඨය සඳහා තෝරාගනු ලබන අතර මුල් අධියරයේදී ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ලෙස සිසුන් කණ්ඩායම් වලට බෙදනු ලැබේ. සිසුන්ගේ මනාපය, අධ්‍යයන කාර්ය සාධනය සම්පත් ලබා ගැනීමේ හැකියාව සහ වෙළඳ පොළ ඉල්ලුම සැලකිල්ලට ගනිමින් ජෛව පද්ධති තාක්ෂණ හා ඉංජිනේරු තාක්ෂණ සිසුන් පිළිවෙලින් ජෛව සැකසුම් හා ආහාර ලෙස සහ විදුලි හා ඉලෙක්ට්‍රෝනික හා ද්‍රව්‍ය තාක්ෂණය යන අංශ වලට වෙන් කරනු ලැබේ.

රටේ පවත්නා ඇතැම් පාඨමාලා සමඟ සංසන්දනය කරන විට තාක්ෂණික උපාධි වැඩසහහන් වඩාත් වෘත්තීමය වන අතර, දැන් මත ඇති කුසලතා පෝෂණය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. කර්මාන්ත සම්බන්ධතා හා සහයෝගිතාවය පාඨමාලා ආරම්භයේ සිටම විෂය මාලාවට ඇතුලත් කර තිබේ. මෙය ඉතා වැදගත් වනුයේ තාක්ෂණ උපාධි පාඨමාලා හදාරන සියළු සිසුන් ඔවුන්ගේ අවසාන අධ්‍යයන වාර කිහිපය තුල කාර්මික ස්ථානගත කිරීමක් සහ අධ්‍යත වාරයක් දිගු පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා යායුතු බැවිනි.

තාක්ෂණ පීඨය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබෙන අරමුදල් වලට අමතරව යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් මූල්‍යාධාර ලැබේ. අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස්පෙළ විභාගයේ තාක්ෂණ විෂයට පෙනී සිටි සිසු කණ්ඩායම් තුනක් මේ වන විට පීඨයේ අධ්‍යයන කටයුතු සිදු කරන අතර තෙවන වසර සිසුන් ඔවුනගේ පළමු අධ්‍යයන වාරයේදී කාර්මික පුහුණුවද අවසන් කර ඇත. වර්තමානය වනවිට පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ස්ථීර සාමාජිකයන් 28දෙනෙකු හා තාවකාලික කාර්ය මණ්ඩල සාමාජිකයන් 09දෙනෙකුගෙන් සමන්විතවේ.

ආ. ජයග්‍රහනයන්

තොරතුරු සන්නිවේදනය තාක්ෂණ විද්‍යාගාරයේ විදුලි රැහැන් ඇදීමේ කටයුතු සහ අවශ්‍ය කාර්යාලීය භාණ්ඩ ලබා ගැනීමේ කටයුතු අවසන් ඇති අතර අන්තර්ජාල රැහැන් ඇදීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී. මෙම විද්‍යාගාරය වර්ෂ 2021 ජනවාරි මස අවසන් වන විට භාවිතයට ගැනීමට සූදානම් කොට තිබෙන අතර අදියර 11 සහ අදියර 111 ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවති. කොන්ත්‍රාත්කරුගේ කාල රාමුවට අනුව ඉංජිනේරු වැඩපලෙහි හා ද්‍රව්‍ය නියමු බලාගාරයේ කටයුතු වර්ෂ 2021 පෙබරවාරි මස අවසානය වන විට සම්පූර්ණ කරනු ලැබේ. තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු වර්ෂ 2021 අප්‍රේල් මස අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර සම්පූර්ණ ව්‍යාපෘතිය වර්ෂ 2021 නොවැම්බර් මස සම්පූර්ණ වනු ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානත්වයෙන් ක්‍රියාත්මක විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය සිදුකෙරෙමින් පවති. මෙම ව්‍යාපෘතිය යටතේ විද්‍යාගාර, කාර්යාල හා ඉගැන්වීම් ආශ්‍රිත උපකරණ මිලදී ගැනීම් සිදුකෙරෙති. ව්‍යාපෘතියේ සිවිල් කටයුතු සඳහා මිල ගණන් කැඳවීම් සිදුකොට තිබෙන අතර ඒවා කැබිනට් මණ්ඩලය විසින් පත්කොට ඇති ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වේ. ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් මිලියන 25 ක් ලබාගෙන එම මුදලින් කොවිඩ් 19 වළක්වා ගැනීම සහ මාර්ගගත ඉගෙනුම් හා ඉගැන්වීම් ප්‍රචලිත කිරීම සඳහා කළමනාකරණය කරන ලදී. මිලියන 25න් මිලියන 13ක් ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා වයිෆයි පහසුකම් සැලසීමට යෙදවිය. ඉතිරි මුදල් මුළු විශ්වවිද්‍යාලය සඳහා අවශ්‍ය මාර්ගගත ඉගැන්වීම් හා ඉගෙනුම් උපකරණ, අත් පිරිසිදු කාරක, අත්වැසුම්, මුව ආවරණ හා සබන් මිලදී ගැනීමට යෙදවිය. කොවිඩ් වසංගතය සමඟ මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදයට යොමුවීම පීඨය සාර්ථකව කළමනාකරණය කරගන්නා ලදී. වසර පුරාම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පාඨමාලාවන්හි න්‍යායාත්මක කොටස් ඉගැන්වීම සිදුකළ අතර ඒවාට සිසුන්ගේ 60% සහභාගිත්වයක් තිබුණි. 15/16 තොරතුරු සන්නිවේදන තාක්ෂණ කණ්ඩායමේ තෙවන වසර දෙවන වර්ෂාර්ධයට අදාළ විභාග සහ ප්‍රායෝගික කටයුතු පැවැත්වූයේ සිසුන් සති දෙකක කාලයක් සිසු නේවාසිකාගාර තුළ

නිරෝධායනය කිරීමෙන් පසුව 16/17 කණ්ඩායම් ඔවුන්ගේ වර්ෂාර්ධ අවසාන විභාග සහ ප්‍රායෝගික කටයුතු සඳහා වර්ෂ 2020 දෙසැම්බර් මස විශ්වවිද්‍යාලයට කැඳවීය.

ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානත්වයෙන් සිදුකෙරෙන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පීඨයේ පළමු අදියර ගොඩනැගිල්ලේ කිලෝ වොට් 75 ක සූර්ය බල පද්ධතියක් වර්ෂ 2020 සැප්තැම්බර් මස ස්ථාපනය කරන ලදී. එහි ආදායම පීඨ සංවර්ධන අරමුදලට බැර කරනු ලැබේ. එමෙන්ම පීඨය සඳහා කිලෝ වොට් 300ක ජෙනරේටරයක්ද සවි කරන ලදී. භාහිර අංශය සඳහා උපකරණ සහ උපදේශන සේවා ලබා දීමට තාක්ෂණ සේවා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සිදුකෙරිණි. එහි ආදායම විශ්වවිද්‍යාලටයට හා පීඨ සංවර්ධන අරමුදලට බැර කරනු ලැබේ.

ජෛව පද්ධති තාක්ෂණ සිසුන්ගේ හා ඉංජිනේරු තාක්ෂණ සිසුන්ගේ 15/16 කණ්ඩායම් ඔස්සේ තෙවන වසර පළමු වර්ෂාර්ධය සම්පූර්ණ කොට කාර්මික පුහුණුවට යොමු වී සිටි. මෙය තාක්ෂණික පීඨ සිසුන් කාර්මික පුහුණුවට යොමු කළ පළමු අවස්ථාව වන අතර සියළුම සිසුන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රයේ කීර්තිමත් සමාගම් වල කාර්මික පුහුණුව ලැබීමට අවස්ථා හිමි විය. 15/16 තොරතුරු සන්නිවේදන තාක්ෂණ සිසුන් තෙවන වසර 2 වන වර්ෂාර්ධය සම්පූර්ණ කොට ඔවුන්ගේ අවසාන වර්ෂාර්ධ 2 සඳහා යොමු විය. සිසුන් 275 කින් සමන්විත වන සිසු කණ්ඩායම් (18/19 කණ්ඩායම්) පීඨයට ඇතුළත් කරගන්නා ලදී. ඒ සමඟ පීඨයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1065 දක්වා වැඩි විය. පීඨයට නවක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා ආධුනික කථිකාචාර්ය වරුන් සය දෙනෙකු බඳවා ගැනීමත් සමඟ වාර්ථාවන අධ්‍යන කාර්ය මණ්ඩල 29කි. ජෛව සැකසුම් තාක්ෂණ අධ්‍යනාංශය විසින් පර්යේෂණ ප්‍රදානයන් 3ක් වසර තුළදී ලබා ගන්නා ලදී.

1) ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සියේ සම්බන්ධීකරණ පර්යේක්ෂණ ආධාර යටතේ රුපියල් 2020007 (යුරෝ 5400) (2022-2023) "ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු වගා කෙරෙන හුදකලා ප්‍රදේශය තුළ වඳ කෘමි තාක්ෂණය ඒකාබද්ධ කිරීම මඟින් කොමඩු වැඩසටහන් ග්‍රහණය වර්ධනය කිරීම.''

2) ලෝක සෞඛ්‍ය සංවිධානයේ සංවර්ධන අයිතිවාසිකම් පැවරීම ජාත්‍යන්තර ප්‍රදාන 2019 (ඇමරිකානු ඩොලර් 5650) "ජංගම දෛනික නිරීක්ෂණ ඒකකයක් ආරම්භ කිරීම සහ ශ්‍රී ලංකාවේ මැදවච්චිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කලාපය තුළ Leishmaniasis (පරපෝෂිත රෝග) දෛනික නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම."

3) ආසියානු සංවර්ධන බැංකුවේ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය - ධාරිතා සංවර්ධනය, පර්යේෂණ සහයෝගීතාවයන්, නවෝත්පාදන සහ දැකුම්කළු කෘෂිකර්මයේ ගං පහළ යෙදවුම් සඳහා ඇමරිකාවේ මිඩ්ගැන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවය වර්ධනය කිරීමේ යෝජනාව.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජෛව සැකසුම් තාක්ෂණ අධ්‍යනාංශය හා පිලිපීනයේ සංවර්ධන අයිතිවාසිකම් පැවරීමේ ආසියානු ගෝලීය එකමුතුවට ඒකාබද්ධව "උපදේශන සහයෝගීතා" සම්මන්ත්‍රණයක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වුණි. ආචාර්ය ටී. සී. බමුණු ආරච්චිගේ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජෛව තාක්ෂණ සැකසුම් අධ්‍යනාංශය, තාක්ෂණ පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය), මහාචාර්ය ජෝෂප් ෂංකර් (සහායක මහාචාර්ය, චැපල් හිල් හි උතුරු කැරොලිනා විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ සන්හර්ෂණ හා නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳව ලන්ඩන් පාසල) සහ මහාචාර්ය ප්‍රදීප බණ්ඩාරනායක (අධ්‍යක්ෂක, කෘෂිකර්මික ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම පීඨය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව) යන අය සම්මන්ත්‍රණයේ ප්‍රධාන කථිකයෝ විය. මේ සඳහා රටවල් 34ක් නියෝජනයෙන් 589 දෙනෙකු හා තත්වාය නියෝජන 3ක් සහභාගි විය. හල්පිරියාව, බංගලාදේශය, බෙල්ජියම, භූතානය, බූර්තිනෝ ෆාසෙන්, තැවරන්, චීනය, කොලොම්බියාව, ඉතියෝපියාව, ෆාරෝදූපත්, ප්‍රංශය, ජර්මනය, ඝානාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, කෙන්යාව, මැඩගස්කරය, වලාවි, මාලදිවයින, මියන්මාරය, නේපාලය, නෙදර්ලන්තය, නයිජීරියාව, පකිස්ථානය, පැපුවිනිව්ගිනියාව, ශ්‍රී ලංකාව, ස්විස්ටර්ලන්තය, තායිලන්තය, උගන්ඩාව, එක්සත් රාජධානිය, ඇවරිනා එක්සත් ජනපදය, සහ සම්මන්ත්‍රණයේ සාමාජික රටවල් විය. ආධුනික දේශන කිහිපයක් අධ්‍යනාංශ සිසුන් විසින් පවත්වන ලදී. වර්ෂ 2020දී ජෛව තාක්ෂණ අධ්‍යනාංශය විසින් පර්යේෂණ ලිපි 7ක් සම සමාලෝචන ජර්නල වල ප්‍රකාශයට පත් කරන ලදී. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාන විද්‍යාව, ජෛව උත්ප්‍රේරක විනාශ පද්ධතිය, රැගෙන යා හැකි pid 450 මීටර කට්ටලය, ක්ෂුද්‍ර තරංග උඳුන, හොලවන බිත්තර රක්නය, Sl 500 සහ හෙලවෙන බිජු රක්නය Sl 600 යන ප්‍රධාන උපකරණ මිලදී ගැනීම. විදුලි හා ඉලෙක්ට්‍රොනික අධ්‍යනාංශය මඟින් වසරේ මුල් මාස තුන තුළදී විදුලි හා බලශක්තිය, ඉලෙකට්‍රොනික, විදුලි සංදේශ හා ස්වයංක්‍රියකරණය සම්බන්ධ විද්‍යාගාර තුළ සිදුකෙරෙන අධ්‍යන කටයුතු වලින් 80%ක් පමණ ආවරණය කරන ලදී. එමෙන්ම

මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පළමු වසරේ පළමු වර්ෂාර්ධයට, දෙවන වසරේ පළමු වර්ෂාර්ධයට සහ තෙවන වසරේ පළමු වර්ෂාර්ධයට අදාළ අධ්‍යන කටයුතුද සාර්ථකව සම්පූර්ණ කොට තිබේ. විෂය මාලා සමාලෝචන ක්‍රියාවලිය සඳහා උපදේශනයන් බඳවාගැනීමේ ක්‍රියාවලිය ආසියානු සංවර්ධන බැංකුවේ සහය ඇතිව ආරම්භ කරන ලදී. ඉන්දියාවේ පැවැත්වූ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවන්ගේ ආයතන සම්මන්ත්‍රණයේදී එක් පත්‍රිකාවක් ප්‍රකාශයට පත්කිරීමද සිදුකෙරිණි. විදුලි හා ඉලෙක්ට්‍රොනික අධ්‍යනාංශ ජර්මනියේ ට්‍රයර් ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය සමඟ "සංචාර විශ්වවිද්‍යාලය" නමින් වැඩසටහන්ද සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනේදී රටවල් 10 කට වැඩි ප්‍රමාණයක විදේශීය සිසුන් 20ක් පමණ දේශීය කර්මාන්ත අතර හරිත තාක්ෂණය සහ ශූන්‍ය විමෝචන සංකල්ප ප්‍රවර්ධනය කිරීම. සඳහා දේශීය සිසුන් 20ක් සමඟ කටයුතු කළහ. ආසියානු සංවර්ධන බැංකුව විසින් විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මේ සඳහා අරමුදල් සපයන ලදී.

ආහාර තාක්ෂණ දෙපාර්තුමෙන්තුව විසින් විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන උපකරණ කිහිපයක් මිලදී ගන්නා ලදී. ස්වාභාව විශ්ලේෂණය, පරාවර්තක මානය, විස්කොමීටරය, ජල ක්‍රියාකරණ මීටරය, ඖෂධ ගබඩාකරන ශීතකරණය, අධි ශීතකරණය හා වෝටෙක්ස් යන්ත්‍රය ඒ අතර විය. වර්ෂ 2020 දී ආහාර තාක්ෂණ අධ්‍යනාංශය විසින් ලිපි 3 ක් ප්‍රකාශයට පත් කරන ලදී. තොරතුරු සංනිවේදන තාක්ෂණ අධ්‍යනාංශය වර්ෂ 2020 තුළදී විවිධ අංශවල සාර්ථකත්වයන් අත්කරගන්නා ලදී. විශේෂයෙන් නව උපකරණ ලබා ගැනීම දැක්විය හැකිය. ප්‍රායෝගික පන්ති සඳහා අත්‍යවශ්‍ය මෙන්ම තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශ විද්‍යාගාරයේ සංවර්ධනයට අවශ්‍ය ඉහත මට්ටමේ වැඩපොළවල්, ලැප්ටොප් පරිගණක හා ප්‍රධාන පරිගණක අධ්‍යනාංශයට ලැබී ඇත. නව අන්තර්ජාල හා සබැඳි උපකරණ සිසුන්ගේ ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික වෙනස්කම් අනුව සිසුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට උපකාරී වේ. එසේම සිසුන්ගේ දැනුම් මට්ටම ඉහළ නැංවීම සඳහා අධ්‍යනාංශ මඟින් වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. එම වැඩමුළු අතර නෝර්වේ ආචාර්ය උපාධි අපේක්ෂයකුගේ සම්පත් දායකත්වයෙන් "කෘතීම බුද්ධිය" යන මාතෘකාව යටතේ වැඩමුළුවක්ද, දේශීය කර්මාන්තයක සම්පත් දායකත්වයෙන් "තත්ව සහතිකය" පිළිබඳව වැඩමුළුවක්ද විය. සිසුන්ගේ නිර්මාණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යනාංශය සඳහා ප්‍රධාන මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගත් අතර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යනාංශය, ඇට්ලස් ඇත්සිලියා පුද්ගලික සමාගම සමඟ කාර්මික හවුල්කාරිත්වයක් ඇතිව ස්වාභාවිකව ලබාගත හැකි දේශීය අමුද්‍රව්‍ය වලින් ත්‍රොයොන්ස් සහ දිය පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියෙන් රුපියල් මිලියන 10 ක ප්‍රදානයක් ලබා ගන්නා ලදී. එමෙන්ම ආධුනික කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට ඔස්ට්‍රේලියාව හා කොරියාව යන රටවල ඔවුන්ගේ පශ්චාත් උපාධි හැදෑරීමට අරමුදල් ප්‍රදානය කිරීමද විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුවිය.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

අධ්‍යන හා අනධ්‍යන කාර්ය මණ්ඩල හිඟය නිසා 2020 වර්ෂය තුළ අසමාර්ථයන් කිහිපයක් සිදුවිය.ඉන් කිහිපයක් පහත පරිදි වේ.

- ඒදිනෙදා රාජකාරිවල අපහසුතා ඇතිවීම.
- සම්පත් කළමනාකරණයේ දුර්වලතා.
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් නිසි වෙලාවට සිදු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හිඟකම.
- අධ්‍යන කාර්ය මණ්ඩලයේ ඔවුන්ගේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් අධ්‍යන කටයුතු වලට නොව පරිපාලන හා අනධ්‍යන ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට සිදුවීම.
- කොවිඩ් 19 වසංගත තත්වයන් සමඟ ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විභාග වල ප්‍රමාද වීම.

අළුතින් ස්ථාපිත පීඨයක් බැවින් වර්තමානයේ සිටින කාර්ය මණ්ඩලයට වැඩ ප්‍රමාණය කළමනාකරණය කරගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම, රසායනාගාර හිඟතාව හා කාර්යාල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා පහත දැක්වෙන අසමාර්ථයන්ට මුහුණ දීමට සිදුවිය.

- කථිකාචාර්යවරුන් සඳහා විධිමත් වැඩ සටහන් හිඟකම.
- අනෙක් පීඨයන් සමඟ දේශන ශාලා කාල සටහන් ගැටළු නිසා සමහර දේශන අවසන් මොහොතේ අවලංගු කිරීමට සිදුවිය.
- අපේක්ෂිත කාර්ය මණ්ඩලය අනුමත නොකළ නිසා වර්තමාන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ වැඩ ප්‍රමාණය ඉහළ යාම. ඒ සංඛ්‍යාව වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවත් සමඟ තිබෙන පහසුකම් වලින් කටයුතු කිරීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.
- මිහින්තලේ පරිශ්‍රය තුළ ඇති ශිෂ්‍ය නේවාසිකාගාර පිරියාමත් සමඟ සොයන පහසුකම් සැපයීම විශාල ගැටළුවක් වී තිබේ.

- ආපනශාලා පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා සිසුන්ට ඔවුන්ගේ ආහාර අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට දිගු පේළිවල වැඩි කාලයක් රැඳි සිටීමට සිදුවීම සහ අධ්‍යන ක්‍රියාකාරකම් ප්‍රමාද වීමද සිදුවිය.

ඈ. අනාගත දැක්ම

- යටිතල පහසුකම් සංවර්ධනය.
  - ගොඩනැගිලි ඉදිකිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදානත්වයෙන් ක්‍රියාත්මක අදියර II සහ අදියර II හි වැඩපෙලෙ සහ නියමු බලාගාර කටයුතු වර්ෂ 2021 මාර්තු මස අවසන් කිරීමට සැලසුම් කොට තිබේ. ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයන්ගෙන් ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු වර්ෂ 2021 ඔක්තොම්බර් මස ආරම්භ කිරීමට නියමිතය.
- විෂය මාලා සංවර්ධනය
  - සියළු අධ්‍යනාංශයකටම අදාළ විෂය මාලා සංවර්ධන කටයුතු වර්ෂ 2021 තුළ සම්පූර්ණ කිරීම.
  - සියළුම උපාධි වැඩසටහන්වල ප්‍රතිපාදන කටයුතු වර්ෂ 2021 මැද භාගය වන විට ආරම්භ කිරීම.
  - ව්‍යාපාර සඳහා පහසුකම් සලසන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.
  - වාර්ෂික පාර්ශවකරුවන්ගේ රැස්වීම් හා කාර්මික උපදේශන කමිටු රැස්වීම් පැවැත්වීම.
- මානව සම්පත් සංවර්ධනය.
  - තාක්ෂණික උපාධි වැඩසටහන් සඳහා අදාළ විෂය ක්ෂේත්‍රයන්හි විශේෂිත දැනුමක් ඇති පුද්ගලයින් පීඨයට බඳවා ගැනීම.
  - ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහයෙන් ආධුනික කථිකාචාර්යවරුන් ඔවුන්ගේ පශ්චාත් උපාධි පුහුණු සඳහා යොමු කිරීම.
  - පවතින නවීන තාක්ෂණයන් පිළිබඳ වැඩමුළු පැවැත්වීම හා අධ්‍යන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා විදෙස් විශේෂඥයින්ට ආරාධනා කිරීම.

23. පුස්තකාල පද්ධතිය

අ. හැඳින්වීම

වර්ෂ 1945 නොවැම්බර් මස 7 වන දින නිකුත් කරන ලද අංක 896/2 දරණ ගැසට් නිවේදනයේ හා වර්ෂ 1978 අගෝස්තු මස 16 වන දින නිකුත් කරණ ලද විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන අනුව මධ්‍යම, වයඹ හා උතුරු මැද පළාත්වල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාල වල සම්පත් ඒකාබද්ධ කිරීමෙන් වර්ෂ 1996 ජනවාරි 31 වන දින ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ස්ථාපනය කරන ලදි. වර්ෂ 1996 සැප්තැම්බර් මස 2 වන දින දින ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ආරම්භ කරන ලදි. මහාචාර්ය පියදාස රණසිංහ (1996-1998) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ පුස්තකාලයාධිකාරී වූ අතර අනතුරුව කලේ ජයලාල් සිරිසේන හා ගාමිණී සිල්වා යන මහත්වරුන් වර්ෂ 1999 සිට 2007 දක්වාද හේමා විජේතුංග මහත්මිය (සප්ත වාර්ෂික නිවාඩු සථානගත කිරීමක් ලෙස) වර්ෂ 2007 සිට 2009 දක්වාද පුස්තකාලයාධිකාරී තනතුර හොබවන ලදි. වර්ෂ 20009 සිට මේ දක්වා පුස්තකාලයාධිකාරී තනතුර හොබවන ලද්දේ ඒ. එස්. සිරිවර්ධන මහත්මියයි.

පුස්තකාල පැතිකඩ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය හදවත බදු වූ පුස්තකාලය මඟින් දැනුම එක්රැස් කිරීම, සංවිධානය කිරීම හා බෙදා හැරීම පුළුල්ව සිදු කරනු ලැබේ. මූලික උපාධි අපේක්ෂකයන්, පශ්චාත් උපාධි අපේක්ෂකයන්, අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන්, විධායක හා අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්වවිද්‍යාලය තුල පුස්තකාල සේවාව ලබන පරිශීලිකයින්ට අයත්වේ. මීට අමතරව කලාපයේ පරික්ෂකයන් ඇතුළු විශ්වවිද්‍යාලයෙන් බාහිර ප්‍රජාවද පුස්තකාල සේවාවන් ලබා ගනී.

පීඨ පුස්තකාල

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය ප්‍රධාන පුස්තකාලයෙන් හා වෙන වෙන ස්ථාන වල පිහිටි පීඨ පුස්තකාල හතරකින් සමන්විතවේ. ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යාපීඨ පුස්තකාලය සහ තාක්ෂණ පීඨ පුස්තකාලය මිහින්තලේ පරිශ්‍රයේ පිහිටා ඇති අතර එමඟින් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය හා තාක්ෂණ පීඨය යන පීඨ සඳහා පුස්තකාල සේවාවක් සපයනු ලැබේ. කෘෂිකර්ම පීඨ පුස්තකාලය පුලියන්කුලමේ පිහිටා ඇති අතර වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය සාලියපුර පිහිටා තිබේ. සායනික පුස්තකාලය අනුරාධපුර ශීක්ෂණ රෝහලේ පිහිටා තිබේ.

පුස්තකාල කාර්ය මණ්ඩලය

වර්ථමානයේ පුස්තකාල කාර්ය මණ්ඩලය අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් 7කින්, පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයකු, පුස්තකාල අධ්‍යන සහයක කාර්ය මණ්ඩල සමාජිකයකු සහ අනෙකුත් වෘතිකයින් සහ සහයක කාර්ය මණ්ඩල සාමාජිකයින් 25කින් සමන්විත වේ

පුස්තකාල එකතුව

ප්‍රධාන පුස්තකාල එකතුව මුද්‍රිත ග්‍රන්ථ, ජර්නල, සඟරා, පුවත්පත්, රාජ්‍ය ලියකියවිලි, විශේෂ එකතුවන්, විමර්ෂණ ග්‍රන්ථ සම්භාරය, පසුගිය ව්‍යාපෘති වාර්තා, නිබන්ධන, පසුගිය ප්‍රශ්ණ පත්‍ර, හා විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශණ වලින් සමන්විත වේ. මේ සියල්ලන්ම විශය මාලාවන්ට අනුකූලව ප්‍රකාශන් වේ. තවද මේවා විද්‍යුත් හා මුද්‍රිත යන මාධ්‍ය දෙකෙන්ම දැකිය හැක.

පුස්තකාලය මඟින් මාර්ගගත ජර්නල් එකතුවන් පරිශීලනයට කොන්සාල් මාර්ගයෙන් අවස්ථා සලසන අතර එම ජර්නල වෛද්‍ය, කෘෂිකර්ම, ව්‍යහාරික විද්‍යා, සමාජ විද්‍යා, පරිගණක විද්‍යා හා කළමණාකරන යන ක්ෂේත්‍රයන්ට අදාළ ඒවා වේ.වර්තමාන බොහෝ සඟරාවලට පුස්තකාලය දායක වන අතර වර්තමානයේ බොහෝ සඟරා වලට පුස්තකාලය දායක වන අතර මේවා වර්තමාණ ප්‍රවණතා සමග නව දැනුම පවත්වාගෙන යාමට පරිශීලකයින්ට බොහෝ උපකාරීවේ. මෙම පොත් එකතුව රජරට විශ්ව විද්‍යාලයේ පීඨ අතර ප්‍රධාන සඳහා ප්‍රයෝජනවත් වන අතර විවිධ විශයන් හා සාමාන්‍ය දැනුමෙන් පෙළ පොත් වලින් සමන්විත වේ.

ප්‍රධාන පුස්තකාලය	ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලය	කෘෂිවිද්‍යා පීඨ පුස්තකාලය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය	තාක්ෂණ පීඨ පුස්තකාලය	එකතුව
83120	14036	15132	10601	1622	124511

වගුව 01 : 2020.12.31 වන විට පුස්තකාල සතු ග්‍රන්ථ (පිටපත්) සංඛ්‍යාව

වර්තමානයේ පවතින විද්‍යුත් සම්පත් සහ දත්ත සමුදායන්

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුග්‍රහය දක්වන කොන්සාල් (ශ්‍රී ලංකාවේ අධ්‍යන පුස්තකාලවල එකතුව) තුලින් ප්‍රවේශ විය හැකි දත්ත සමුදායන්. ඒවා නම් එමරල්ඩ් දත්ත සමුදාය, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාල දත්ත සමුදාය, ජීවිතයට පර්යේක්ෂණ හිනාරි, ආර්ඩි, ඔඒආර්ඉ,ගෝලි, ඇගෝරා

පුස්තකාලයෙන් සැපයෙන ප්‍රධාන සේවාවන්

පුස්තකාලයේ සැපයෙන ප්‍රධාන සේවාවන් අතර ට පොත් බැහැර දීමේ සේවාව, පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සහ පුස්තකාල අතර හුවමාරු කිරීමේ ක්‍රමවේදය, වත්මන් දැනුවත් කිරීමේ වැඩසටහන් , තොරතුරු සාක්ෂරතා වැඩසටහන්, පරිශීලක අධ්‍යාපන වැඩසටහන්, වැඩමුළු සහ පුස්තකාල වෙබ් අඩවියේ නඩත්තු කටයුතු අයත්වේ. මීට අමතරව පුස්තකාල වෙබ් අඩවිය ඔස්සේ විවිධ තොරතුරු සේවාවන් වෙත ප්‍රවේශ ලබා දීම ද සිදු වේ. පුස්තකාල ග්‍රන්ථ එකතුව සඳහා ප්‍රවේශ වීමට මාර්ගත පොදු ප්‍රවේශන සුචිය ඔස්සේ පහසුකම් සලසා ඇත. විශ්වවිද්‍යාලයීය ආයතනික පර්යේෂණ වාර්ථා එකතුව නඩත්තු කරනු ලබන්නේ ද පුස්තකාලය විසිනි. පරිශීලකයන්ට අන්තර්ජාලය ඔස්සේ මාර්ගගත පසුගිය ප්‍රශ්ණ පත්‍ර සඳහා ප්‍රවේශ විය හැක. පුස්තකාලය මගින් උතුරු මැද පළාත් බාහිර ප්‍රජාව සඳහාද පහසුකම් සලසනු ලැබේ (පාසල් සහ පොදු පුස්තකාල ගොඩනැගිලි කාර්‍යක්ෂම ලෙස ප්‍රතිසැකසුම් කිරීම, පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහන්, පාසල් සහ පොදු පුස්තකාල කාර්‍ය මණ්ඩල පුහුණු කිරීම් ආදී).

• වර්ෂ 2019-12-31 වන විට පුස්තකාල සාමාජිකයින්

	ප්‍රධාන පුස්තකාලය	ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලය	කෘෂිවිද්‍යා පීඨ පුස්තකාලය	වෛද්‍ය විද්‍යා පීඨ පුස්තකාලය	තාක්ෂණ පීඨ පුස්තකාලය	එකතුව
උපාධි අපේක්ෂකයින්	6115	1418	1028	1631	739	10931
පශ්චාත් උපාධි	00	00	00	00	00	00
අධ්‍යන කාර්ය මණ්ඩලය	382	107	78	47	06	620
තාවකාලික අධ්‍යන කාර්ය මණ්ඩලය	37	59	48	00	13	157
පරිපාලන කාර්ය මණ්ඩලය	21	01	04	06	00	32
අනධ්‍යන කාර්ය මණ්ඩලය	406	27	58	54	03	548

වගුව -2 - 2020.12.31 දිනට පුස්තකාලයේ සාමාජිකත්වය

• ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල පහසුකම් සැපයීම

පුස්තකාලයේ පැවති දත්ත සමුදාය කළමණාකරන පද්ධතිය මේ වන විට ‘‘කෝහා’’ විවෘත මෘදුකාංගය භාවිතයට පරිවර්තනය කර ඇත. ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයීය පුස්තකාලය පද්ධතිය ‘‘කෝහා’’ භාවිතයෙන් සම්පත් සංසරණය, ඇණවුම් කිරීම, අයවැය ප්‍රවේශය, සංඛ්‍යාලේඛණ සහ යෝජනා ලබා ගැනීම සිදුකරයි. එසේම පරිශීලකයින්ට පුස්තකාල නාමාවලි මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පිරික්සීම සඳහාද ‘‘කෝහා’’ මෘදුකාංගය භාවිතා කරයි. පුස්තකාල පරිශීලක ප්‍රජාව සඳහා මාර්ගගත ක්‍රමවේද ඔස්සේ දුරස්ථ ප්‍රවේශයන් ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.

• ආයතනික පර්යේක්ෂණ වාර්තා සමුදාය

ආයතනික පර්යේක්ෂණ වාර්තා සමුදාය යනු ආයතනයේ පර්යේෂණ ප්‍රතිඵල/ නිමැවුම් වාර්තා වල මාර්ගගත එකතුවකි. ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ පර්යේෂණ නිමැවුමේ සඳහා ප්‍රවේශතාව සහ ඒවායේ දෘශ්‍යතාව ඉහළ නැංවීමටත්, උපුටා දැක්වීමේ අනුපාත වැඩි කිරීම මගින් විශ්ව විද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම ඉහළට ගෙන ඒමටත් මෙම ගබඩාව ඉතා වැදගත්වේ. වර්තමානයේ එහි ප්‍රකාශන (සාරාංශ සහ සම්පූර්ණ පර්යේක්ෂණ වාර්තා) 2250 කට වඩා ඇත.

- **පසුගිය ප්‍රශ්ණ පත්‍ර සඳහා ඉන්ට්‍රානෙට් පිවිසුම් පහසුකම්**

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන අභ්‍යන්තර විභාග වල පසුගිය ප්‍රශ්නපත්‍ර පරිගණකගත කොට ඉන්ට්‍රානෙට් ඔස්සේ පාඨකයන්ට බාගත කර ගැනීමට හැකියාව ලබා දී ඇත. එම නිසා පාඨකයන්ගේ අවශ්‍යතාවය මත පසුගිය ප්‍රශ්ණ පත්‍ර සඳහා ප්‍රවේශ වීමට මෙන්ම හුවමාරු කර ගැනීමටද අවස්ථාව සැලසේ.

- **තෝරාගත් තොරතුරු සේවාව සහ පර්යේෂණ පහසුකම් සැපයීම**

තෝරාගත් තොරතුරු සේවාව භාවිතා කරමින් පරිශීලකයින්ට ඔවුන්ගේ නිශ්චිත තොරතුරු අවශ්‍යතා සඳහා තොරතුරු රිසිකරණය කළ හැකිය. වර්තමාන දැනුවත් කිරීමේ සේවාවන් නව මාතෘකා සහ ඔවුන්ගේ නිශ්චිත පර්යේක්ෂණ අවශ්‍යතා සඳහා තොරතුරු විද්‍යුත් තැපෑලෙන්, වාචිකව සහ දැන්වීම් මගින් දැනුම් දෙනු ඇත. පුස්තකාලය පරිශීලකයින්ට ඔවුන්ගේ පර්යේක්ෂණ කටයුතු සිදු කිරීමට සහ ඔවුන්ගේ පර්යේක්ෂණ කටයුතු සහ අඛණ්ඩ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑලෙන් සහ වෙනත් ක්‍රම මගින් ලබා දීමට සහය වේ.

- **ශ්‍රව්‍ය හා දෘශ්‍ය සම්පත් සේවාව සහ වයි-ෆයි ප්‍රවේශයන්**

විද්‍යුත් පහසුකම් සැපයීමේ ඒකකය මගින් පරිශීලකයන්හට ඉලෙක්ට්‍රොණික දත්ත සමුදායන් වෙත පිවිසිම, අන්තර්ජාල පහසුකම් සහ සංයුක්ත තැටි වැනි සේවාවන් සපයනු ලබයි. මෙම ඒකක යසතුව පරිගණක යන්ත්‍ර කිහිපයක් පවතින අතර පරිශීලකයන්ට තොරතුරු සෙවීම, බාගත කිරීම සහ හුවමාරු කර ගැනීම සිදු කල හැකිය. එමෙන්ම ඔවුන්ට නොමිලේ ශාස්ත්‍රීය සම්පූර්ණ ප්‍රකාශණ වාර්තා වලට පිවිසීමේ හැකියාවද ලැබේ. මෙම ඒකකය මගින් පුස්තකාලය සතු සියලුම ඉලෙක්ට්‍රෝණික මූලාශ්‍ර සඳහා පහසුවෙන් පිවිසිය හැක. මෙම ඒකකය වයි-ෆයි පරිශීලන කළාපයකින් සමන්විත වන අතර සිසුන්ගේ පුද්ගලික ලැප්ටොප් පරිගණක, අයිපෑඩ්, ස්මාර්ට් දුරකතන වැනි උපාංග භාවිතයෙන් ඉලෙක්ට්‍රෝණික තොරතුරු සඳහා පිවිසිය හැක.

ඡායා පිටපත් කිරීමේ පහසුකම් (පුද්ගලික)

පුස්තකාලය පරිශීලකයින්ට ඡායා පිටපත් ලබා ගැනීමේ පහසුකම් සලසනු ලැබේ. පර්යේෂණ වාර්තා හැර සෙසු තොරතුරු පාඨකයන් හට ඡායා පිටපත් ලබා ගත හැකිය. පොත්පත් ස්කෑන් කිරීමේ සහ පොත් බැඳීමේ පහසුකම්ද මෙම ඒකකය මගින් සපයනු ලබයි.

පුවත්පත් ලිපි එකතු කිරීමේ සේවාව

පුස්තකාලය මගින් විෂයන් මාලාවක් සඳහා පුවත්පත් ලිපි එකතුවන් පවත්වාගෙන යනු ලැබේ. මෙම පුවත්පත් ලිපි ස්කෑන් කොට ඩිජිටල් ආකාරයට පරිවර්තනය කොට පවත්වාගෙන යෑමට පුස්තකාලය බලාපොරොත්තු වේ. එවිට දෛනික තොරතුරු සඳහා පිවිසිමට, බාගත කර ගැනීමට සහ හුවමාරු කර ගැනීමට පරිශීලකයින්ට පහසු වේ.

ආ. ජයග්‍රහණයන්

විශ්ව විද්‍යාලය තුල ක්‍රියාකාරකම්

පරිශීලකයන් දැනුවත් කිරීමේ වැඩසටහන

පරිශීලකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දහයක් සහ හඳුන්වාදීමේ සැසි රාශියක් පවත්වනු ලැබුණි. එමඟින් සියළුම පීඨ එනම් කළමණාකරණ අධ්‍යයන පීඨය, කෘෂිකාර්මික පීඨය, වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය හා තාක්ෂණ පීඨය යන සියලුම පීඨ සඳහා මෙම වැඩසටහන් සාර්ථකව පවත්වන ලදි.

- ප්‍රජා භාහිර වැඩසටහන්

පුස්තකාල ක්ෂේත්‍රයේ රාජ්‍ය වෘත්තිකයින්, පාසල් සහ පුද්ගලික පුස්තකාලයාධිපත්වරුන් අරමුණු කොට ගත් පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ වැඩමුළු හා සම්මන්ත්‍රණ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය මඟින් සංවිධානය කරනු ලැබේ. පුස්තකාල පද්ධතිය විසින් උතුරුමැද පළාත් ගැබිනි මව්වරුන්, රාජ්‍ය පුස්තකාලයාධිපති වරුන් සහ ගොවීන් සඳහා වැඩමුළු මාලා තුනක් පවත්වන ලදි. ''කියවීමේ කුසලතා සංවර්ධනය කර ගන්නේ කෙසේද'' , ''වෘත්තීමය සාරධර්ම'' සහ ''තොරතුරු ලබා දෙන්නේ කෙසේද'' යන මාතෘකා ඔස්සේ මෙම වැඩමුළු පවත්වන ලදි. බාහිර පරිශීලකයින් සඳහා පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීමද මෙම වසරේදි සිදු කෙරිණි.

කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්

විශ්වවිද්‍යාල පුස්තකාලාධිපතිවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද ''පුසුතකාල ක්‍රියා වලියහ ා පවත්වාගෙන යාම'' වැඩ මුළුව සඳහා පුස්තකාල සහයක වරුන් සහභාගි විය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සංවිධානය කරන ලද එස්.පී.එස්. එස් දත්ත විශ්ලේෂක කෙටි පාඨමාලාව සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරීන් දෙදෙනෙකු සහභාගි විය. එමෙන්ම කැළණි විශ්වවිද්‍යාලයෙ පුස්තකාලය මඟින් සංවිධානය කරන ලද ''පර්යේක්ෂණ ක්‍රම වේදය සහ සංඛ්‍යානය'' දෙදින වැඩමුළුව හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් පවත්වනු ලැබූ ''විද්‍යුත් රාජ්‍ය, සයිබර් ආරක්ෂණය හා සමාජ මාධ්‍ය'' වැඩමුළුව සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති වරුන් සහභාගි විය.

- දුරස්ථ ඉගෙනුම් සේවා

පුස්තකාල පද්ධතිය විශ්වවිදයාලයීය ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සමඟ සම්බන්ධ කරන ලදි. පුස්තකාලය මඟින් විද්වත් අන්තර්ගතයන්, පොත් පරිච්ඡේද, පසුගිය ප්‍රශ්ණ පත්‍ර සහ අනෙකුත් ග්‍රන්ථ නාමාවලි සඳහා ජංගම දුරකතන භාවිතයෙන් පරිශීලන අවස්තා සපයයි. පුස්තකාල වෙබ් අඩවියේ ඇති යොමුව වෙත පිවිසීමෙන් මෙම පහසුකමට පිවිසිය හැකිය.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

1) උපාධි අපේක්ෂකයින් සඳහා පුස්තකාල පරිශීලනයට වෙන් කර ඇති කාලය ඔවුන්ගේ පුස්තකාල ක්‍රියාකරකම් සඳහා ප්‍රමානවත් නොවීම.
2) පුස්තකාල සේවා සඳහා අය වැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
3) කොවිඩ් 19 වසංගත තත්වය පුස්තකාලයේ එදිනෙදා කටයුතු කෙරෙහි සෘජු ලෙස බලපෑම.

ඈ. අනාගත දැක්ම

- පුස්තකාල පද්ධති යසඳහා ආරක්ෂක කැමරා පද්ධතියක් සවිකිරීම

පුස්තකාලය තුල ඇති සම්පත් සඳහා ඉහල ආරක්ෂාවක් සැපයීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති පරිශීලනයට පහසුම හා කාර්යක්ෂමම පුස්තකාලය බවට පත්වීම මෙහි ප්‍රධාන අරමුණයි.

- හරිත පුස්තකාල පරිසරය

පුස්තකාලය ඉලේක්ට්‍රොනික සම්පත් වල අන්තර්ගතය Greenstone විවෘත මූලාශ්‍ර මෘදුකාංග පරිසරයකට පරිවර්තනය කිරීමට සැලසුම් කරයි. එමඟින් පවතින තොරතුරු ඩිජිටල් ලේඛනාගාරයක් බවට පරිවර්තනය ආරම්භ කිරීමට සැලසුම් කරයි.

- රචනා චෞරත්වය පරීක්ෂා කිරීම

"Turnitin" රචනා චෞරත්ව පරීක්ෂා කිරිම් මෘදුකාංගය හදුන්වා දීමට පුස්තකාලය සැලසුම් කරයි. එහිදී සියළුම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා සේවා සැපයීමට බලාපොරොත්තු වේ.

- වසංගත කාලසීමාව හේතුවෙන් විද්‍යුත් සම්පත් මිලදී ගැනීමට සැලසුම් කිරීම
- සමාජ ජාල සමඟ සහයෝගි සේවා සැපයීමට සැලසුම් කිරීම.

24. ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව




අ. හැඳින්වීම

ශාරීරික අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් විශ්වවිද්‍යාලයේ සිසු ප්‍රජාවට පුළුල් පරාසයක විහිදුණු ක්‍රීඩා හා විනෝදාස්වාද වැඩ සටහන් සඳහා අවස්ථා සපයනු ලැබේ. ශාරීරික අධ්‍යාපන අංශයේ මූලික අරමුණ වනුයේ සිසුන්ගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම ඒකල හා කණ්ඩායම් ක්‍රීඩා සංවර්ධනය සඳහා අවස්ථා සලසා දෙමින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සිසුන් සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරී ජීවන රටාවක් හුරුපුරුදු කිරීමය.

ආ. ජයග්‍රහණයන්

ඉහත අරමුණු ලඟාකර ගැනීම සඳහා ශාරීරික අධ්‍යාපන අංශය මඟින් පහත ක්‍රියාකාරකම් හා වැඩ සටහන් 2020 වසර පුරා සංවිධානය කරන ලදි.

වර්ණ සම්මාන උළෙල - 2020

වර්ෂ 2018 සහ 2019 ජයග්‍රායකයින් සඳහා වූ වර්ණ ප්‍රදානෝත්සවය වර්ෂ 2020 පෙබරවාරි මස 19 වන දින ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය උපකුලපති ආචාර්ය බී. ඒ. කරුණාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර මෙම උත්සවයේදී කුසලතා සම්මාන 104ක් සහ වර්ණ 222ක් ප්‍රදානය කෙරිණි.











නවක සිසුන් සඳහා වන ශාරීරික අධ්‍යාපන වැඩසටහන් පීඨ මට්ටමින් වෙන් කරගන්නා ලද දින වලදි පැවැත්විණි. මෙම වැඩසටහන් නවක සිසුන් හට ශාරීරික අධ්‍යාපනයේ සහ ක්‍රීඩාවේ වැදගත් කම පිළිබඳ න්‍යායාත්මක දැණුමක් ලබාගත හැකි පරිදි සැලසුම් කොට තිබුණි. එම වැඩසටහන් වල තිබූ එළිමහන් ක්‍රියාකාරකම් සඳහා සහභාගිවුවන් වැඩි උනන්දුවක් දක්වන ලදි.

නවකයින් සඳහා වන අන්තර් පීඨ ක්‍රීඩා තරඟාවලිය වර්ෂ 2020 පෙබරවාරි මස පවත්වන ලද අතර තරඟ 13ක් ඒ සඳහා ඇතුලත් විය. පීඨ 6ම නියෝජනය කරමින් තරඟාවලි යසඳහා පළමු වසර සිසුන් (2017/2018) සහභාගි වූ අතර තරඟාවලියේ ශූරතාවය කළමනාකරණ අධ්‍යයන පීඨයට හිමිවිය.



විශ්වවිද්‍යාලයීය ප්‍රධානතම ක්‍රීඩා ඉසව්ව ලෙස සැලකෙන අන්තර් පීඨ ක්‍රීඩා තරඟාවලිය 2020 මාර්තු මාසයේදී ආරම්භ කරන ලදි. නමුත් කොරෝනා වයිරසය පැතිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලය සිසුන් සඳහා වසා දමනු ලැබූ නිසා තරඟාවලිය අවසන් කිරීමට නොහැකි විය.



පෙරියන් කුලම විජය සමාජය විසින් පෙබරවාරි මාසයේදී සංවිධානය කරන ලද ආරාධිත එල්ලේ තරඟා වලියට සහභාගි වූ විශ්වවිද්‍යාලයීය පිරිමි එල්ලේ කණ්ඩායම තරඟාවලියේ ශූරතාවය දිනා ගන්නා ලදි.

ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ක්‍රීඩා දිනය - 2020

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා හා සංස්කෘතික සංවිධානය විසින් විශ්වවිද්‍යාල ක්‍රීඩා දිනය 2016 වසරේ සිට නිල වශයෙන් ප්‍රකාශයට පත්කරන ලදි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය සහ කැලණිය විශ්වවිද්‍යාලය විසින් ප්‍රථම වරට ජාත්‍යන්තර විශ්වවිදාල ක්‍රීඩා දිනය ශ්‍රී ලංකාවේදි සැමරීම සඳහා උත්සවයක් වර්ෂ 2020 සැප්තැම්බර් මස 20 වන දින කැලණිය විශ්වවිද්‍යාලයේදී සංවිධානය කරන ලදි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා එන් ලියනගේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පැවැත්විණි. මේ සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ සාමාජික විශ්වවිද්‍යාල දාහතර නියෝජනයෙන් සාමාජිකයින් 300කට ආසන්න පිරිසක් සහභාගි වූ අතර ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයෙන් සාමාජිකයින් 9 දෙනෙකු සහභාගි විය.





ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- කොවිඩ් 19 තත්වය නිසා අන්තර් පීඨ ක්‍රීඩා තරඟාවලිය අවසන් කිරීමට නොහැකි විය.
- අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි, ආරධිත තරඟාවලි හෝ වෙනත් ක්‍රීඩා සංවිධානය කිරීමට නොහැකි විය.
- එසේම රජරට විශ්වවිද්‍යාලයේ සිසුන්හට වර්ෂ 2020දී අන්තර් විශ්වවිද්‍යාල, ජාතික හෝ ජාත්‍යන්තර තරඟාවලි සඳහා සහභාගි වීමට නොහැකි විය.

ඈ. අනාගත දැක්ම

- 2021 වසරේ අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි දෙකක් සංවිධානය කිරීමට බලාපොරොත්තු වේ.
- වර්ෂ 2021දී ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීමේ අදියර III සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

25. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

අ. හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවසරයෙන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 2005 වර්ෂයේ දී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය පිහිටුවන ලදි. උපකුලපති තුමාගේ සෘජු අධික්ෂණය යටතේ මෙම ඒකකය ක්‍රියාත්මක වේ. මෙම ඒකකය මිහින්තලේ විශ්වවිද්‍යාල ප්‍රධාන භූමි පරිශ්‍රයේ පිහිටා ඇති බැවින් පීඨවලට පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව ඇත. 100 දෙනෙකු පමණ පිරිසකට ඉඩ පහසුකම් සැලසීමේ හැකියාව ඇති තනි මහල් ගොඩනැගිල්ලක් ඒකකය සතු වේ. මෙම ඒකකයේ කටයුතු පහත සඳහන් අධ්‍යක්ෂක, වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකයන් හා පීඨ සම්බන්ධීකාරකයන් යටතේ හොඳින් ක්‍රියාත්මක වේ.

අධ්‍යක්ෂක

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණිය, ආචාර්ය එච්. ඕ. විජේවර්ධන

වෘත්තීය මාර්ගෝපදේශක

ඒ. මංගලිකා දිසානායක මහත්මිය – AS 2 (II)
ජේ. ඩී. රත්නායක මහතා – AS 2 (II)

වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක

ආචාර්ය එච්. ඕ විජේවර්දන	- ව්‍යවහාරික විද්‍යා පීඨය
ආචාර්ය බුද්ධික හෙට්ටිආරච්චි	- සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
සම්පත් දිසානායක මහතා	- කෘෂිවිද්‍යා පීඨය
ආචාර්ය ඩබ්. එම්. රෝහන වීරසුරිය	- කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය එච්. ඒ. නවීන්	- තාක්ෂණ පීඨය

කළමනාකරණ සහකාර
එම්. ජී. සුනන්දි ශ්‍රියාමාලා දිසානායක මහත්මිය - තුන්වන ශ්‍රේණිය

වැඩ සහයක
ඩබ්. ඩබ්. කේ ගයානි - තුන්වන ශ්‍රේණිය

ආ. ජයග්‍රහණයන්

01. තාක්ෂණ පීඨයේ නවක සිසුන් සඳහා නායකත්ව සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් තාක්ෂණ පීඨයේ නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහනක් මාර්තු මස 12 සහ 13 යන දිනයන් හී පෙ.ව 8.30 සිට ප.ව.4.30 දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී පවත්වන ලදි. මෙම වැඩමුළුව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශක වරුන් වන ජාලිය රත්නායක මහතා සහ මංගලිකා දිසානායක මහත්මිය විසින් පවත්වන ලදි.

02. කෘෂිකර්ම පීඨයේ සිසුන් සඳහා නායකත්ව සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් කෘෂිකර්ම පීඨයේ නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහනක් 2020 සැප්තැම්බර් මස 03වන දින පෙ.ව 8.30 සිට ප.ව.4.30 දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී පවත්වන ලදි. මෙම වැඩමුළුව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශක වරුන් වන ජාලිය රත්නායක මහතා සහ මංගලිකා දිසානායක මහත්මිය විසින් පවත්වන ලදි.

03. ව්‍යවසායකත්ව වැඩසටහන ''කර්මාන්තයේ ප්‍රවීනයක් සමඟ ආරම්භක මාර්ගගත සම්මන්ත්‍රන මාලාව''

ශී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් උපාධි අපේක්ෂකයින අතර ව්‍යවසායකත්ව දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් ''කර්මාන්තයේ ප්‍රවීනයන් සමඟ ආරම්භක මාර්ගගත සම්මන්ත්‍රණ මාලාව'' සාර්ථකව පවත්වන ලදි. මෙම වැඩ සටහන විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකයේ සහයෝගිතාවයෙන් වර්ස 2020 ඔක්තොම්බර් මස 3වන දින පෙ. ව. 8.00 සිට 10.00 දක්වා zoom තාක්ෂණය භාවිතයෙන් පවත්වන ලදි. මෙහි සම්පත් දායකයා වුයේ ක්‍රිස්ටල් ලයිෆ් සහ මයිකෝලා නාමයන් හි නිර්මාතෘ ආර්. එම්. සර්මා මහතා විසිනි.

04 ''කැණිමඩල'' වැඩමුළුව පැවැත්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් ආරක්ෂක නිලධාරීන්ගේ සුභසධක සංගමය සඳහා ''කැණිමඩල'' වැඩසටහන ජනවාරි මස 25වන දින ප.ව 02.00 සිට ප.ව.5.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ

ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි. මෙම වැඩමුළුව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශිකා මංගලිකා දිසානායක මහත්මිය විසින් පවත්වන ලදි.

05. ''ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යයන'' පිළිබඳ වැඩමුළුව

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් ''ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යයන'' මැයෙන් වැඩමුළුවක් සාර්ථකව පවත්වන ලදි. මෙම වැඩසටහන ප.ව. 01.00 සිට ප.ව 04.00 දක්වා වෘත්තීය මාර්ගෝපදේශන ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර වැඩසටහන ස්පෙක්ට්‍රම් විදෙස් අධ්‍යාපන Spectrum ආයතනය විසින් මෙහෙයවන ලදි.

06. ''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' පිළිබඳ වැඩසටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් ''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' වැඩසටහන වර්ෂ 2020 පෙබරවාරි මස 02 වන දින පෙ.ව 09.15 සිට ප.ව.12.30 දක්වා සොමාදේවි නේවාසිකාගාරයේ දී පවත්වන ලදි. මෙම වැඩමුළුව මංගලිකා දිසානායක මහත්මිය විසින් පවත්වන ලදි.

07. ''මෘදු කුසලතා සංවර්ධන '' වැඩසටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් 2020 පෙබරවාරි 21 වැනි දින පෙ.ව. 08.30 සිට දහවල් 12.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේදී ''මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන'' සාර්ථකව සංවිධානය කරන ලද අතර ශ්‍රී ලංකා, කොළඹ අයි.ඊ.එස්.ඊ.සී.සී සංගමයේ සාමාජිකයෙකු විසින් පවත්වන ලදි.

08. ''ඉගෙනීමේ කුසලතා'' පිළිබඳ වැඩසටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් කෘෂිකර්ම පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා ''ඉගෙනීමේ කුසලකතා'' වැඩසටහන 2020 ඔක්තොම්බර් මස 05 වන දින ප.ව. 02.00 සිට 04.30 දක්වා පීඨ දේශන ශාලාවේදී සාර්ථකව පවත්වන ලද අතර මෙම වැඩසටහන වෘතීය මාර්ගෝපදේශන ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේහක ජාලිය රත්නායක මහතා විසින් මෙහෙයවන ලදි.

01. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සාරාංශය (2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා)

පීඨය/අදාල කණ්ඩායම	වැඩසටහනේ නම	දිනය	සහභාගි වූ සංඛ්‍යාව	සටහන
2020-01-01 සිට 2020-01-31 දක්වා				
ව්‍යවහාරික විද්‍යා පීඨය	''අථත්‍යකරණ සම්මන්ත්‍රණයේ වෘත්තීය අවස්ථා'' පිළිබඳ වැඩමුළුව	03/01/2020	208	වැඩසටහන පෙ.ව. 09.00 සිට ප.ව. 04.00 දක්වා පීඨ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර වැඩසටහන පවත්වනු ලැබුවේ Laing O'Rourke.විසිනි.
කළමනාකරණ අධ්‍යයන පීඨය	''ඔබේ උපාධියෙන් ඔබ්බට'' වැඩමුළුව	08/01/2020	133	වැඩසටහන පෙ.ව. 08.00 සිට ප.ව. 04.00 දක්වා පීඨ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර වැඩසටහන මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා ගුවන් සමාගමේ කළමනාකර/අලෙවිකරණ සුමිත් ද සිල්වා මහතා විසිනි.
කළමනාකරණ අධ්‍යයන පීඨය	පීවදත්ත පත්‍රිකා සැකසීම සහ සම්මුඛ පරීක්ෂණ වලට මුහුණ දීම පිළිබඳ වැඩමුළුව	21/01/2020	42	වැඩසටහන පෙ.ව. 08.30 සිට පෙ.ව. 11.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර වැඩසටහන මෙහෙය වනු ලැබුවේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක ජාලිය රත්නායක මහතා විසිනි.
ආරක්ෂක නිළධාරීන්ගේ සුභසාධන සංගමය සඳහා	''කැණිමඩල'' වැඩ මුළුව	25/01/2020	33	වැඩසටහන ප.ව. 02030 සිට ප.ව. 05.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර වැඩසටහන පවත්වනු ලැබුවේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ වෘත්තීය

				මාර්ගෝපදේශක ඒ. එම්. දිසානායක මහත්මිය විසිනි විසිනි.
සියළුම පීඨයන්	''ඔස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය'' පිළිබඳ වැඩ මුළුව	28/01/2020	81	වැඩසටහන ප.ව. 1.00 සිට ප.ව. 04.00 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර වැඩසටහන ස්පෙක්ට්‍රම් විදේශීය අධ්‍යාපන ආයතනය විසින් මෙහෙයවන ලදි.
2020-02-01 සිට 2020-02-28 දක්වා				
සියළුම පීඨයන්	''මහජන කතා සමාජය'' වැඩමුළුව	10/02/2020	29	මෙම වැඩසටහන ප.ව. 04.30 සිට ප.ව. 06.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.
ව්‍යවහාරික විද්‍යා පීඨය	''ඇදුම් පැළඳුම් සහ ආහාර ගැනීමේ ආචාර විධි'' පිළිබඳ වැඩමුළුව	12/02/2020	35	මෙම වැඩසටහන පෙ.ව. 08.30 සිට ප.ව. 06.30 දක්වා අනුරාධපුර ඇවසිටි හෝටලයේ දී පවත්වන ලදි.
නව සෝමාදේවි නේවාසිකාගාරය	''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' පිළිබඳ වැඩසටහන	13/02/2020	105	මෙම වැඩසටහන පෙ.ව. 09.15 සිට ප.ව. 12.30 දක්වා නව සෝමාදේවි නේවාසිකාගාරයේ පවත්වන ලදි.
	එළිමහන් වැඩසටහන් සඳහා පළමු තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම.	18/02/2020	05	වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ රැස්වීම ප.ව. 12.00 සිට ප.ව.1.00 දක්වා පවත්වන ලදි.
සියළුම පීඨයන්	''මහජන කතා සමාජය'' වැඩමුළුව	18/02/2020	51	මෙම වැඩසටහන ප.ව. 04.30 සිට ප.ව. 07.00 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.
කළමනාකරණ අධ්‍යයන පීඨය	''සමබර වැඩ ජීවිතයක්'' මැයෙන් වැඩසටහන	19/02/2020		මෙම වැඩසටහන පෙ.ව. 08.30 සිට පෙ.ව. 10.30 දක්වා පීඨ දේශන ශාලාවේ දී පවත්වන ලදි.
සියළුම පීඨයන්	''මෘදු කුසලතා සංවර්ධන'' වැඩසටහන	21/02/2020	30	මෙම වැඩසටහන පෙ.ව. 08.30 සිට ප.ව. 12.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි. වැඩසටහන මෙහෙයවනු ලැබුබේ ශ්‍රී ලංකා අයි.ඊ.එස්.ඊ.සී. විසිනි.
	එළිමහන් වැඩසටහන් සඳහා දෙවන තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම.	25/02/2020	05	වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ රැස්වීම ප.ව. 01.30 සිට ප.ව.2.30 දක්වා පවත්වන ලදි.
ව්‍යවහාරික විද්‍යා පීඨය	''වෘත්තිය මාර්ගෝපදේශන නියමු ව්‍යාපෘති'' වැඩසටහන	25/02/2020	පළමු වසර සිසුන්	මෙම වැඩසටහන පෙ.ව. 08.00 සිට පෙ.ව. 10.00 දක්වා පීඨ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.
සියළුම පීඨයන්	''නායකත්වය පිළිබඳ ජාතික තරුණ සංවාද'' වැඩසටහන	26/02/2020	06	එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මඟින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන පෙ.ව.08.00 සිට ප.ව. 5.30 දක්වා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත් විනි.

සියළුම පීඨයන්	''මහජන කතා සමාජය'' වැඩමුළුව	27/02/2020	60	මෙම වැඩසටහන ප.ව. 04.30 සිට ප.ව. 07.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.
නව පණ්ඩුල නේවාසිකාගාරය	''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' පිළිබඳ වැඩමුළුව	27/02/202	86	මෙම වැඩසටහන පෙ.ව. 09.15 සිට ප.ව. 12.30 දක්වා නව පණ්ඩුල නේවාසිකාගාර පරිශ්‍රයේදී පවත්වන ලදී.
කෘෂිකර්ම පීඨය	''කථන ශිල්පියා'' පිළිබඳ වැඩසටහන	27/02/2020		ළමයින්ගේ සහභාගිත්වය දුර්වල මට්ටමක පැවති බැවින් වැඩසටහන අවලංගු කරන ලදි
කළමනාකරණ අධ්‍යයන පීඨය	''මෘදු කුසලතා සංවර්ධන'' වැඩසටහන	28/02/2020	39	මෙම වැඩසටහන පෙ.ව. 08.30 සිට ප.ව. 04.30 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.
කළමනාකරණ අධ්‍යයන පීඨය	''සමබර වැඩ ජීවිතයක්'' මැයෙන් වැඩසටහන	28/02/2020		මෙම වැඩසටහන පෙ.ව.10.30 සිට පෙ.ව. 12.30 දක්වා පීඨ දේශන ශාලාවේදී පැවැත්වේ
2020-03-01 සිට 2020-03-16 දක්වා				
තාක්ෂණ පීඨය	නායකත්ව සංවර්ධන වැඩසටහන	12, 13/03/2020	120	මෙම වැඩසටහන පෙ.ව. 08.30 සිට ප.ව. 04.30 දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලද අතර වැඩසටහන මෙහෙයවනු ලැබුවේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක ජේ.ඩී. රත්නායක මහතා සහ එ. එම්. දිසානායක මහත්මිය විසිනි
. කොවිඩ් 19 හේතුවෙන් 2020-03-14 දින සිට2020-07-17 දින දක්වා විශ්වවිද්‍යාලය සිසුන් සඳහා වසා දමන ලදි. දුරකථන මාර්ගයෙන් උපදේශන සහ වෘත්තීය උපදේශන සැසි පවත්වන ලදි.				
2020-07-01 සිට 2020-07-31 දක්වා				
කළමනාකරණ අධ්‍යයන පීඨය	වෘත්තීය මාර්ගෝපදේශ දැනුවත් කිරීමේ සැසිය	08/07/2020	නවක සිසු පලමු කණ්ඩායම	මෙම වැඩසටහන ප.ව. 2.00සිට 04.00 දක්වා zoom තාක්ෂණය හරහා සිදු කරන ලද අතර වැඩසටහන මෙහෙයවනු ලැබුවේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක ජේ.ඩී. රත්නායක මහතා සහ එ. එම්. දිසානායක මහත්මිය විසිනි
කළමනාකරණ අධ්‍යයන පීඨය	වෘත්තීය මාර්ගෝපදේශ දැනුවත් කිරීමේ සැසිය	09/07/2020	නවක සිසු දෙවන කණ්ඩායම	මෙම වැඩසටහන ප.ව. 01.30 සිට 03.30 දක්වා zoom තාක්ෂණය හරහා සිදු කරන ලද අතර වැඩසටහන මෙහෙයවනු ලැබුවේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක ජේ.ඩී. රත්නායක මහතා සහ එ. එම්. දිසානායක මහත්මිය විසිනි
කළමනාකරණ අධ්‍යයන පීඨය	ඉගෙනීමේ තාක්ෂණය පිළිබඳ වැඩසටහන	09/07/2020	නවක සිසු පලමු කණ්ඩායම	මෙම වැඩසටහන ප.ව. 01.00 සිට 03.00 දක්වා zoom තාක්ෂණය හරහා සිදු කරන ලද අතර වැඩසටහන මෙහෙයවනු ලැබුවේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක ජේ.ඩී. රත්නායක මහතා විසිනි
කළමනාකරන අධ්‍යයන පීඨය	ඉගෙනීමේ තාක්ෂණය පිළිබඳ වැඩසටහන	10/07/2020	නවක සිසු දෙවන කණ්ඩායම	මෙම වැඩසටහන ප.ව. 01.30 සිට 03.30 දක්වා zoom තාක්ෂණය හරහා සිදු කරන ලද අතර වැඩසටහන මෙහෙයවනු ලැබුවේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක ජේ.ඩී. රත්නායක මහතා විසිනි

2020-08-01 සිට 2020-08-31 දක්වා				
කෘෂිකර්ම පීඨය	වෘත්තීය සංවර්ධන වැඩසටහන	25/08/2020	119	මෙම වැඩසටහන ප.ව. 02.30 සිට ප.ව. 04.30 දක්වා පීඨ දේශන ශාලාවේදි පැවැත්විණි.
	වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ පීඨ සම්බස්ධීකාරක රැස්වීම	25/08/2020	6	රැස්වීම zoom තාක්ෂණය ඔස්සේ ප.ව. 02.30 සිට ප.ව.03.30 දක්වා පැවැත්විණි.
කෘෂිකර්ම පීඨය	වෘත්තීය සංවර්ධන වැඩසටහන	28/08/2020	112	මෙම වැඩසටහන පෙ.ව. 08.30 සිට පෙ.ව. 12.30 දක්වා පීඨ දේශන ශාලාවේදි පැවැත්විණි.
2020.09.01 සිට 2020.09.30 දක්වා				
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	වෘත්තීය මාර්ගෝපදේශ දැනුවත් කිරීමේ වැඩ සටහන	02/09/2020		රැස්වීම zoom තාක්ෂණය ඔස්සේ ප.ව. 01.00 සිට ප.ව.03.30 දක්වා ලද අතර වැඩසටහන මෙහෙයවනු ලැබුවේ ජේ.ඩී. රත්නායක මහතා සහ ඒ.එම්. දිසානායක මහත්මිය විසිනි
	බියෝන්ඩ් එම් ආයතනය සමඟ Zoom රැස්වීම	08/09/2020	6	විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්ගේ පීව දත්ත පත්‍රිකා සැකසීම සම්බන්ධයෙන් තාක්ෂණික වේදිකාවක් ඇති කිරීම සම්බන්දව රැස්වීමක් වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ අධ්‍යක්ෂිකා, වෘත්තීය මාර්ගෝපදේශන උපදේහකවරුන්ගේ සහ බියෝන්ඩ් එම් කාර්ය මණ්ඩලය අතර පැවැත්විණි.
	අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා පුද්ගල සංවර්ධන වැඩමුළුව	16/09/2020	2	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය විසින් පුද්ගල සංවර්ධන වැඩමුළුවම් සංවිධානය කර තිබු අතර ඒ සඳහා ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක වරුන් දෙදෙනෙකු සහභාගි විය. මෙම වැඩමුළුව පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැති අතර මහාචාර්ය අරුණ එස් ගමගේ මහතා විසින් මෙහෙයවන ලදි.
	''ලිංගිකත්වය පදනම් කරගත් සමානාත්මතාවය'' යන තේමාව යටතේ රැස්වීම	28/09/2020	2	ව්‍යවහාරික විද්‍යා පීඨයේදි ප.ව. 2.00 සිට ප.ව. 04.30 දක්වා රැස්වීම පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා වෘත්තීය මාර්ගෝපදේශක වරුන් දෙදෙනෙකු සහභාගි විය.
කෘෂිකර්ම පීඨය	නවකයින් සඳහා එළිමහන් පුහුණු වැඩසටහන	30/09/2020	6	මෙම රැස්වීම ප.ව. 02.30 සිට 03.30 දක්වා zoom තාක්ෂණය ඔස්සේ පැවැත්විණි.
කොවිඩ් 19 හේතුවෙන් 2020-10-08 සිට 2020-12-31 දක්වා විශ්වවිද්‍යාලය සිසුන් සඳහා වසා තිබු බැවින් දුරකථන මාර්ගයෙන් උපදේශන සහ වෘත්තීය උපදේශන සැසි සහ Zoom වැඩසටහන් පවත්වන ලදි.				
2020-10-01 සිට 2020-10-31 දක්වා				
සියළුම පීඨයන්	කර්මාන්තයේ ප්‍රවීනයන් සමඟ	03/10/2020	59	විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකයේ සහයෝගිතාවයේන් මාර්ගගත

	ආරම්භක මාර්ගගත සැසි මාලාව			ක්‍රමවේද ඔස්සේ මෙම වැඩසහහන පෙ.ව. 8.00 සිට පෙ.ව.10.00 දක්වා පැවැත්විනි. මෙහි සම්පත් දායකයා වුයේ ක්‍රිස්ටල් ලයිෆ් සහ මයිකෝලා නාමයන් හි නිර්මාතෘ ආර්. එම්. සර්මා මහතා විසිනි.
කෘෂිකර්ම පීඨය	''ඉගෙනීමේ තුසලතා'' පිළිබඳ වැඩසටහන	05/10/2020	120	වැඩසටහන ප.ව. 02.00 සිට ප.ව. 4.30 දක්වා පීඨ දේහන ශාලාවේදි පැවැත්විණි.
කෘෂිකර්ම පීඨය	''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' පිලිබඳ වැඩසටහන	07/10/2020	120	.වැඩසටහන ප.ව. 02.00 සිට ප.ව. 4.30 දක්වා පීඨ දේහන ශාලාවේදි පැවැත්විණි.
2020-11-01 සිට 2020-11-30 දක්වා				
	සී.ඊ.ඊ.අයි.ඩී සමඟ රැස්වීම	11/11/2020	4	සී.ඊ.ඊ.අයි.ඩී සමඟ අතථ්‍ය වෘත්තීය සාධාරණය සම්බන්ධයෙන් රැස්වීම පෙ.ව. 09.00 සිට පෙ.ව.10.00 දක්වා zoom තාක්ෂණය ඔස්සේ පැවැත්විණි
තාක්ෂණ පීඨය	''සිය දිවි හානි කරගැනීම වැළැක්වීම'' මැයෙන් සාකච්ඡාව	17/11/2020	4	මෙම රැස්වීම ප.ව. 6.00 සිට 7.00දක්වා zoom තාක්සණය ඔස්සේ පැවැත්විණි. ඒ. එම්. දිසානායක මහත්මිය විසින් වැඩසටහන මෙහෙය වූ අතර මෙහිදී සියදිවි හානි කර ගැනීම වැලැක්වීමට වැඩසටහනක් නිර්මාණය කිරීමට උපදෙස් ලබා දුනි.
සියළුම පීඨයන් සමඟ	වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක වරුන්ගේ රැස්වීම	19/11/2020	7	මෙම රැස්වීම පෙ.ව. 9.00 සිට 10.30 දක්වා zoom තාක්ෂණය ඔස්සේ පැවැත්විණි.
2020-12-01 සිට 2020-12-31 දක්වා				
ව්‍යවහාරික විද්‍යා පීඨය	''නව සාමාන්‍යය වැළඳ ගැනීඹ සහ බුද්ධිමත්ව සිටීම'' මැයෙන් වැඩසහහන	17/12/2020	36	මෙව වැඩසටහන ප.ව. 02.00 සිට ප.ව. 04.00 දක්වා zoom තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. සම්පත් දායකත්වය ලබා දෙන ලද්දෙ වෘත්තීය මාර්ගෝපදේශක ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක ජේ. ජී. රත්නායක මහතා විසිනි
ව්‍යවහාරික විද්‍යා පීඨය	වෘත්තීය මාර්ගෝපදේශන නියමු වැඩසටහන හඳුන්වා දීම	18/12/2020	60	මෙව වැඩසටහන ප.ව. 02.00 සිට ප.ව. 04.00 දක්වා zoom තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. වෘත්තීය මාර්ගෝපදේශක ජේ. ජී. රත්නායක මහතා විසින් වැඩසටහන මෙහෙයවන ලදි.

02. පුද්ගලික වෘත්තීය උපදේශන සහ උපදේශන සැසි පිළිබඳ විස්තර

	සිසුන්	දුරකථන හරහා	වෙනත්	එකතුව
ජනවාරි	35	09	05	49
පෙබරවාරි	39	01	23	63
මාර්තු	07	16	-	23
අප්‍රේල්	10	-	10	20
මැයි	14	-	06	20

ජුනි	02	07	04	13
ජූලි	13	-	01	14
අගෝස්තු	01	05	03	09
සැප්තැම්බර්	22	05	05	32
ඔක්තෝම්බර්	12	15	02	29
නොවැම්බර්	-	36	04	40
දෙසැම්බර්	01	26	08	35
එකතුව				**347**

ඈ. අනාගත දැක්ම

අනු අංකය.	වැඩසටහනේ නම	වැඩසටහනේ කාරණය	දිනය
01	''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' වැඩසටහන - උපාධි අපේක්ෂකයින් සඳහා	මෘදු කුසලතා සහ පෞරුෂත්ව සංවර්ධනය හදුන්වා දීමේ වැඩසටහට් ඇති කිරීමට	වසර පුරා
02	නාට්‍ය චිකිස්සක වැඩමුළුව	ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කිරීමට සහ ආතතිය දුරුකිරීමට	2021 සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර්
03	ව්‍යවහාරික විද්‍යා පීඨය තුල වෘත්තීය මාර්ගෝපදේහන නියමු ව්‍යාපෘතිය	වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම	වසර පුරා
04	තනි පුද්ගල වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය	අභිරුචිගත වෘත්තීය මාර්ගෝපදේශන විසදුම් සැපයීම	වසර පුරා
05	මෘදු කුසලතා සංවර්ධන පුහුණුව - ව්‍යවහාරික විද්‍යා පීඨය	මෘදු කුසලතා වරධනය කිරීම	2021 මාර්තු
06	මෘදු කුසලතා සංවර්ධන පුහුණුව - කෘෂිකර්ම පීඨය	මෘදු කුසලතා වරධනය කිරීම	2021 මාර්තු
07	මෘදු කුසලතා සංවර්ධන පුහුණුව - තාක්ෂණ පීඨය	මෘදු කුසලතා වරධනය කිරීම	2021 මාර්තු
08	මෘදු කුසලතා සංවර්ධන පුහුණුව - සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	මෘදු කුසලතා වරධනය කිරීම	2021 ජුනි
09	මෘදු කුසලතා සංවර්ධන පුහුණුව - කළමනාකරණ අධ්‍යයන පීඨය	මෘදු කුසලතා වරධනය කිරීම	2021 සෙප්තැම්බර්
10	ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ රැස්වීම	කර්මාන්තයන්ට නිරාවරණය ලබා දීම	වසර පුරා
11	සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය සඳහා සම්මුඛ පරීක්ෂණ, ජීව දත්ත පත්‍රිකා සැකසීම සහ ලිවීමමේ කුසලතා වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	2021 ජනවාරි
12	කළමනාකරණ අධ්‍යන පීඨය සඳහා සම්මුඛ පරීක්ෂණ, ජීව දත්ත පත්‍රිකා සැකසීම සහ ලිවීමමේ කුසලතා වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	2021, මාර්තු
13	ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා සම්මුඛ පරීක්ෂණ, ජීව දත්ත පත්‍රිකා සැකසීම සහ ලිවීමමේ කුසලතා වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	2021 මැයි

14	කෘෂිකර්ම පීඨය සඳහා සම්මුඛ පරීක්ෂණ, ජීව දත්ත පත්‍රිකා සැකසීම සහ ලිවීමමේ කුසලතා වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	2021 නොවැම්බර්
15	තාක්ෂණ පීඨය සඳහා සම්මුඛ පරීක්ෂණ, ජීව දත්ත පත්‍රිකා සැකසීම සහ ලිවීමමේ කුසලතා වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	2021 අගෝස්තු
16	කථන ශිල්පීය වැඩසටහන - කෘෂිකර්ම පීඨය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම	2021 ජුනි
17	කථන ශිල්පීය වැඩසටහන - කෘෂිකර්ම පීඨය - තාක්ෂණ පීඨය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම	2021 මාර්තු
18	කථන ශිල්පීය වැඩසටහන - ව්‍යවහාරික විද්‍යා පීඨය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම	2021 මැයි
19	කථන ශිල්පීය වැඩසටහන - කළමනාකරණ අධ්‍යන පීඨය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම	2021 මැයි
20	කථන ශිල්පීය වැඩසටහන - සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම	2021 මැයි
21	පෞරුෂත්ව සංවර්ධන වැඩසටන - කෘෂිකර්ම පීඨය	පෞරුෂත්ව සංවර්ධනය	2021 අගෝස්තු
22	පෞරුෂත්ව සංවර්ධන වැඩසටන -තාක්ෂණ විද්‍යා පීඨය	පෞරුෂත්ව සංවර්ධනය	2021 අප්‍රේල්
23	පෞරුෂත්ව සංවර්ධන වැඩසටන -ව්‍යවහාරික විද්‍යා පීඨය	පෞරුෂත්ව සංවර්ධනය	2021 සැප්තැම්බර්
24	පෞරුෂත්ව සංවර්ධන වැඩසටන කළමනාකරණ අධ්‍යන පීඨය-	පෞරුෂත්ව සංවර්ධනය	2021, ඔක්තෝම්බර්
25	පෞරුෂත්ව සංවර්ධන වැඩසටන -සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය	පෞරුෂත්ව සංවර්ධනය	2021 ඔක්තෝම්බර්
26	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන දෙවන වැඩසටහන	2021 සැප්තැම්බර්, නොවැම්බර්
27	ඡායාරූපකරණ වැඩමුළුව	ඡායාරූපකරණ සංවර්ධන දෙවන වැඩසටහන	2021 අගෝස්තු, සැප්තැම්බර්
28	වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ රැකියා වෙබ් ද්වාර සංවර්ධනය සහ ක්‍රියාකාරීත්වය	වෘත්තීය මාර්ගෝපදේශයන්ට අදාල තොරතුරු බෙදා ගැනීම	වසර පුරා
29	ග්‍රැවෙල් සමාජය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම.	වසර පුරා

26. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිසුන් සඳහා භාහිර අධ්‍යන වැඩසටහන් මඟින් පුළුල් පරාසයක ඉගෙනුම් අවස්ථා සැලසීමට මාර්ගෝපදේශ සකස්කොට තිබේ. කුසලතා පූර්ණ දැනුමැති සහ රැකියාවන්ට සුදුසු උපාධිධාරීන්, ඩිප්ලෝමාධාරීන් සහ සහතිකපත්‍රලාභීන් බිහිකිරීම මෙහි අරමුණ වේ. පීඨයන් හා අධ්‍යනාංශවල එදිනෙදා කාර්යභාරය අඩු කරමින් භාහිර අධ්‍යන වැඩසටහන් වල ක්‍රියාකාරකම් ඵලදායී ලෙස සහ කාර්යක්ෂමව සිදු කිරීමට වෙනම පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාල වලට දැනුම් දෙන ලදී. විශ්වවිද්‍යාලයේ විවිධ පීඨයන් මඟින් භාහිර උපාධි පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, සහතිකපත්‍ර පාඨමාලා වැනි දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය හරහා ක්‍රියාත්මක කෙරේ.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හි පරිපාලන ව්‍යුහය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුව පහත දැක්වේ.

දු.අ.අ.ම හි පරිපාලන ව්‍යුහය



* අනාගතයේදී දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය තවදුරටත් පුළුල් කිරීමත් සමඟ මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කෙරෙනු ඇත.

2. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හි කළමණාකරණ කමිටුව

පහත සඳහන් දින තුළ කළමණාකරණ කමිටු රැස්වීම් දෙකක් වර්ෂ 2020දී පවත්වන ලදි.

1. 31 වන රැස්වීම - 03 ජුනි 2020
2. 32 වන රැස්වීම - 25 අගෝස්තු 2020

4. දැනට ක්‍රියාත්මක වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	2019 ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව	2019 වර්ෂයේ සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව
01	විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය විද්‍යාවේදී (ජීව විද්‍යා) බාහිර උපාධිය	20	05
02	විද්‍යාවේදී සාමාන්‍ය උපාධි වැඩසටහන විද්‍යාවේදී (භෞතික විද්‍යා) බාහිර උපාධිය	10	-
03	ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය	-	176
04	ඉංග්‍රිසි ඩිප්ලෝමා පාඨමාලාව	402	353
05	ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව	201	218
06	දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව	-	-
07	දෙමළ සහතික පත්‍ර පාඨමාලාව	-	-
08	තොරතුරු හා සන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාව	110	-
09	තොරතුරු හා සන්නිවේදන සහතික පත්‍ර පාඨමාලාව	77	-
10	පරිසර කළමණාකරනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	25	26
	එකතුව	845	778

ආ. ජයග්‍රහණයන්

- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අනුරාධපුර නගරයේ සිදුකෙරෙමින් පවති
- අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා පොලොන්නරුවේ ඉඩම
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා අධ්‍යාන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට පොලොන්නරුව නගරයේ නව ඉඩමක් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට ලබා ගැනීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා නව වෙබ් අඩවියක්
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය සඳහා නව වෙබ් අඩවියක් සැකසීමේ කටයුතු සිදුකරමින් පවතින අතර වර්ෂ 2021 මුල් භාගයේදී දී එළි දැක්වීමට බලාපොරොත්තුවේ.
- භාහිර වැඩසටහන්වල ප්‍රථිපල නිකුත් කිරීම.
  කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ වුවද බාහිර උපාධි සහ දිගු වැඩසටහන් වල ප්‍රථිපල ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීම
- බාහිර වැඩසටහන් පැවැත්වීඹ
  කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් බොහෝ බාහිර වැඩසටහන් අථත්‍ය ක්‍රමවේද යටතේ පැවැත්වීම.

5.0 වර්ෂ 2020 දී මුහුණ දුන් අභියෝගයන්

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් බාහිර වැඩසටහන් පවැත්වීමේ ප්‍රතිය මන්දගාමීව සිදුවීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයට නිසි ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් නොමැති අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 මගින් තීරණය කරනු ලැබූ කාර්ය මණ්ඩල ප්‍රමාණයට අනුවද සිටිය යුතු අවම පරිපාලන, මූල්‍ය, ලිපිකාර හා තාක්ෂණික කාර්ය මණ්ඩලයද නොමැත.
- ස්වාධීන, කාර්‍යක්ෂම හා ඵලදායී මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීමට ඇති බාධාවන්
- බාහිර අධ්‍යන මධ්‍යස්ථාන සම්බන්ධ ගැටළු
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ සමීක්ෂණ මණ්ඩලය හා වැඩසටහන් සම්බන්ධීකාරක අතර සම්බන්ධීකරණයට අදාල ගැටළු

ඇ. අනාගත දැක්ම

- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා ගෙවීම් සිදු කිරීමේ නව ද්වාර පද්ධතියක් හඳුන්වා දීම.
- සිදුකෙරෙමින් පවතින බාහිර වැඩසටහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ තත්වය සහතික කිරීමේ කමිටුවේ බාහිර උපාධි වැඩසටහන් සඳහා වූ නිර්නායකයන් අනුව සමාලෝචනය කිරීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පූර්ණ නිදහස් පරිපාලන ආයතනයක් ලෙස පුළුල් කිරීම මගින් අධ්‍යයන වැඩසටහන් වඩාත් හොඳින් ක්‍රියාත්මක කරීමට පහසුම් සැලසීම.
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධි වැඩසටහන සඳහා විෂය මාලා සංශෝධනය සිදු කිරීම
- දේශන ශාලා සහ බාහිර අධ්‍යන මධයස්ථානවල පහසුකම් වැඩි දියුණු කිරීම
- දත්ත සමුදාය කළමණාකරන පද්ධතිය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හඳුන්වා දීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ සමීක්ෂණ මණ්ඩල සහ වැඩසටහන් සම්බන්ධීකාරක අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අරමුදල වඩාත් කාර්යක්ෂම හා ඵලදායි කටයුතු සඳහා යෙදවීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ශිෂ්‍ය අත්පොත යාවත්කාලීන කිරීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පරිපාලන හා ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

27. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

අ. හැදින්වීම

ශ්‍රී ලංකා රජරටවිශ්ව විද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වර්ෂ 2015 දී ස්ථාපනය කරන ලදි. මෙම මධ්‍යස්ථානයේ දැක්ම වන්නේ වෘත්තීය සංවර්ධනය පිළිබඳ වූ කේන්ද්‍රස්ථානයක් වීමයි. මෙහෙය වනුයේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සියළුම අංශ සඳහා අඛණ්ඩ, අවශ්‍යතා පදනම් කරගත් ඉගැනුම් සහ වෘත්තීය සංවර්ධන අවස්ථා සැලසිමයි. විශ්ව විද්‍යාලය විසින් පත් කරන ලද කළමණාකරන කමිටුවක් මගින් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කලමණාකරන කටයුතු සිදු කෙරෙන අතර උපකුළපති ප්‍රමුඛ සියලුම පීඨ නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ විද්වතුන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ.

ආ. ජයග්‍රහණයන්

වර්ෂ 2020 තුළදී පවත්වන ලද වැඩමුළු හා පුහුණු වැඩසටහන් කාර්ය මණ්ඩල සංවර්ධනය අරමුණු කොටගත් වැඩමුළු 3 ක් සහ පුහුණු වැඩසටහන් 2 ක් වර්ෂ 2020 දී පවත්වන ලැබූ අතර අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා සැලසුම් කොට තිබූ වැඩමුළු 2 ක් කල් දමන ලදී. උසස් අධ්‍යාපනය ඉගැන්වීමේ සහතිකපත්‍ර වැඩසටහන වර්ෂ 2020 දී පැවති ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. මෙම වැඩසටහන වර්ෂ 2020 පෙබරවාරි මස 11 වන දින ආරම්භ වුණු අතර පීඨයන් 6 නියෝජනය කරමින් අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් 33 දෙනෙකු සහභාගි වූ අතර එම සංඛ්‍යාව එක් වැඩසටහනකට සහභාගි කරගත හැකි උපරිම ධාරිතාවය වේ. මෙම වැඩසටහන සතියේ වැඩකරන දින 5 තුළට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට තිබුණි. දින 20 කින් අවසන් කෙරුණු මෙම වැඩසටහන මැයි මාසය දක්වා දීර්ඝ වූයේ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙනි. මෙම වැඩසටහන වර්ෂ 2019 පැවැත්වීමට නොහැකි වීම නිසා අප විශ්වවිද්‍යාලීය අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙන්ම අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වල අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් පොරොන්දු ලේඛණයේ සිටී. එමෙන්ම වර්ෂ 2020 නොවැම්බර් මස තවත් වැඩසටහනක් නිර්මාණය කිරීමට සැලසුම් කළද කොවිඩ් 19 තත්වය හමුවේ වර්ෂ 2021 මුල් කාලයේ ආරම්භ කිරීමට තීරණය කෙරිණි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් අධ්‍යනාංශ ප්‍රධානින් හා විධායක නිළධාරින් සඳහා "විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය ක්‍රියාපටිපාටි" මැයෙන් පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහනේ සතියකට එක් දිනක් බැගින් සැසි 5 ක් පැවැත්වුණු අතර සියළුම පීඨ සහ පරිපාලන අංශයන්හි නියෝජනයෙන් 27 දෙනෙකු සහභාගි විය.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය එක්වරම මාර්ගගත ක්‍රමවේදයට යොමු වූ බැවින් ඒ සඳහා අධ්‍යන කාර්ය මණ්ඩලයට සහය වීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලදී. "මාර්ගගත ඉගැන්වීම් ක්‍රම" මැයෙන් වැඩමුළුවක් අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, පරිසණක ඉංජිනේරු අධ්‍යනාංශයේ සහභාගිත්වයෙන් පැවැත්වූ මෙම වැඩමුළුව සඳහා අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් 100 කට වඩා සහභාගි විය.

කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා "කාර්යාල පටිපාටි" මැයෙන් වැඩමුළුවක් සංවිධානය කරන ලදී. සියළු පීඨ සහ පරිපාලන අංශ නියෝජනය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 35 දෙනෙකු සහභාගි වූ මෙම වැඩසටහන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්පත් දායකයෙකු විසින් පවත්වන ලදී.

විශ්වවිද්‍යාලීය ටෝස්ට් මාස්ටර් සමාජයේ මාසික සැසි පැවැත්වීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරන ලදී. ටෝස්ට් මාස්ටර් ජාත්‍යන්තරයේ සම්පත් දායකයකුගේ සහභාගිත්වයෙන් ජනවාරි මාසයේ එක් සැසියක් පැවැත්විණි.

වර්ෂ 2020 තුළ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රගතිය

වැඩමුළුවේ නම	දිනය	කාර්ය මණ්ඩල කාණ්ඩය	සහභාගී වූවන් ගණන	වියදම (රු.)
උසස් අධ්‍යාපනය ඉගැන්වීමේ සහතික පත්‍ර	පෙබරවාරි 11 සිට මැයි 28 දක්වා	අධ්‍යයන	33	492,885.00
ටෝස්ට් මාස්ටර් සමාජය	2020 ජනවාරි 9	අධ්‍යන සහ අනධ්‍යන	14	2,229.00

මාර්ගගත ඉගැන්වීමේ ක්‍රම	2020 සැප්තැම්බර් 10	අධ්‍යයන	108	137,160.00
මාර්ගගත ඉගැන්වීමේ ක්‍රම	2020 සැප්තැම්බර් 27	අධ්‍යයන		
කළමනාකරණ සහයක කාර්යාල ක්‍රියා පටිපාටි	2020 සැප්තැම්බර් 29	අනධ්‍යන	55	14,520.00
විශ්වවිද්‍යාල පරිපාලන සහ මූල්‍ය ක්‍රියා පටිපාටිය - අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ විධායක නිලධාරීන් සඳහා පුහුනු වැඩසටහන	2020 සැප්තැම්බර් 29 2020 සැප්තැම්බර් 17 2020 සැප්තැම්බර් 24 2020 සැප්තැම්බර් 30	අධ්‍යන සහ අනධ්‍යන	27	139,093.00
එකතුව				785,887.00

වර්ෂ 2020 තුළ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රගතිය

වර්ෂ 2020 සඳහා වූ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා විශ්වවිද්‍යාල පරිපාලනයේ අනුමැතිය හිමිවිය. කොවිඩ් 19 වසංගතය සහ සීමා කිරීම තිබුණද කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සැලසුම් කර තිබූ වැඩසටහන් වලින් බහුතරයක් සම්පූර්ණ කිරීමට හා කාර්ය මණ්ඩල අවශ්‍යතා වන නව වැඩසටහනක් හඳුන්වාදීමද වසර තුළ සිදුකරන ලදී. තවද දිගුකාලීන ප්‍රමාද වෙමින් තිබුණු "උසස් අධ්‍යාපනයේ ඉගැන්වීම්" සහතිකපත්‍ර වැඩසටහන්ද කොවිඩ් 19 වසංගතය සමඟ තිබූ අභියෝග මධ්‍යයේ සාර්ථකව නිම කරන ලදී. එබැවින් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වර්ෂ 2020 දී 90% ක සාර්ථකත්වයක් අත්පත් කරගත් බව පිළිගත හැකිය.

අධ්‍යනාංශ ප්‍රධානීන් හා විධායක නිළධාරීන් සඳහා "විශ්වවිද්‍යාල පරිපාලනය සහ මූල්‍ය රෙගුලාසිය " පිළිබඳව පුහුණු වැඩසටහන් හඳුන්වාදීම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වෙත නව අගය එකතු කිරීමත් විය. මෙම වසරේ සිට මෙම වැඩමුළුව වාර්ෂිකව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

සැලසුම් කරන ලද වැඩමුළු රාශියක් පැවැත්වීමට නොහැකිවූයේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මාර්තු මස වසාදමන ලද විශ්වවිද්‍යාලය ඉදිරි මාස කිහිපයත් වසා තැබීම හේතුවෙනි. යලි විශ්වවිද්‍යාල ආරම්භ කිරීමෙන් පසුවද ගමන් කිරීමේ හා එක්රැස් වීමේ සීමා කිරීම වැනි හේතූන් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යසථානයේ ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇතිවිය. අධ්‍යන, අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙපිරිසම සඳහාම සංවිධානය කිරීමට සැලසුම් කළ වැඩසටහන් රාශියක් අත්හිටුවීමට සිදුවිය. එයින් අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා වූ වැඩසටහන් අතර ශාස්ත්‍රීය ලිවීම්, පර්යේක්ෂණ පුහුණු සහ කේන්ද්‍රීය ඉගැන්වීම් හා ඉගෙනුම් වැඩසටහන් සමාලෝචනය සඳහා වාඛ්‍ය ලිවීම වූ අතර අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා වූ වැඩසටහන් අතර රාජකාරි ලිපි ලිවීම, වෘත්තිය මාර්ගෝපදේශන, උපදේශනය සහ රසායනාගාර ආරක්ෂණ පුහුණුව පිළිබඳ වැඩසටහනක් විය. රියදුරන් සඳහා සංවිධානය කරන ලද "වෘත්තීය රියදුරෙක් වීම" වැඩමුළුව දෙසැම්බර් මස පැවැත්වීමට සියළු කටයුතු සංවිධානය කර තිබියදී වර්ෂ 2021 ජනවාරි මසට කල් දැමීමට සිදුවිය.

වසංගත තත්වය හමුවේ "උසස් අධ්‍යාපන ඉගැන්වීම්" සහතිකපත්‍ර වැඩසටහන අවසන් කිරීම ප්‍රමාද වූ අතර එහි අවසන් සැසි කිහිපය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදී. එමෙන්ම එහි දෙවන වැඩසටහන ආරම්භ කිරීමද ප්‍රමාද වූ අතර එය වර්ෂ 2021 දක්වා කල්දමන ලදී. සමහර වැඩසටහන් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ අවසන් කරගත හැකි වුවද මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කිරීමට දුෂ්කරතා සහිත වැඩසටහන් ඊලඟ වසර සඳහා කල්දැමීම.

ඈ. අනාගත දැක්ම

විශ්වවිද්‍යාලීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2021 වර්ෂයේදී අධ්‍යන හා අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වැඩමුළු සහ පුහුණු වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීමට යෝජනා කර ඇත. ප්‍රධාන වැඩසටහන වන "උසස් අධ්‍යාපන ඉගැන්වීම්" සහතිකපත්‍ර වැඩසටහන වර්ෂ 2021 මුලදී ආරම්භ කිරීමට නියමිතය. අධ්‍යනාංශ ප්‍රධානීන් හා විධායක නිළධාරීන් සඳහා වන වාර්ෂික පුහුණු වැඩසටහන්ද 2021 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කොට තිබේ. අධ්‍යන හා අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙපිරිසටම වෘත්තිය සංවර්ධන අවස්ථා ලබාදීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සැලසුම් කොට තිබේ.

28. පරිගණක මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පරිගණක මධ්‍යස්ථානය 1996 විශ්වවිද්‍යාලයේ ආරම්භයත් සමඟ උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ස්ථාපිත කරන ලදි. පරිගණක මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු සෘජුවම උප කුලපතිතුමාගේ අධීක්ෂණය යටතේ සිදුකරන අතතැ, එහි ක්‍රියාකාරකම් උපකුලපතිතුමා විසින් පත් කරන ලද පරිගනක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක මගින් සිදු කරයි. කළමණාකරන පීඨයේ සහ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ උපාධි අපේක්ෂකයින්ගේ මූලික පරිගණක හදුන්වාදීමේ වැඩසටහනක් පවත්වා ගෙන යාමට පරිගණක මධ්‍යස්ථානය මූලික වී කටයුතු කරයි. විශ්ව විද්‍යාලයේ පළුල් විමත් සමඟ පරිගණක මධ්‍යස්ථානය විශ්ව විදයාලයේ තොරතුරු සන්නීවේදන තාක්ෂණ (ICT) පහසුකම් සපයන මධ්‍යස්ථානයක් බවට පත්විය. මෙහි මූලික අරමුණ ව්‍යාප්ත විමත් සමඟ ඇතිවන පරිපාලනමය ගැටළු අවමකර ගැනීම සඳහා වර්ෂ 2011දී පාලක සභාව මගින් පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යන හා පරිපාලන කටයුතු සඳහා අධ්‍යක්ෂකවරයෙකු පත්කරනු ලැබීය. අධ්‍යක්ෂකවරයා තොරතුරු සන්නීවේදන තාක්ෂණය (ICT) පිළිබඳ මනා දැනුම ඇති අධ්‍යන කාර්යමණ්ඩලයේ සාමාජිකයෙකි. නම් කරන ලද අධ්‍යක්සකවරයෙකුගේ ධූර කාලය වසර තුනකි.

පරිගණක මධ්‍යස්ථානය සතියේ දිනවල පෙ.ව 8.00 සිට ප.ව 6.00 දක්වාද, සෙනසුරාදා දින පෙ.ව 8.00 සිට ප.ව 6.00 දක්වා විවෘතව පවතී. සමාන්‍යයෙන් විවෘත වේලාවට අමතරව හැර විශේෂ ඉල්ලීම් මත උපකුලපති වරයාගේ අනුමැතිය ඇතිව අධ්‍යන නිවාඩු සහ විභාග කාලසීමාවලදී ප.ව 8.00 දක්වා විවෘතව තබනු ලබයි. පරිගණක මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය පරිගණක තාක්ෂණ උපදේශකවරයෙකු, පද්ධති විශ්ලේෂකයෙකු, සහකාර ජාල කළමනාකරුවෙකු, තාක්ෂණ නිළධාරියෙකු, විද්‍යාගාර සහයකයෙකු හා වැඩ සහයකයෙකුගෙන් සමන්විත වේ.

සම්පත් හා සේවාවන්

පරිගණක විද්‍යාගාර

පරිගණක මධ්‍යස්ථානය මඟින් නිරන්තරයෙන් යාවත්කාලීන කරන ලද භෞතික සම්පත් පවත්වාගෙන යාම සිදු කරයි. නවීන පරිගණක 100 බැගින් ඇති ප්‍රධාන පරිගණක විද්‍යාගාර 02 ක් පරිගණක මධ්‍යස්ථානය සතු වන අතර ඉන් එක් විද්‍යාගාරයක් තොරතුරු තාක්ෂණය සම්බන්ධ දේශන හා අනෙකුත් සම්මන්ත්‍රණ සඳහා වෙන් කර තිබෙන අතර අනෙක් විද්‍යාගාරය ඕනෑම වේලාවක සිසුන්ගේ අන්තර්ජාල භාවිතය හා අනෙකුත් නිදහස් ක්‍රියාකාරකම් ප්‍රගුණ කිරිමට වෙන්කර තිබේ.

වීඩියෝ (දෘශ්‍ය) සම්මන්ත්‍රණ ඒකකය

අංග සම්පූර්ණ වීඩියෝ (දෘශ්‍ය) සම්මන්ත්‍රණ පද්ධතියක් පරිගණක මධ්‍යස්ථානය තුල ස්ථාපනය කොට තිබේ. සියළුම අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල නිලධාරීන් හට දුරස්ථව අන්තර්ජාල භාවිතයට සම්බන්ධ විය හැකි රාජකාරී මට්ටමේ කටයුතු සඳහා අවස්ථාව මෙමගින් සැලසේ. සියළුම මයික්‍රෝෆෝනද කොන්සෝලය වෙත සම්බන්ධ වී තිබෙන අතර ශබ්ද විකාශනය සමඟ රූපවාහිනී මොනිටරය ද සම්බන්ධ වේ. මෙම ඒකකය භාවිතයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට හා සිසුන් හට ද්වි මාර්ග ගත සන්නිවේදන සංසඳ වලට සහභාගී වීමේ අවස්ථා ද සැලසේ.

පරිගණක නඩත්තු හා එකලස් කිරීමේ ඒකකය

පරිගණක නඩත්තුව, එකලස් කිරීම හා අළුත් වැඩියා කිරීමේ අංශය පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ ජර්නලය යටතේ ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයන්ට අනුව විවිධ අංශයන්ගේ ඉල්ලීම් වලට සරිලන පරිදි පරිගණ යන්ත්‍ර එකලස් කිරීම මෙම අංශයෙන් සිදුවේ. පරිගණක බල සැපයුම්, මව් පුවරු, සියළුම වර්ගයේ මොනිටර්, යු.පී.එස්, මුද්‍රණ යන්ත්‍ර ආදී සියළුම වර්ග වල තොරතුරු තාක්ෂණ උපකරණ අළුත් වැඩියාවද මෙම අංශයෙන් සිදු කෙරේ. මීට අමතරව පරිගණක දෝශ නිරාකරණය හා මෘදුකාංග ස්ථාපනය කිරීමද සිදුකරයි. තාවකාලික පත්වීම් ලද තාක්ෂණ නිලධාරීන් දෙදෙනකු මෙම අංශයේ රාජකාරී කරන අතර ඔවුන් අවශ්‍යතාවයට අනුව රාජකාරී වේලාවට අමතරව අතිකාල සේවයද, සති අන්ත වල හා නිවාඩු දින වලද සේවා කටයුතු වල නිරතවේ. අර්ධ පුහුණු සහිත දෛනික වේතන ලබන නිලධාරියෙකු ද මෙහි කටයුතු වලට සහය වේ.

අන්තර්ජාලය සහ ඒ ආශ්‍රිත සේවා

ශ්‍රී ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අන්තර් ජාල සේවා සපයන්නා වන අතර. මෙමගින් විශ්වවිද්‍යාලයේ මිහින්තලය පරිශ්‍රය සඳහා තත්පරයට මෙගාබයිට් 150 ක අධිවේගී අන්තර්ජාල පහසුකම් සපයන අතර විශ්වවිද්‍යාලය තුල පද්ධතියේ දත්ත සංසරණ වේගය තත්පරයට මෙගාබයිට් 200 කි. ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල, ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යා පීඨය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය හා කළමනාකරණ පීඨය යන අංශ වලට අන්තර් ජාල පහසුකම් සැපයීමේ කටයුතු පරිගණක මධ්‍යස්ථානයෙන් සිඳු කරයි. අධිවේගී ෆයිබර් ඔප්ටික් කේබල් ජාලයක් මඟින් මිහින්තලේ පරිශ්‍රයේ ගොඩනැගිලි රාශියක් ආවරණය කෙරෙන අතර ගොඩනැගිලි තුල යොදා ඇති යු.පී.ටී කේබල අභ්‍යන්තර ජාල මඟින් ෆයිබර් ඔප්ටික් කේබල් ජාලයට සම්බන්ධ වේ. මිහින්තලේ පරිශ්‍රය තුල ඇති මෑතකදී ඉදි වූ ගොඩනැගිලි කීපයකට හැරුණු කොට අනෙකුත් සියළුම අධ්‍යයන අංශ හා පරිපාලන කාර්යාල සඳහා අන්තර්ජාල පහසුම් හා ඒ ආශ්‍රිත සේවාවන් පරිගණක මධ්‍යස්ථානය විසින් සිදු කරයි.

ආ.ජයග්‍රහණයන්

වර්ෂ 2019 පුරාවට මිහින්තලේ පරිශ්‍රයේ පිහිටි සියලුම පීඨයන්හි අධ්‍යන කටයුතු අදාළ පහසුකම් සැපයීමට පරිගනක මධ්‍යස්ථානය සමත්විය. පරිගණක මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ පවතින පරිගණක විද්‍යාගාරයේ පැරණි පරිගණක 50 ක් ඉවත්කර නව පරිගණක සම්බන්ධ කිරීම මගින් වඩාත් කාර්‍යක්ෂම සේවයක් ලබාදීමට හැකියාව ලැබුණි. තවද පරිගණක මධ්‍යස්ථානය සඳහා නව බහුමාධ්‍ය ප්‍රක්ෂේපන 02ක් ස්ථාපනය කිරීම සිදු විය.

1. ආරම්භ කරන ලද තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහතික පත්‍ර සහ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා පිළිවෙලින් සිසුන් 77ක් සහ 110ක් සහභාගි වීම.
2. පරිගණක නඩත්තු හා එකලස් කිරීමේ ඒකකය (CMAU) විසින් සිය රාජකාරි වසර පුරා හොඳින් ඉටු කිරීම.
3. නව පණ්ඩුල I නව පණ්ඩුල II සහ සෝමාදේවි ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා WiFi පහසුකම් සපායා දීම.
4. සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ Wi-Fi සහ ජාලය එළීමේ කටයුතු 80%ක් පමණ සම්පුර්ණ කර ඇත.
5. කොවිඩ් 19 හේතුවෙන් විශ්වවිද්‍යාලය වසා තිබුනද ලංකා අධ්‍යාපන සහ පර්යේක්ෂණ ජාලයේ සහයෝගයෙන් Zoom දෘෂ්‍ය සම්මන්ත්‍රණ පහසුකම් සැලසීමට කටයුතු කරන ලදි. මෙහෙයුම් සඳහා අවම බාධා කිරීම් සහිතව දුරස්ථව ඉගනුම් සහ පර්යේක්ෂණ කටයුතු සඳහා අන්තර්ජාලය මඟින් ප්‍රවේශ වීමට අවශ්‍ය සියලුම මෙවලම Zoom විසින් සපයනු ලැබේ.

ඇ. අනාගත දැක්ම

1. ප්‍රධාන පරිගණක කාමරය පරිපාලන ගොඩනැගිල්ලේ සිට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙත මාරු කිරීම
2. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට වෙනම පිවිසුමක් ලබා ගැනීම.
3. විශ්වවිද්‍යාලය සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.

29. තත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

තත්වය සහතික කිරීමේ අත්පොත (2013) හි අන්තර්ගත තත්වය සහතික කිරීමේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවේ මාර්ගෝපදේශයට හා අභ්‍යන්තර තත්වය සහතික කිරීමේ ඒකක (IQACs)යන්ට අනුව තත්ව ආරක්ෂණ කේන්ද්‍රය යටතේ විධිමත්ව අභ්‍යන්තර තත්ව සහතික කිරීමේ කටයුතු සිදු කෙරේ. ගුණාත්මක භාවය ඉහල නැංවීමේ අරමුණෙන් යුතුව හැකි සෑම අවස්ථාවකදීම සෑම අංශයකටම අභ්‍යන්තර තත්ව සහතික කිරීමේ සෛලයන්හි කාර්ය භාරය පුළුල් කිරීම සඳහා නවීකරණය කරනු ලැබේ. අභ්‍යන්තර තත්ව සහතික කිරීම සම්බන්ධව සෑම අංශයකම ඉහල කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් යුතුව වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම සඳහා සෑම ක්‍රියාකාරකමකටම අදාලව වගකිව යුතු තත්ව සහතික කිරීමේ සෛලයන් හි සාමාජිකයෙකු පත්කරනු ලැබේ. ඔහු හෝ ඇය විසින් පිඨ මණ්ඩලය හෝ දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානය මඟින් අනුමත කෙරෙන ක්‍රියාකාරී කමිටුව සමඟ එක්ව කටයුතු සිදු කරයි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ ප්‍රමාණය ගණනය කිරීම සඳහා මෙහෙයුම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිය විශ්වවිද්‍යාල දින දර්ශනය හා කළමණාකරන මාර්ගෝපදේශය සකස් කිරීමේදී තත්ව ආරක්ෂණ කේන්ද්‍රයේ මූලික වී ක්‍රියා කරනු ලබන අතර ඊට අමතරව අනෙකුත් ප්‍රතිපත්ති ලේඛන සැකසීම සඳහාද දායකත්වය සපයනු ලැබේ. තත්ව ආරක්ෂණ කේන්ද්‍රය මඟින් බාහිර තත්ව සහතික කිරීමේ ක්‍රියාදාමයන්ට මඟ පෙන්වීම සඳහාද මූලික පියවර ගෙන තිබේ. පීඨයන් තුල තත්වය සහතික කිරීම පීඨාධිපතිවරුන් හා තත්ව ආරක්ෂණ කේන්ද්‍ර පීඨ සම්බන්ධීකාරකවරුන්ගේ වගකීම වේ. එලෙසම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකතුමන් හා තත්ව ආරක්ෂණ කේන්ද්‍රයේ සම්බන්ධීකාරකවරුන්ගේ අධීක්ෂණය යටතේ සිදුවේ. කළමණාකරන කමිටුවේ මුලසුන හෙහෙයවනු ලබන්නේ උපකුලපතිතුමා විසින්ය.

ආ. ජයග්‍රහණයන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ තත්වය සහතික කිරීමේ කමිටුව මඟින් පවත්වන ලද සමාලෝචනයේදී සමස්ථ ශ්‍රේණිගත කිරීම් පහත පරිදි විය.

වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය - බී ශ්‍රේණිය (සතුටු දායකයි)

කෘෂිකර්මය පිළිබඳ විද්‍යා වේදී උපාධිය – බී ශ්‍රේණිය (සතුටු දායකයි)

තත්වය සහතික කිරීමේ කමිටුව බාහිර සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්ථා ඉදිරිපත් කිරීම.

ආයතනික/වැඩසටහන් සමාලෝචනය	වැඩසටහනේ නම	ඉදිරිපත් කල දිනය
වැඩසටහන් සමාලෝචනය	ජීව විද්‍යාව පිළිබඳ උපාධිය	30.06.2020
වැඩසටහන් සමාලෝචනය	සෞඛ්‍ය ප්‍රවර්ධන උපාධිය	30.06.2020
වැඩසටහන් සමාලෝචනය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය	30.06.2020
වැඩසටහන් සමාලෝචනය	භෞතික විද්‍යාවේදී උපාධිය	30.06.2020

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් සැලසුම් කරන ලද සියළුම භෞතික රැස්වීම් හා වැඩමුළු අවලංගු කිරීමට සිදු විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් වර්ෂ 2020 සඳහා ව්‍යවහාරික විද්‍යා පීඨයේ ක්ෂෙත්‍ර සංචාරයක් සමඟ සිදු කිරීමට නියමිතව තිබූ සමාලෝචන වැඩසටහනද කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අවලංගු කරන ලදි.

ඈ. අනාගත දැක්ම

වර්ෂ 2021 සඳහා ක්‍රියා කාරී සැලැස්ම සහ පුනරාවර්තන වියදම්

අනු අංකය.	ක්‍රියාකාරකම	කාලසීමාව	ප්‍රතිලාභී කණ්ඩායම	වැඩසටහන	ඇස්තමේන්තු ගත මුදල (රු)
1.	''ආයතනික වාර්තාව ලියන ආකාරය'' පිළිබඳ වැඩ මුළුව	සම්පූර්ණ දවස	අධ්‍යන කාර්ය මණ්ඩලය	වැඩමුළු	60,000.00
2.	වෙබ් පාදක ඉගෙනීම, තාක්ෂණය පදනම් කරගත් ඉගෙනීම පිළිබඳ වැඩමුළුව	සම්පූර්ණ දවස	අධ්‍යන කාර්ය මණ්ඩලය	වැඩමුළු	60,000.00
3.	ප්‍රසම්පාදන, ලංසු තැබීම, මිල ගණන් ක්‍රියා පටිපාටි පිළිබඳ වැඩමුළුව	සම්පූර්ණ දවස	පරිපාලන හා අනධ්‍යන කාර්ය මණ්ඩලය	වැඩමුළු	60,000.00
4.	වැඩමුළු/ සම්මන්ත්‍රණ/ IQAU අධ්‍යක්ෂක සහ පීඨ සම්බන්ධීකාරක වරුන් සහභාගි වන සම්මේලන	-	අධ්‍යක්ෂ/ CQA සහ පීඨ සම්බන්ධීකාරක වරුන්	-	100,000.00
5.	රැස්වීම් සඳහා ආහාර/ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය සඳහා වන වියදම්	-		-	60,000.00
එකතුව					340,000.00

30. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය

අ. හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛණ 10/2016 හි ප්‍රතිපාදන අනුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය වර්ෂ 2018 දී, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ආධාර කිරීම සඳහා ලෝක බැංකුව මඟින් ආධාර සපයන ශ්‍රී ලංකා රජය මඟින් මෙහෙයවන "උසස් අධ්‍යාපනයේ ව්‍යාප්තය හා සංවර්ධනය වේගවත් කිරීමේ" ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ස්ථාපිත කරන ලදී. මෙම ඒකකය උපකුලපති මඟින් සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. සෑම පීඨයකටම විධිමත් ප්‍රවේශයක් ඇති පරිදි මෙය මිහින්තලේ විශ්වවිද්‍යාල ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇති මෙම ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම් මහලේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානයට යාබඳව ස්ථාපනය කොට තිබේ. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය අධ්‍යක්ෂක, කළමණාකරු, උපදේශක මණ්ඩලය හා එක් එක් පීඨයේ සහය දක්වන සම්බන්ධීකාරකයින් යටතේ හොඳින් ක්‍රියාත්මක වේ.

වර්තමානයේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරණ ඒකකයේ අධ්‍යක්ෂක මහාචාර්ය ජී.ඒ.එස්.ගිනිගද්දර මහත්මිය වන අතර ඇය යටතේ කළමනාකාරතුමිය (ඊ.එන්.ලියනගේ මිය) සහ අභ්‍යාසලාභීන් ආර්.ආර්.මොහොමඩ් යන අය කොන්ත්‍රාත් පදනම යටතේ මෙම ඒකකය අධ්‍යක්ෂකතුමිය යටතේ කටයුතු කරයි.

පීඨ සහ පීඨ සිසුන් අතර සහයෝගීතාවය හා සන්නිවේදනය සිදුකිරීම සඳහා එක් එක් පීඨ නියෝජිතයන්ගේ පීඨ සම්බන්ධීකරණයන් 6 දෙනෙකු සිටී. මෙම ඒකකයට උපදෙස් දීම සඳහා උපකුලපති, කර්මාන්ත නියෝජිතයින් මෙන්ම පීඨාධිපතිවරුන් සහ විශ්වවිද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය ඇතුළත් උපදේශන මණ්ඩලයක් ඇත.

ආ. ජයග්‍රහණයන්

පීඨයන් දැනුවත් කිරීමේ සැසි.

ව්‍යාපාර සම්බන්ධතා ඒකකය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2020 වර්ෂය පුරා පීඨ මට්ටමෙන් සංවිධානය කර පවත්වන ලද අතර පීඨ කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා වෙනම සැසි පැවැත්විය. එය සාර්ථක සැසි මාලාවක් වූයේ විශ්වවිද්‍යාල ප්‍රජාවට විශ්වවිද්‍යාලය ව්‍යාපාර සම්බන්ධතා ඒකකය පිළිබඳ වඩා පුළුල් අදහසක් ලබා ගත හැකි වූ බැවිනි.

පීඨ 5 ක් (කෘෂිකර්ම, කළමනාකරණ, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර, තාක්ෂණ සහ ව්‍යවහාරික විද්‍යා) සඳහා වෙන වෙනම සැසි 151ක් සහ දැනුවත් කිරීමේ සැසි 5 ක් පැවැත්වුණු අතර ඒ සඳහා සිසුන් 250 ක් සහ අධ්‍යන කාර්ය මණ්ඩලය සහභාගි විය.

ආරම්භක සති අන්තය.

ව්‍යවහාරික විද්‍යාපීඨයේ පැවැත්වෙන පාඨමාලා වන ව්‍යවසායකත්වය (ICT 3208) සහ ව්‍යවසායකත්ව සංවර්ධනය (IDC 3201) පදනම් කරගනිමින් යුරෝපා සංගමයේ විශේෂඥයින් 4 දෙනෙකු ඇතැම් පීඨ විසින් හඳුනාගත් ප්‍රවීණයන් 30 දෙනෙකු සමඟ මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. දින 3 දී මෙම වැඩසටහනට තෝරාගත් සිසුන් 80 දෙනෙකු සහභාගි විය. මෙම උද්යෝගිමත් තරුණ ප්‍රවීණ සිසුන් කණ්ඩායම් වලට බෙදා පැය 54 ක කණ්ඩායම් ක්‍රියාකාරකම් සමඟින් "ආරම්භක සති අන්ත රජරට විශ්වවිද්‍යාල සංචරණය 2020" ලෙස වර්ෂ 2020 මාර්තු මස 6,7, සහ 8 යන දිනයන්හිදි පද්ධති කරන ලදී.

StartupXfoundry සහයෝගිතාවය.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාණිජකරනය කල හැකි පර්යේක්ෂණ ප්‍රථිඵල දේශීය හා ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම සඳහා Startup Foundry සංවිධානය, ව්‍යාපාර සම්බන්ධතා ඒකකය හරහා විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා අත්සන් කරන ලදී.Startup Foundry "යුරෝපා සංගමය - ශ්‍රී ලංකා නවෝත්පාදන හවුල්කාරිත්ව ව්‍යාපෘතිය (EU-SLIP) " වැඩසටහන සමඟ කටයුතු කරනු ලැබේ. UBLC හි ධාරිතාවයන් ගොඩනැගීමේ ක්‍රම සොයා බැලීම සඳහා පළමු අනධ්‍ය වැඩමුළුව විශ්වවිද්‍යාල සම්බන්ධතා ඒකකයේ කාර්ය මණ්ඩලය සඳහා වර්ෂ 2020 නොවැම්බර් මස 6 වන දින ප.ව. 1.00 සිට ප.ව.4.30 දක්වා පවත්වන ලදී. මෙහි අදහස වූයේ ජර්මනියේ, ලිතුවේනියාවේ සහ ඉන්දියාවේ සිදු වූ සාර්ථක ක්‍රියාකාරකම් වලින් ප්‍රබෝධයට හේතු ලබාගනිමින් UBLC/TT0s ආයතන හා වෙනත් ව්‍යාපාර සමඟ සම්බන්ධ විය හැකි ආකාරය අවබෝධ කරගැනීමයි. එසේම, මෙම වැඩසටහන ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය අතර සහයෝගිතා ඇති කිරීම සඳහා UBLC සඳහා පහසුකම් සැලසීම සඳහා දියත් කිරීමට අදහස් කරන විශාල ව්‍යාපෘතියක පුරෝගාමියා විය.

උතුරුමැද පළාත් වාණිජ කර්මාන්ත,සහ කෘෂිකර්ම මණ්ඩලයේ සහයෝගීතාවය.

උතුරුමැද පළාත් වාණිජ, කර්මාන්ත සහ කෘෂිකර්ම මණ්ඩලය සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය අතර කාර්මික සහයෝගීතාවයක් ඇති කරගැනීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීම විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය හරහා කෙටි කාලයකදී සිදු කරන ලදී.

ආරම්භක මාර්ගගත සැසි.

කාර්මික විශේෂඥයින්ට ඔවුන්ට අත්දැකීම් විශ්වවිද්‍යාල සිසුන් සමඟ බෙදා ගැනීමට ආරාධනා කරමින් විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය විසින් සති අන්ත වලදී පැය 2ක මාර්ගගත සැසි සංවිධානය කිරීම වර්ෂ 2020 අවසානයේදී ආරම්භ කරන අතර පීඨ හයේම සිසුන්ගේ ධනාත්මක ප්‍රතිචාරද සමඟ ඉදිරියට ක්‍රියාත්මක වේ. සිසුන්ගේ මෙන්ම පීඨ සම්බන්ධීකාරකවරුන්ගේද උද්යෝගිමත් ප්‍රතිචාරයද මේ සඳහා ලැබේ. වර්ෂ 2020 තුළ සිසුන් ඇතුළු 1000 ක පමණ කාර්මික විශේෂඥයින් හය දෙනෙකු සමඟ සැසි 6 ක් පවත්වන ලදී.

නව නිපැයුම් නවෝත්පාදන සහ වාණිජකරනය සඳහා ප්‍රමුඛ පර්යේෂණ යෝජනා 13ක් එකතු කරන ලදි

පර්යේක්ෂණ යෝජනාවේ මාතෘකාව	PI
ආහාර ගැනිමෙන් පසු රුධිර ග්ලුකෝස් පාලනය කිරීමට ඖෂධීය පාන - වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	එස්. පී. ඒ. එස්. සේනාධීර එච්. ටී. ඩබ්. වීරකෝන්
ස්වාභාවික අමුද්‍රව්‍ය මගින් නිපදවන ලද අවශෝෂකයන් භාවිතයෙන් ජලයෙන් ක්ලෝරයිඩ්, දෘඪතාව සහ TDS ඉවත් කිරීම සඳහා වන වාණිජ ජල පෙරහනය - තාක්ෂණ පීඨය	ජේ. එස්. ජයසුන්දර මහතා
සාරවත් කොම්පෝස්ට්වල නිෂ්පාදන අනුපාතය සහ පෝෂණ අගය මත වාතනයේ බලපෑම - කෘෂිකර්ම පීඨය	ආචාර්ය ඩී. එම්. එස්. එච්. දිස්සානායක
කාර්යක්ෂම සහ විශ්වාසනීය සනීපාරක්ෂක තත්වයන් ප්‍රශස්ත කිරීමට කරාම සඳහා ස්වයංක්‍රීය ප්‍රතපිහිටවිය හැකි යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම - තාක්ෂණ පීඨය	එන්. කුරුකුලසුරිය
එයොරොසෝල බෙදාහැරීමේ පද්ධතිය භාවිතා කරමින් මයික්‍රෝ - ආර් එන් ඒ මඟින් කොවිඩ් 19 සඳහා ප්‍රතිකාර - වෛද්‍ය හා සමාන්තරවිද්‍යා පීඨය	වෛද්‍ය ධන්ජුෂ්ක හේවාබොස්ටිතිරිගේ
වට්ටක්කා පිටි වලින් සෑකසූ පිළිස්සීමට සුදානම් කේක් මිශ්‍රණයේ සංවර්ධනය හා තත්වය ඇගයීම - තාක්ෂණ පීඨය	කේ. එච්. අයි. ගිම්හානි
ගව මූත්‍රා පදනම් කරගත් නයිට්‍රජන් පොහොර - කෘෂිකර්ම පීඨය	ආචාර්ය ඩබ්. සී. පී එගොඩවත්ත
සෝඩියම් ඔක්සියෝ ක්ලෝරයිඩ් - ජලය මත පදනම් වූ සනීපාරක්ෂන උත්පාදනය සඳහා නව ග්‍රැෆින් නැනෝ ලෝහ ඔක්සයිඩ් විද්‍යුත් උත්ප්‍රේරකයක් - ව්‍යවහාරික විද්‍යා පීඨය	මහාචාර්ය අජිත් හේරත්
කොවිඩ් 19 සඳහා ආයුර්වේද මැදිහත්වීම් පිළිබඳ රසායනාගාර සහ සායනික ඇගයීම - තාක්ෂණ පීඨය	ආචාර්ය ආෂා විජේගුණවර්ධන
වෙබ් පාදක වෛද්‍ය සුත්‍රයක් සහ ඉලෙක්ට්‍රොනික බෙහෙත් වට්ටෝරු පද්ධතියක් සංවර්දනය කිරීම - වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	වෛදය ජනිත් චන්ද්‍රකුමාර
ඉවත දමන ප්ලාස්ටික් පාදක සංයෝග භාවිතයෙන් අන්තර් අගුලු දැමීමේ ගඩොල් සංවර්ධනය කිරීම - තාක්ෂණ පීඨය	ආචාර්ය එච්. ඒ. එන්. ධර්මගුණවර්ධන
ඇක්තුරියම් (ඇන්තුරියම් ඇන්ඩ්‍රියානම්) වගාව සඳහා මන්දගාමී පොටෑසියම් නිකුත් කරන කාබනික පෙති සොයා ගැනීම - කෘෂිකර්ම පීඨය	දිල්ෂානි ද සිල්වා
පරිගණක සංඛ්‍යාත්මක පාලනය භාවිතා කරමින් බතික් රෙදි වල රටා ඉටි ගැසීම සඳහා යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම - තාක්ෂණ පීඨය	පුබුදු කුමාරගේ

පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට අයදුම්පත් යොමු කිරීම.

දැනට විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය මඟින් ව්‍යවහාරික විද්‍යා පීඨයේ පේටන්ට් බලපත්‍ර අයදුම්පත් 2 ක් යොමුකර ඇති අතර වාණිජ හවුල්කරුවන් සෙවීමේ ක්‍රියාවලියේ පවතී. ඒවා නම්,

පේටන්ට් බලපතඔයේ මාතෘකාව	කව නිපැයුම් කරුගේ නම	පීඨය
Arduino සහ පාලන ක්‍රමය භාවිතයෙන් උෂ්ණත්වය වෙනස් කල හැකි සහ යකඩ පෑස්සුම් උපාංගය	ඩී. එම්. එච්. එම්. දිසානායක මහතා	ව්‍යවහාරික විද්‍යා පීඨය
ශ්‍රී ලංකාවෙන් සොයා ගන්නා ලද සර්කෝන් වැලි වලින් සර්කෝනියා නිෂ්පාදනයේ පලදායි ක්‍රමයක්	ආචාර්ය බී. ඒ. කරුණාරත්න ඒ. පී. වික්‍රමගෙදර මෙනවිය	ව්‍යවහාරික විද්‍යා පීඨය

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකක කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු.

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකක කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාලය හරහා විවිධ වැඩමුළු පවත්වන ලදී. ඒකකයේ අධ්‍යක්ෂක, කළමණාකරු සහ අභ්‍යාසලාභියා වසර තුළ වරින් වර අනධ්‍ය පුහුණු සැසි 34 කට සහභාගි විය.

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකක පීඨ සම්බන්ධීකාරක රැස්වීම්.

සෑම පීඨයකටම ව්‍යාපාර සම්බන්ධතා ඒකක කටයුතු සිදුකිරීම සඳහා සංවිධානය කරන ලද රැස්වීම් වලට පීඨයේ සම්බන්ධීකාරකවරුන් 06 දෙනෙකු සහභාගි විය. වසර පුරා රැස්වීම් 6 ක් පැවැත්වුණු අතර වසංගත තත්වය සහ ඒවා භෞතිකව මෙන්ම අනර්ථ ලෙස පවත්වන ලදී. සියළුම පීඨ නියෝජනයෙන් සම්බන්ධීකාරකවරුන් හෝ නියෝජිතයින් මේ සඳහා සහභාගි විය.

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ උපදේශක මණ්ඩල රැස්වීම්.

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ උපදේශක මණ්ඩලය විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ කටයුතු පිළිබඳව තීරණ ගැනීම සිදුකරයි. මෙය උපකුලපති, සියළුම පීඨවල පීඨාධිපතිවරුන්, විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ අධ්‍යක්ෂක, මූල්‍යාධිකාරි, පාලක සභාව විසින් නම් කරන ලද සාමාජිකයින් හා කාර්මික විශේෂඥයින්ගේ සමන්විත වේ. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ දෙවන උපදේශක මණ්ඩල රැස්වීම 2020 ජනවාරි මස 4 වන දින වැඩබලන උපකුලපතිවරයාගේ සහ අනෙකුත් සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි. මෙහිදී විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ මහාචාර්ය ජී.ඒ.එස්. ගිනිගද්දර මහත්මිය විසින් විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය පිළිබඳ හැඳින්වීම හා මෙමඟින් ලබාගෙන ඇති ප්‍රගතිය හා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී කාර්මික විශේෂඥයින් විසින් විශ්වවිද්‍යාලය තුළ නවෝත්පාදන සහ ව්‍යවසායක සංස්කෘතිය සංවර්ධනය කිරීමට ඔවුන්ගේ අදහස් සහ නිර්මාණ වලට විසඳුම් සඳහා විශ්වවිද්‍යාලයට සහය විය හැකි ආකාරය පිළිබඳ විකල්ප අදහස් ඉදිරිපත් කිරීමට ඔවුන්ගේ සහයෝගය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල සම්මන්ත්‍රණ තුළ කාර්මික සහභාගිත්වය හා නව්‍ය සංවර්ධන ප්‍රදර්ෂණ පිළිබඳ විශේෂ අවධානයට යොමු වූ මෙම රැස්වීමට 11 දෙනෙකු සහභාගි විය.

එකතු කරන ලද නව නිපැයුම් අනාවරණය කිරීමේ පෝරම ගණන

සේවාදායකයා	නව නිපැයුම් කරුගේ සංඛ්‍යාව	ඉදිරිපත් කල අයි.ඩී.එෆ් සංඛ්‍යාව
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයි නව නිපැයුම් කරුවන්	06	09
පීඨය	**විස්තරය**	**නව නිපැයුම් කරු**
ව්‍යවහාරික විද්‍යා පීඨය	නව නිපැයුම් අනාවරණය ඉදිරිපත් කිරීම - "Arduino"	ඩී. එම්. එච්. එම් . දිසානායක මහතා
කෘෂිකර්ම පීඨය	නව නිපැයුම් අනාවරණය ඉදිරිපත් කිරීම - '' තෙබු බිස්කට්''	කේ. ඒ. ඩී. ඩී. එම් කාරියප්පෙරුම
කෘසිකර්ම පීටය	නව නිපැයුම් අනාවරණය ඉදිරිපත් කිරීම - පැසුනු සහල් නිවුඩ්ඩ භාවිතයෙන් අයිස්ක්‍රීම්	ආචාර්ය ඩී. එම්. එස්. එච්. දිස්සානායක

	- ප්‍රතිබැක්ටීරියා විභවය සහිත කෑම පිසින බීම කිරිමොරු ප්‍රෝටීන් අඩංගු ධාන්‍ය වලින් සැකසූ	
කෘෂිකර්ම පීඨය	නව නිපැයුම් අනාවරණය ඉදිරිපත් කිරීම - දෙඩම් තන්තු එකතු කරන ලද යෝගට් පානය - පැණි කොමඩු සෙට් යෝගට - කරපිංචා යුෂ සහිත චීස් -	ඩබ්. වී. වී. ආර්. වීරසිංහ ඩබ් .ඩී. පී. වේරගම මහාචාර්ය ඒ.එම්.ජේ.බී. අධිකාරි එස්. වී. එච්. ශ්‍රී මාලි මහාචාර්ය ඩබ්. ඒ. ඩී. නයනාන්ජලි
ව්‍යවහාරික විද්‍යා පීඨය	නව නිපැයුම් අනාවරණය ඉදිරිපත් කිරීම ''ශ්‍රී ලංකාවෙන් හමුවෙන් සයිකෝනියා වැලි භාවිතයෙන් සයිකෝනියා නිෂ්පාදනය කිරීමේ කාර්යක්ෂම ක්‍රමයක්''	ආචාර්ය බී. ඒ. කරුණාරත්න සහ ඒ. පී. වික්‍රම ගෙදර මෙනවිය

ආයතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව

වසර තුළදී අවබෝධතා ගිවිසුම් දෙකක් විශ්වවිද්‍යාලයීය නීති නිලධාරිනයගේ ඇගයීමට භාජනය කරන ලදි. StartupXfoundry සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමද මෙම වසරේදි සිදු කෙරිණි.

ඈ. අනාගත දැක්ම

- කාර්මික විශෙෂඥයින් සමඟ ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීම සහ වෙළඳපොළ නව්‍ය අදහස් වෙත ප්‍රවේශ වන ආකාරය පිළිබඳ දැණුම හුවමාරු කර ගැනීමට සැසි සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකා රාජරට විශ්වවිද්‍යාලයේ පවතින නව්‍ය පර්යේක්ෂණ ප්‍රතිඵල කර්මාන්තයන්ට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම හා නව නිපැයුම් වානිජ කරණයට කර්මාන්තයන්ට ආරාධනා කිරීම.
- විද්‍යාගාර පහසුකම් ලබා ගැනීමට කර්මාන්තයන්ට ආරධනා කිරීම සහ කර්මාන්තයන් හි පවතින ගැටළු විසඳීම සඳහා ශාස්ත්‍රීය විශෙෂඥයින්ගේ දැනුම හුවමාරු කර ගැනීම .
- පර්යේක්ෂණ හා සංවර්ධන කටයුතු වල ඇති කාර්මික ගැටළු විසඳීම විශ්වවිදයාලය මඟින් භාර ගැනිම සහ අධ්‍යන කාර්ය මණ්ඩලයේ මග පෙන්වීම යටතේ සිසුන් විසින් ඒවා විසඳීමට කටයුතු කිරීම.
- ජාතික හා ගෝලීය කර්මාන්ත සහයෝගි තා සම්බන්ධතාවයක් ගොඩනැගීම සහ වානිජ කරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකය මුහුණදුන් සීමා කිරීම්

- විහ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකයේ කටයුතු කාල රාමුවක් තුල කරගෙන යාමේදි ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සහයෝගය සහ අවබෝදය ලබා ගැනීමට බලාපොරොත්තු වූවාට වඩා කාලයක් ගතවීම වානිජ කරණය සහ නව නිපැයුම් /නවෝත්පාදන ගොඩනැගීම රජරට විශ්වවිද්‍යාල ප්‍රජාවට නව සංකල්පයක් වු බැවින් සිදුවීම විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකය මුහුණදුන් අභියෝගය වේ.

31. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17(ඈ) වගන්තිය යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධන මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17 (ඈ) වගන්තිය යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

1. වර්තමානයේදී විශ්වවිද්‍යාලයීය සියළුම සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා ප්‍රතිලෝම ඔස්මෝසිස් ක්‍රියාවලිය භාවිතයෙන් පිරිසිදු කරන ලද පානීය ජලය සපයනු ලබන අතර අනාගතයේදී ප්‍රතිලෝම ඔස්මෝසිස් පිරිපහදු යන්ත්‍ර ගණන වැඩිකිරීමෙන් විශ්වවිද්‍යාල ප්‍රජාවට පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ හැකියාවන් වැඩි කිරීමට බලාපොරොත්තුවේ.

2. මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගීතාවයෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය මඟින් කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙන අතර අනාගතයේදී අනෙකුත් පීඨ, නේවාසිකාගාර හා කාර්යාලද මෙම ව්‍යාපෘතියට ඇතුළත් කිරීමට බලාපොරොත්තුවේ.

3. අපජලය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සඳහා රුපියල් මිලියන 200ක වියදමකින් අපජල පවිත්‍ර කරන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.

4. හරිත විශ්වවිද්‍යාල සංකල්පයට අනුව විශ්වවිද්‍යාල පරිසරය මනාව පවත්වා ගැනීම සහ එම කටයුතු සඳහා වැසි ළිං ජලය භාවිතා කිරීම.

5. තිරසාර පරිසරයක් ගොඩනැගීමේ අභිප්‍රායෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය හා කෘෂිකර්ම පීඨය මඟින් හඳුන්වාදෙන ලද රුක්රෝපන වැඩසටහන ඉදිරියටද කරගෙන යෑමට බලාපොරොත්තුවේ.

6. විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන දැරිය හැකි මුදලක් අය කරන සහ ගුණාත්මක තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම සමාන ප්‍රවේශයන් සහතික කිරීම.

7. විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් නොලබන සිසුන් නිපුණතා ඇති, දැනුමැති සහ රැකියා සඳහා සුදුසු උපාධිධාරීන්, ඩිප්ලෝමාධාරීන් සහ සහතිකපත් දරන්නන් බවට පත්කිරීමේ අරමුණින් බාහිර අධ්‍යාපන වැඩසටහන් සඳහා සිසු ප්‍රවේශය ඉහළ නැංවීම.

8. කළමනාකරණ අධ්‍යයන පීඨය හා සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය මඟින් පවත්වනු ලබන පශ්චාත් උපාධි හා පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන් සඳහා බඳවා ගැනීම් ඉහළනැංවීම හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහතික කිරීම.

9. ප්‍රදේශයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන සිසුන්ගේ තත්වය ඉහළ නැංවීමේ අරමුණින් උතුරුමැද පළාත් පාසල් උසස්පෙළ සිසුන් සඳහා ජීව විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ තාක්ෂණය යන විෂයන්ට අදාලව පවත්වනු ලබන වැඩමුළුව වඩාත් හොඳින් ඉදිරියටත් පැවැත්වීම.

10. සියළුම පීඨයන් මඟින් සිදු කරනු ලබන දැනුම බෙදාහැරීමේ වැඩසටහන් ප්‍රමාණයෙන් හා ගුණාත්මක බවෙන් ඉහළ නංවා ක්‍රියාත්මක කිරීම.

32. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(ආ) වගන්ති ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුල්‍ය පනත හා එහි සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශනය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය – මිහින්තලේ
2020 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2020 ශ්‍රී:ලං:රු:	2019 ශ්‍රී:ලං:රු:
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	2	118,835,657	98,710,358
අත්තිකාරම් - සැපයුම් සහ සේවා	3	11,322,935	11,400,311
